# විගණකාධිපතිවරයාගේ ත්‍රෛවාර්ෂික වාර්තාව

## 2021-2023

## පළාත් සභා

# පටුන


| | | | පිටු අංක. |
|---|---|---|---|
| 1. | විධායක සාරාංශය | | 3 |
| 2. | මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය | | 4 |
| 3. | පළාත් සභා සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ | | |
| | 3.1 | නැගෙනහිර පළාත් සභාව | 6 |
| | 3.2 | උතුරු මැද පළාත් සභාව | 20 |
| | 3.3 | වයඹ පළාත් සභාව | 32 |
| | 3.4 | සබරගමුව පළාත් සභාව | 50 |
| | 3.5 | ඌව පළාත් සභාව | 60 |
| | 3.6 | මධ්‍යම පළාත් සභාව | 77 |
| | 3.7 | දකුණු පළාත් සභාව | 104 |
| | 3.8 | බස්නාහිර පළාත් සභාව | 153 |
| | 3.9 | උතුරු පළාත් සභාව | 172 |

## 1. විධායක සාරාංශය

1987 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස් ථා සංශෝධනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 අ (1) ව්‍යවස්ථාව මගින් බස්නාහිර, මධ්‍යම, දකුණ, වයඹ, උතුරුමැද, ඌව, නැගෙනහිර, උතුර, සබරගමුව යන පළාත් සභා 09 ක් පිහිටුවන ලද අතර පළාත් සභාවල පාලනය ආණ්ඩුකාරවරයාගේ යටතේ පවතින අතර පළාත් සභාවල ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙස ප්‍රධාන ලේකම්වරයා කටයුතු කරනු ලබයි. පළාත් සභාවේ ප්‍රධානියා ලෙස ප්‍රධාන අමාත්‍යවරයා කටයුතු කරනු ලබන අතර ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළුව අමාත්‍යවරුන් 05 දෙනෙකුගෙන් පළාත් සභාවක් සමන්විත වේ.

පළාත් සභාවල අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, පළාත් සභා රාජ්‍ය සේවයට අදාළ කාරණා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කාරණා පිළිබඳ විධිවිධාන සැලැස්වීම සඳහා 1987 අංක 42 දරන පළාත් සභා පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කර තිබුණි. එසේම එකී පනතේ 23(1) වගන්තිය ප්‍රකාරව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව ප්‍රකාරව පළාත් සභාවක විගණනය විගණකාධිපති විසින් කළ යුතු වේ.

පළාත් සභාවක ආදායම් වශයෙන් රජයේ ප්‍රදාන, බදු ආදායම හා බදු නොවන ආදායම ඇතුළු විවිධ ප්‍රභවයන්ගෙන් සමන්විත වේ. මුදල් කොමිෂමේ නිර්නායකයන්ට අනුව එක් එක් පළාත් සභාවට මධ්‍යම රජයේ භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා දීම සිදුවේ. ඒවා රජයේ ප්‍රදානවේ. ඒ හැරුනු විට පළාත් සභාව විසින් බදු හා බදු නොවන ආදායම් ලෙස ආදායම් රැස් කර ගැනීමක් සිදු වේ. විශේෂයෙන්ම මුද්දර ආදායම්, වාහන බලපත්‍ර ලබා දීමේ ආදායම් වැනි ආදායම් පළාත් සභා විසින් රැස් කර ගනු ලබන ප්‍රධාන අදායම් ලෙස දැක්විය හැක. පළාත් සභා 09 විසින් 2023 වර්ෂයේදී එකතුව රු.මිලියන 458,566 ක ආදායම් රැස් කර තිබුණි. එම ආදායම තුල බදු , බදු නොවන හා වෙනත් ආදායම් ලෙස එකතුව රු.මිලියන 83,544 ක් වූ අතර රජය විසින් පළාත් සභාවලට ලබා දුන් එකතුව රු.මිලියන 375,022 ක රජයේ ප්‍රදාන වලින් සමන්විත වී තිබුණි. ඒ අනුව පළාත් සභා 09 හි මුළු ආදායමින් 82% ක් රජයෙන් ලබා දුන් ප්‍රදාන වලින් සමන්විත වී තිබූ බැවින් සියළු පළාත් සභා තවදුරටත් භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රදාන මත යැපෙමින් පවතින බව නිරීක්ෂණය වේ.

දැනට පවතින පළාත් සභා 09 හි නිල කාලය අවසන්ව ඇති නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(ඉ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව එම සභා විසිර ගියා සේ සලකනු ලැබ ඇත. ඒ අනුව සභාවක් නොමැතිව සබරගමුව, නැගෙනහිර හා උතුරු මැද පළාත් සභාවන් 2017 වර්ෂයේ සිටද, වයඹ, මධ්‍යම හා උතුරු පළාත් සභාවන් 2018 වර්ෂයේ සිටද, බස්නාහිර ඌව හා දකුණ පළාත් සභාවන් 2019 වර්ෂයේ සිටද 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2(1) (අ) වගන්තියේ විධිවිධාන ප්‍රකාර එක් එක් පළාත් සභාවේ ආණ්ඩුකාරවරු විසින් පවත්වාගෙන එමින් පැවතුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

පළාත් සභා විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම මගින් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. පළාත් සභාවන්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ.

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් හා විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන් සලකාබැලිමෙන් අනතුරුව සිව් ආකාරයක මතයන් ප්‍රකාශයට පත්කරනු ලබයි. ඒවා නම්.

**තත්ත්වාගණනය නොකළ මතය**

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හෝ අනුකූල නොවීම වාර්තා වී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

**තත්ත්වාගණනය කළ මතය**

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන හෝ නොගැලපීම් වාර්තා කර ඇති නමුත් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වලට පැතිරී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

**අහිතකර මතය**

මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර ඇති ප්‍රමාණාත්මක / සාවද්‍ය ප්‍රකාශයන් මූල්‍ය ප්‍රකාශන වලට ව්‍යාප්ත වී ඇති විට, අහිතකර විගණන මතය ප්‍රකාශ කෙරේ.

**මතය ව්‍යාවනය කිරීම**

විෂය පථය සීමා වීම හේතුවෙන් විගණකට විගණන මතය සඳහා ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වීම හා විගණක විසින් මූල්‍ය ප්‍රකාශන වල හෙලි නොවූ සාවද්‍ය ප්‍රකාශ තිබිය හැකි යැයි තීරණය කරන විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

**පළාත් සභා වල මතය පිළිබඳ විස්තර**

2021, 2022 සහ 2023 වසර සඳහා පළාත් සභා 09කට අදාළව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන මතයන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| | 2021 | 2022 | 2023 |
|---|---|---|---|
| තත්ත්වාගණනය නොකල | - | - | - |
| තත්ත්වාගණනය කල | 09 | 09 | 09 |
| අහිතකර | - | - | - |
| වියාවනය | - | - | - |
| මතය තවමත් තීරණය කර නොමැති ගණන | - | - | - |
| මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැති ගණන | - | - | - |

| | නම | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|
| **1.** | නැගෙනහිර පළාත් සභාව | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **2.** | උතුරු මැද පළාත් සභාව | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **3.** | වයඹ පළාත් සභාව | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **4.** | සබරගමුව පළාත් සභාව | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **5.** | ඌව පළාත් සභාව | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **6.** | මධ්‍යම පළාත් සභාව | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **7.** | දකුණු පළාත් සභාව | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **8.** | බස්නාහිර පළාත් සභාව | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |
| **9.** | උතුරු පළාත් සභාව | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ | තත්ත්වාගණනය කළ |

# 3. පළාත් සභා සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

## 3.1 නැගෙනහිර පළාත් සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය (ඌණතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 16,802,063,696 | 853,159,035 | 15,948,904,661 | 2,350,483,323 | තත්ත්වාගණනය කළ |
| **2022** | 18,007,488,752 | 983,776,019 | 17,023,712,733 | 1,074,061,039 | තත්ත්වාගණනය කළ |
| **2023** | 19,880,864,862 | 552,939,246 | 19,327,925,616 | 2,302,688,524 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | සමතුලිත ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන (BRDP) යටතේ පළාත් ප්‍රධාන අමාත්‍යාංශය විසින් එරාවුර්, වීරමුනේ සහ සීතනාවේලිහි ඇඟළුම් කම්හල් **03** ක් රු. මිලියන 191.04 ක පිරිවැයකින් ඉදිකර 2017 වර්ෂයේදී රු.440,000 ක මාසික කුලී පදනමට රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ගිවිසුමක් (PPPA) යටතේ පුද්ගලික සමාගමකට ලබා දී තිබුණි. කෙසේ වෙතත්, වීරමුණේ සහ සීතනාවේලි හි පිහිටි කර්මාන්තශාලා වර්ෂ 04 කට අධික කාලයක් අපේක්ෂිත අරමුණු සඳහා භාවිත කර නොතිබුණු අතර 2017 | 2021 – 1.5.53(b) | ඇඟලුම් කම්හල් ප්‍රයෝජනයට ගැනීමටත් හිඟ කුලී අයකර ගැනීමටත් ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. | නව ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට මූලික කටයුතු සිදු කර ඇතත් රට තුළ ඇති වූ අනපේක්ෂිත තත්ත්වය හේතුවෙන් පුහුණු කටයුතු සඳහා පුහුණුකරුවන්ට උපකරණ ලබාදීමේ ක්‍රියාවලිය අත්හිටුවා ඇත.<br>මේ වසරේ සිට ඇඟලුම් කම්හල ආරම්භ කරන බව පෞද්ගලික සමාගම මා හට දන්වා ඇත. ඒ අනුව, "සීතනවේලි" ඇඟලුම් කම්හල 2022 පෙබරවාරි මස වැඩ ආරම්භ කරන ලද අතර එය කම්කරුවන් 36 දෙනෙකුගෙන් සමන්විත වේ. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සැප්තැම්බර් 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය වෙනුවෙන් අයවිය යුතු රු. මිලියන 20.67 ක හිඟ කුලී අයකර ගැනීමටද අපොහොසත් වී තිබුණි. | | | | |
| (ආ) | 2011 සිට 2013 දක්වා කාලය තුළ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටි මල්වත්ත - සුරුප්පොඩෙයි මාර්ගයේ පාලම් 02 ක් (0+360-2+920) ඉදිකිරීම සම්බන්ධයෙන් උද්ගත වූ ආරවුල් හේතුවෙන් රු. මිලියන 150 ක බේරුම්කරණ ගෙවීමක් පළාත් අරමුදලින් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. මෙම ගෙවීම සිදු කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් විමසා අනුමැතිය ලබාගෙන නොතිබූ අතර නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් මේ සඳහා අනුමැතිය ලබා දී තිබුණි. තවද, විගණනය වෙත ලැබී තිබුණු තොරතුරු අනුව කොන්ත්‍රාත්කරු වෙත රු. මිලියන 11 ක් ගෙවා මෙම ආරවුල් විසඳා ගැනීමට තිබූ අවස්ථාව අහිමි කර තිබීම හේතුවෙන් මෙලෙස රු. මිලියන | 2021 – 1.5.4(b)<br><br>2022 – 1.5.3(e) | විධිමත් පරීක්ෂණයක් පවත්වා මෙම ගනුදෙනුව තුළින් රජයට පාඩුවක් සිදු වී තිබුණේ නම් එය වගකිව යුතු නිළධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මුදල් ගෙවීමට පෙර පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත මහා භාණ්ඩාගාරය විසින් අනුමැතිය ලබා දී ඇති බව මෙයින් තහවුරු වේ.<br><br>විනිශ්චයකරු (Adjudicator) 2014 පෙබරවාරි 12 වැනි දින තම තීරණය ලබා දුන් අතර, එම තීරණය දැනුම් දෙන අවස්ථාවේ ව්‍යාපෘතිය අවසන් වීමට ආසන්නව පැවතුණි. තවද එම තීරණය කොන්ත්‍රාත්කරුට හිතකර තීරණයක් විය.<br><br>එබැවින්, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් පත් කරන ලද එවකට අධීක්ෂණ උපදේශකවරුන්ගේ නිර්දේශය ඇතිව නැගෙනහිර පළාත් | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

150 ක බේරුම්කරණ ගෙවීමක් සිදු කිරීමට සිදුවී තිබුණු බවද නිරීක්ශණය විය. මෙමගින් රජයට රු.මිලියන 139 ක පාඩුවක් සිදුවී තිබුණි. මේ සඳහා මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන ලේකම් ඇමතු 2019 අප්‍රේල් 09 වන දිනැති අංක BD/GPS/321/02/02 ලිපිය මඟින් කරුණු පෙන්වා දී තිබුණේ මෙම බේරුම්කරණ ගෙවීමේ වගකීම අදාළ නිළධාරීන් භාරගනු ලබන්නේ නම් අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගැනීමෙන් පසු භාණ්ඩාගාරයේ පවත්නා මූල්‍ය තත්ත්වයද සැළකිල්ලට ගෙන මෙම ගෙවීම් සම්බන්ධව භාණ්ඩාගාරය සළකා බලනු ලබන බවය. කෙසේ වෙතත් ඉහත පරිදි කටයුතු නොකර මෙම ගෙවීම් සිදුකර තිබුණු බව තවදුරටත් නිරීක්ශණය විය. මීට අමතරව මෙම බේරුම්කරණ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා නීතිඥ ගාස්තු ලෙස රු. මිලියන ,6.6 ක්ද දරා තිබුණි.

සභාව බේරුම්කරණයක් ආරම්භ කරන ලදී.

1995 අංක 11 දරන බේරුම්කරණ පනතේ 6 වැනි වගන්තියට අනුව බේරුම්කරු තෝරා ගැනීම සිදු කරන ලදී.

ලෝක බැංකු ආධාර යටතේ මෙම මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතින අතරතුර බේරුම්කරණ ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර, ලෝක බැංකු ණය කල් ඉකුත් වූ පසු ව්‍යාපෘති අරමුදලින් ගෙවීම් කරන ලදී. තවද පළාත් සභා අරමුදලෙන් නීතිඥයකුට ගෙවීම් කරන ලදී.

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඈ) | නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන වෙනුවෙන් පළාත් සභාවේ ආදායම් ඒකකය විසින්, එකතු කර තිබූ උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු පිළිවෙලින් රු. මිලියන 274.74 ක් සහ රු. මිලියන 4.64 ක් අදාළ පළාත් පාලන ආයතන වෙත ප්‍රේෂණය කළ බවට තහවුරු කරන විස්තර වාර්ෂික කාර්යසාධන වාර්තාවේ හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | 2021 - 1.5.5(a) | මූල්‍ය ප්‍රකාශන පරිශීලකයාට අවබෝධ කර ගැනීම සඳහා ආදායම පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීමට ක්‍රියා කළ යුතුය. | මේ වසරේ සිට පියවර ගනු ලැබේ. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | විවිධ ශ්‍රේණිවලට අදාළ තනතුරු සඳහා අනුමත මුළු සේවක සංඛ්‍යාව 19,418 ක් වුවද, එයින් සියයට 30 ක් හෙවත් සේවක පුරප්පාඩු 5,827 ක් වසර 05 කට වැඩි කාලයක සිට පැවතුණි . එසේ තිබියදී නිළධාරීන් 2,607 ක් විවිධ තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අතිරික්ත ලෙස බඳවාගෙන තිබුණි. | 2021 - 1.5.7(c) | පුරප්පාඩු සම්පූර්ණ කිරීමටත් අතිරික්ත සේවක සංඛ්‍යාව අවශ්‍ය පළාත්වලට මාරු කිරීමටත් කටයුතු කළ යුතුය. | නැගෙනහිර පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - මානව සම්පත් වගකීම වන්නේ මෙම පළාතේ සියලුම ආයතනවල සේවක සංඛ්‍යා තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා පමණි. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | සාම්ප්‍රදායික ආහාර ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සහ උපකරණ සැපයීම සඳහා රුපියල් මිලියන 7.2 ක් වැය කර තිබුණි. | 2021- 1.5.11(d) | සාම්ප්‍රදායික ආහාර ප්‍රවර්ධන මධ්‍යස්ථානය සඳහා මිලදී ගත් ගොඩනැගිල්ල සහ උපකරණ ප්‍රයෝජනයට | "හෙළ බොජුන්" විවෘත කිරීම සඳහා 2020.09.07 දින උපකරණ මිලදී ගෙන ඇතත් අනපේක්ෂිත කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2020 ඔක්තෝබර් 12 වන දින එය නිමකර භාර දී තිබුණද, එම ගොඩනැගිල්ල සහ මිලදී ගත් උපකරණ එම අරමුණු සඳහා භාවිතා කර නොතිබූ අතර 2022 නොවැම්බර් 30 දක්වා අක්‍රීයව පැවතුණි. | | ගැනීමට කටයුතු කළ යුතුය. | එය සාමාන්‍ය තත්ත්වයට පත් වන තෙක් ප්‍රමාද විය. කෙසේ වෙතත්, එය ක්‍රියාත්මක වන විට, මිශ්‍ර බ්ලෙන්ඩරය, තෙත් ඇඹරුම් යන්ත්‍රය සහ ගෑස් කුකර් (කුඩා) සඳහා වන වගකීම් කාලය අවසන් වී තිබුණි. මේ තත්ත්වය අපේ පාලනයෙන් තොරය. | |
| (ඊ) | නැගෙනහිර පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල 17 ක් පවතින අතර එයින් කලාප අධ්‍යාපන කාර්යාල 11 ක ගුරුවරුන් 1,509 ක් පුරප්පාඩු වී තිබියදීත් නැගෙනහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනෙකුත් කලාප අධ්‍යාපන කාර්යාල 06 ක් සඳහා ගුරුවරුන් 664 ක් අතිරික්තව පත් කර තිබුණි. මේ අනුව කින්නියා අධ්‍යාපන කලාපයේ පාසල්වල විෂයයන් 18 ක් සඳහා ගුරුවරුන් 100 ක අතිරික්තයක් පැවතුණි | 2021 – 1.5.14(h) | පළාත තුළ පවතින ගුරු අතිරික්තය හා ඌණතා සමතුලිත කිරීමට කටයුතු කළ යුතුයි. | පිළිතුරු සපයා නොමැත. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) | අධිකාරිය විසින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ සේවකයන් 38 දෙනෙකු වෙනුවෙන් 2018 සැප්තැම්බර් 01 සිට | 2021- 1.5.19(a) (iii)<br><br>2022 – 1.5.4(b) (i) | කම්කරු නීති රීති පිළිපැදීමට කටයුතු කළ යුතුය. | වසර 7 ක් පුරා ගෙවිය යුතු දායක මුදල් සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. ත්‍රිකුණාමලයේ කම්කරු දෙපාර්තමේන්තුව | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 2021 මැයි 31 දක්වා කාලය සඳහා ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය ගෙවා නොතිබීම හේතුවෙන් රු. මිලියන 4.64 ක අධිභාරයක් පනවා තිබුණි. තවද, ඉහත දායක මුදල් හා අධිභාරය අදාළ අරමුදල් වෙත ප්‍රේෂණය කිරීමට අධිකාරිය මේ දක්වා අපොහොසත් වී තිබුණි. | | | විසින් ගෙවිය යුතු මුදල දැනුම් දුන් පසු ගෙවිය යුතු මුදල ගෙවනු ලැබේ. කෙසේ වෙතත්, EPF සහ ETF සඳහා දායක මුදල් 2021 ජුනි මාසයේ සිට ගෙවමින් පවතී. | |
| (ඌ) | නැගෙනහිර පළාත් නිවාස අධිකාරියට සහ සංචාරක කාර්යාංශයට අවශ්‍ය කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබූ අතර, ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාවකින් තොරව නිලධාරීන් 79 ක් බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රුපියල් මිලියන 26.77 ක් ගෙවා තිබුණි. තවද, නැගෙනහිර පළාත් ප්‍රවාහන අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාවට වඩා ද්විතීයික මට්ටමේ නිලධාරීන් 06 දෙනෙකු සහ ප්‍රාථමික මට්ටමේ | 2021 – 1.5.19(a) (iv), (b).(iii), (c) | කාර්යමණ්ඩලය අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුයි. | 2022.02.22 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී නැගෙනහිර පළාත් නිවාස අධිකාරිය සඳහා නව සේවක සංඛ්‍යාව නැවත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට තීරණයක් ගෙන ඇති අතර නැගෙනහිර පළාත් සංචාරක කාර්යාංශයේ සේවක මණ්ඩලයක් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී. නැඟෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ගමනාගමන සේවාවන් වැඩිවීම නිසා කාර්ය මණ්ඩල අවශ්‍යතාද | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිලධාරීන් 35 දෙනෙකු බඳවාගෙන ඇති අතර සමාලෝචිත වර්ෂය තුළ එම නිලධාරීන්ට පුද්ගලික වැටුප් වශයෙන් රුපියල් මිලියන 9.06 ක් ගෙවා තිබුණි. | | | වැඩි වී තිබෙන අතර හිටපු ප්‍රධාන අමාත්‍යාංශ අමාත්‍යවරයාගේ සහ නැගෙනහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ නිර්දේශ මත මෙම තනතුරු සඳහා බඳවා ගන්නා ලදී. | |
| (එ) | නැගෙනහිර පළාතේ විවිධ දෙපාර්තමේන්තු, ලේකම් කාර්යාලයකට හා අමාත්‍යාංශයකට අයත් ඉඩම් 81 ක්, වාහන 98 ක්, යතුරුපැදි 71 ක්, රජයේ නිල නිවාස 97 ක්, කාර්යාල ගොඩනැඟිලි 28 ක්, තානායම් 02 ක් සහ වාරිමාර්ග වැව් 51 ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙනවිත් නොතිබුණු අතර ඉහත නිල නිවාස සහ තානායම් පිහිටි ඉඩම්වල ඔප්පු, මිනින්දෝරු සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 1.5.3(c) | මූල්‍ය නොවන සියළුම වත්කම් ප්‍රමාදයකින් තොරව අගය කිරීම සඳහා කටයුතු කල යුතුය. | කෘෂිකාර්මික වාහන සහ යතුරුපැදි අගය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතින අතර ඒවා ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන එනු ඇත. මේ සඳහා ඉල්ලීම්කර තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇත. අපගේ තොරතුරු අනුව ලැයිස්තුගත නිවාස 10 ක්, පවුල් නිල නිවාස 20 ක්, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල නිල නිවාස 1 ක් සහ පිරිමි සහ ගැහැණු යන දෙඅංශයටම නිවාස 03 ක් ඇතුළුව නිල නිවාස කාණ්ඩය යටතේ සමාන පරිශ්‍ර 34 ක් අපගේ විෂය පථයට අයත් වේ. ඉහත සඳහන් කළ පරිශ්‍ර ලැයිස්තුව අතර ලැයිස්තුගත නිල නිවාස 10 ක් දෙපාර්තමේන්තුව විසින් ඇගයීමට ලක් කර ඇති අතර ඒවා තක්සේරු කිරීමේ වාර්තාව මෙතෙක් | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ලැබී නොමැත. මීට අමතරව ඇගයීම් ක්‍රියාවලියට ඇතුළත් මිනුම් සැලැස්මක් සන්තකයේ තබා ගැනීමට අදාළ ප්‍රාදේශීය ලේකම් වෙත අපි ලිපි යවා ඇත. | |
| (ඒ) | සනීපාරක්ෂක සහ ආරක්ෂක සේවා සඳහා යොදවා ඇති සේවකයන් වෙනුවෙන් රු.57,786,846 ක මුදලක් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායකත්වයක් ලෙස අදාල සේවා සපයන ආයතනය වෙත සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණ ද, මෙම දායක මුදල් අදාල ආයතන වෙත ප්‍රේෂණය කළේද යන්න තහවුරු කිරීම සඳහා කිසිදු සාක්ෂියක් ලබාගෙන නොතිබුණි. තවද ඉහත දායක මුදල් මත ගණනය කරන ලද රු.6,304,937 ක එකතු කළ අගය මත බද්ද එම ආයතනය වෙත අවිධිමත් ලෙස ගෙවා තිබුණද එම අවිධිමත් ගෙවීම් මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 1.5.3(d) | කොන්ත්‍රාත්කරු විසින් සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා ඇති බවට තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කලයුතු අතර සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල මත ගෙවා ඇති එකතු කළ අගය මත බද්ද නැවත අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ඇතිකර ගන්නා ලද ගිවිසුම අනුව ගෙවන ලද මුළු වැටුප් වටිනාකම මත එකතු කළ අගය මත බද්ද ගෙවීම් කර ඇත. කොන්ත්‍රාත්කරු විසින් මෙම මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවා ඇත. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

<table>
<tr><td>(ඔ)</td><td>2018 සිට 2022 වර්ෂය දක්වා ගෙවීම් පැහැර හරින ලද අයගෙන් මුද්දර ගාස්තු අය කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව ඉටු කර නොතිබියදීත් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ඊට අදාල නිලධාරීන්ට දිරි දීමනා ලෙස රු.11,188,360 ක මුදලක් ගෙවා තිබුණි.</td><td>2022 – 1.5.4(d)</td><td>වත්කම් මාරු කරන්නා විසින් මුද්දර ගාස්තු ගෙවන බැවින් ඉලක්කය සපුරා ගත හැක. කෙසේ වෙතත්, දඩ මුදල සහ මුද්දර ගාස්තුවෙන් ලැබිය යුතු ඉතිරිය ආදායම් නිලධාරියා විසින් එකතු කරනු ලැබේ. එබැවින් ආපසු බදු එකතු කිරීම ඉහළ නැංවීම නිර්දේශ කෙරේ.</td><td>කාර්යාලයේ ආදායම් සේවා සේවක සංඛ්‍යාවේ යම් ඌණතා / පුරප්පාඩු තිබුණද රාජකාරිවල යම් දියුණුවක් ඇති අතර මුද්දර ගාස්තු එකතු කිරීම සහ පළාත් පාලන ආයතන වෙත මුදල් ආපසු ලබා දීමේදී කාර්යාලය පහත සඳහන් පරිදි බදු එකතු කිරීමේ ඉලක්ක සපුරා ඇත.
<table>
<tr><th>Year</th><th>Target (Mn)</th><th>Achievement</th></tr>
<tr><td>2019</td><td>360</td><td>469,216,920.35</td></tr>
<tr><td>2020</td><td>337.5</td><td>449,580,571.00</td></tr>
<tr><td>2021</td><td>500</td><td>714,810,468.50</td></tr>
<tr><td>2022</td><td>550</td><td>828,752,253.58</td></tr>
</table>
ඒ අනුව, කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ දිරිගැන්වීම් ලබා ගැනීමට හිමිකම් ඇති අතර, එමගින් අනාගතයේදීද දෙපාර්තමේන්තුවේ ඉලක්ක සපුරා ගැනීම සඳහා සියලුම කාර්ය මණ්ඩලයේ වැඩ කිරීමේ හැකියාව වැඩිදියුණු කරනු ඇත.</td><td>නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.</td></tr>
<tr><td>(ඕ)</td><td>කාබනික කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේදී රු.35,348,600 ක වටිනාකමකට කොළ කපන යන්ත්‍ර 60 ක් මිලදී ගෙන නැගෙනහිර පළාතේ ආයතන 60 කට සපයා තිබුණි. කෙසේ වෙතත්, 2023</td><td>2022 - 1.5.8(b)</td><td>මිලදී ගන්නා ලද වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා අවශ්‍ය කරන අමතර උපකරණ මිලදිගෙන සැපයීමට කටයුතු කලයුතුය.</td><td>පෙර ප්‍රකාශ කල පරිදි පැවති රජයේ කාබනික කෘෂිකාර්මික ප්‍රතිපත්තිය අතහැරීම හේතුවෙන් මෙම යන්ත්‍ර සඳහා ගොවි ප්‍රජාවගෙන් තිබූ ඉල්ලුම අඩු විය. එම නිසා මෙම යන්ත්‍රෝපකරණ සියයට 50 ක් භාවිත</td><td>නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.</td></tr>
</table>

| | | | | | |
|---|---|---|---|---|---|
| | අප්‍රේල් 30 විගණන දිනය දක්වාම එම යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා රෝද හතරේ ට්‍රැක්ටරයක් නොතිබීම හේතුවෙන් යන්ත්‍ර වලින් සියයට 50 ක්ම අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කර නොතිබුණි. | | | කරන ලදී. එවැනි තත්ත්වයක් යටතේ ප්‍රයෝජනයට නොගත් යන්ත්‍රෝපකරණ පළාත් සභාව වෙත නැවත ලබාගෙන එම යන්ත්‍ර වල වටිනාකමින් සියයට 50 ක් නැගෙනහිර පළාත් කෘෂිකාර්මික දෙපාර්තමේන්තුවට ගෙවීමේ හා ඉතිරි සියයට 50 මාසික වාරික ලෙස ගෙවීමේ පදනම යටතේ ගොවින් වෙත ලබාදීමට කටයුතු කරමින් පවතී. | |
| (ක) | පළාතේ සාර්ථකව ක්‍රියාත්මක වන ගොවි ප්‍රජාවන්ට ත්‍යාග පිරිනැමීමේ අරමුණින් පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් රොටවේටර් සහිත අත් ට්‍රැක්ටර් 32 ක් රු.14,816,000 කට මිල දී ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2023 අප්‍රේල් 30 විගණන දිනය දක්වාම සාර්ථක ගොවි ප්‍රජාවන් තෝරා ගැනීමේ කාර්යයන් සිදු කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබූ අතර එම ට්‍රැක්ටර් වසර 01 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | 2022 – 1.5.8(c) | වෙන් කරන ලද අරමුදලින් උපරිම ප්‍රයෝජනය ගැනීමට කටයුතු කල යුතුය. | මෙමගින් ගොවි සංවිධාන දිරිමත් කිරීමට සැලසුම් සකස් කර තිබු නමුත් රෝද දෙකේ ට්‍රැක්ටර් ලැබෙන විට මහා කන්නය අවසන් වෙමින් තිබුණි. ඒ නිසා සැලසුම් කල පරිදි මෙම වැඩ කටයුතු කරගෙන යාමට නොහැකි විය. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ග) | 2022 වර්ෂය තුළ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන යටතේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා රු. මිලියන 30 ක මුදලක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණ ද, එයින් රු.21,934,350 ක් 2023 අප්‍රේල් 17 දින දක්වාම ඉහත කාර්යය සඳහා යොදවා නොතිබුණි. | 2022-1.5.9(a) | මෙම මුදල් නිශ්චිත අරමුණු සඳහා කාලීනව යොදා ගැනීමට කටයුතු කල යුතුය. | මෙම මිලදී ගැනීම සඳහා මිලගණන් කැඳවා මිලදී ගැනීමේ නියෝගයක්ද නිකුත් කරන ලදී. කෙසේවෙතත් covid වසංගතය හා රට තුල තිබූ ඩොලර් හිඟය හේතුවෙන් හා භාණ්ඩ වල මිල විශාල ලෙස වැඩිවීමත් මත අදාල සැපයුම්කරුවන්ට භාණ්ඩ ආනයනය කර සැපයීමට නොහැකි විය. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඝ) | 2018 සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ පළාත් ජෛව වෛද්‍ය ඉංජිනේරු ඒකකයට ලැබී තිබුණු රු.25,461,600 ක් වටිනා වෛද්‍ය උපකරණ 51 ක් අලුත්වැඩියා කටයුතු සඳහා සේවා සපයන්නා වෙත නිකුත් කර තිබුණද, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වාම එම උපකරණ අලුත්වැඩියා කටයුතු අවසන් කර නැවත ලබාගෙන නොතිබුණි. | 2022 – 1.5.11(e) | වත්කම් නිෂ්ක්‍රියව තබා නොගෙන ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. | අමතර කොටස් නොමැතිකම සහ අමතර කොටස්වල අධික මිල හේතුවෙන් මෙම ප්‍රමාදයට හේතු වී ඇත. කොටස් හුවමාරු කර එකක් අලුත්වැඩියා කළ හැකි බැවින් සමහර විට අර්ධ වශයෙන් හානි වූ උපකරණ පැමිණෙන තෙක් උපකරණ තබා ගැනීම සිදු කරනු ලැබේ. දැන් අලුත්වැඩියා කරන ලද සියලුම උපකරණ නැවත රෝහල වෙත ලබා දී ඇත. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඡ) | විගණනයට සපයා ඇති තොරතුරු අනුව රු.40,950,000 ක් වටිනා වාහන 06 ක් සහ නිශ්චිත වටිනාකම් නොමැති වාහන 05 ක් ඇතුළුව වාහන 11 ක් වසර 05 කට වැඩි | 2022-1.5.11(i) | මෙම වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කල යුතුය. | මෙම වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරමින් පවතී. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කාලයක් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ අළුත්වැඩියා කළ හැකි තත්ත්වය යටතේ රඳවා තිබුණි. 2023 අප්‍රේල් 24 වන විගණන දිනය දක්වාම ඒවා අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | | | | |
| (ට) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13කට අදාළ රජයේ ඉඩම්වලින් රු.245,513,346 ක බදු වසර 01 ත් 16 ත් අතර කාලසීමාව තුළ හිඟ මුදල් ලෙස පැවතුණි. කෙසේ වෙතත්, එම හිඟ මුදල් අයකර ගැනීමට 2022 දෙසැම්බර් 31 දින දක්වාම ඉඩම් පරිපාලන දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2022 1.5.13 | හිඟ ශේෂය හැකි ඉක්මනින් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අයකර ගත යුතුය. | රු. මිලියන 245.51 ක ප්‍රමාණයෙන් වසර 1 සිට 3 දක්වා කාලයට අයත් හිඟ මුදල් ප්‍රමාණය වන රු.මිලියන 19.5 ක මුදල වර්තමාන වර්ෂය තුළ අයකරගත හැකි අතර මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට උපදෙස් යවා ඇත. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ දී ගනු ලැබූ තීරණය අනුව වසර 3 සිට 16 දක්වා කාලයට අයත් ඉතිරි හිඟ මුදල් රු.මිලියන 225.9 ට අදාල කල්බදූ අවලංගු කිරීම සඳහා LCG වෙත යවා ඇත. ඉඩම් ආඥාපනතේ අංක 86 (1) ඡේදය අනුව නොගෙවූ බදූ හිඟ මුදල්වලට එරෙහිව නීතිමය පියවර ගැනීම ප්‍රාදේශීය ලේකම්වරයාගේ වගකීම වේ. එසේම | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | අප විසින් බදු හිමියාට ලිපි මගින් දන්වා සිටියේ එම මුදල ගෙවන ලෙසයි. ඒ අනුව 2023.07.18 දින දක්වා රු.7,304,439.60 ක් අයකර ගන්නා ලදී. | |
| (ත) | මෙම පළාතේ සංචාරක ආකර්ශනීය ස්ථාන 48 ක් හඳුනාගෙන තිබුණද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 මාර්තු 18 වැනි දිනැති අංක 1985/73 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV(A) කොටස ප්‍රකාරව ප්‍රධාන කාර්යයන් 10 ක් ඉටු කිරීමට හෝ පසුගිය වසර 05 තුළ තමන්ගේම ආදායමක් උපයා ගැනීමට ක්‍රියා කර නොතිබුණිඑසේ . වුවද2019 වසරේ සිට 2023 දක්වා කාර්යාංශයේ විවිධ කටයුතු සඳහා රු මිලියන.128.40 ක මුදලක් පළාත් අරමුදල් ගිණුමෙන් ගෙවා තිබුණි. | 2023 2(a) | එම ප්‍රධාන කර්තව්‍යයන් ඉටු කිරීමට සහ තමන්ගේම ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ද) | රු.මිලියන 88.06 ක් වටිනා ලොරි 04 ක් සහ යන්ත්‍ර 18 ක් යන්ත්‍ර මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ විවිධකාර්යාලවල වාණිජ කටයුතු සඳහා යොදා නොගෙන වසර 02 සිට 05 දක්වා | 2023 - 1.5.10 | අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | අනාගතයේදී කුලී ගාස්තු වැඩි කරගැනීම සඳහා මෙම වාහන සහ යන්ත්‍ර කුලියට දීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කාලයක් නිශ්ක්‍රීයව තබා තිබුණි. | | | | |
| (න) | පෝෂණ වැඩසටහන, පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදාන වැඩ, පොදු අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති වැඩ සහ UNICEF හි ව්‍යාපෘති කටයුතු සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ලැබුණු රු මිලියන 96.97 මුදල ,2022 වර්ෂයේ හා සමාලෝචිත වසරේදී අපේක්ෂිත ව්‍යාපෘති කටයුතු සඳහා යොදා නොගෙන රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීමට සහ පොදු තැන්පතු ශේෂයන් පියවීමට භාවිතා කර තිබුණි. | 2023 – 1.5.8(e) | අපේක්ෂිත අරමුණ සඳහා අක්මුදල් භාවිතා කළ යුතුය. | අනාගතයේදී මෙවැනි අඩුපාඩු නැවත සිදු නොවීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ප) | 2021 වර්ෂයේදී කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් කාබනික කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා රුපියල් මිලියන17.67 ක ස්ථිතික ෂ්‍රෙඩර් යන්ත්‍ර 30 ක් මිල දී ගෙන තිබූ අතර ෂ්‍රෙඩර් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා රෝද හතරේ ට්‍රැක්ටර් නොමැති වීම හේතුවෙන් අපේක්ෂිත කාර්යය සඳහා භාවිත කර නොතිබුණු අතර වසර 02 ක් පුරා අක්‍රියව පැවතුණි. | 2023 1.5.5 | උපයෝජනය සඳහා නිසි සැලසුමක් / ශක්‍යතා අධ්‍යයනයක් සමඟ අත්පත් කර ගැනීම සිදු කළ යුතුය. | මෙම වත්කම් වෙනත් ආයතන වෙත පැවරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 3.2 උතුරු මැද පළාත් සභාව

| | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | ස්කන්ධය රු. | අතිරික්තය (ඌණතාවය) රු. | මතය |
|---|---|---|---|---|---|
| **2021** | 31,396,165,220 | 1,738,330,135 | 29,657,835,085 | 245,732,609 | තත්ත්වාගණනය කළ |
| **2022** | 31,996,870,784 | 1,000,469,385 | 30,996,401,399 | (135,926,957) | තත්ත්වාගණනය කළ |
| **2023** | 35,864,257,855 | 1,118,216,965 | 34,746,040,890 | 1,737,902,832 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘති ප්‍රතිපාදන මත සිදුකළ ඉදිකිරීම් වෙනුවෙන් මැනුම්පත්, වැඩ අවසාන වාර්තාව හා බිල්පත් ගෙවීම් සාරාංශය ඇතුළු ලියකියවිලිවල මුල් පිටපත් මත එක් අවස්ථාවකදී සහ එකී ලියකියවිලිවල ඡායා පිටපත් මත තවත් අවස්ථාවකදී වශයෙන් උතුරු මැද ප්‍රධාන අමාත්‍යාංශය විසින් ද්විත්ව ගෙවීම් සිදුකර තිබුණි. විගණන නියැදි පරීක්ෂණයේදි අනාවරණය කරගත් පරිදි 2020 පෙබරවාරි 26 දින වනවිට ද්විත්ව ගෙවීම් මඟින් වංචනිකව ලබාගෙන තිබුණු මුදල රු.8,608,290 ක් විය. | 2021 වර්ෂය | සම්පූර්ණ මුදලම අයකර ගැනීම සහ ද්විත්ව ගෙවීම් සිදුකළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගැනීම සිදුකළ යුතු වේ. | ද්විත්ව ගෙවීම් සිදුකළ නිලධාරීන් ස්ථාන මාරු කිරීම, නව නිලධාරීන් සඳහා උපදෙස් ලබාදීම. | සම්පූර්ණයෙන්ම අය කිරීම සිදු කර තිබුණ ද නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මෙම සම්පූර්ණ මුදලම අයකර ගැනීම සහ ද්විත්ව ගෙවීම් සිදුකළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග අවසන්කර නොතිබුණි. | | | | |
| (ආ) | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යොදවා ක්‍රියාත්මක කර තිබුණු ගිවිසුම්ගත මුදල රු.21,946,785 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 02 ක් වෙනුවෙන් රු.9,066,775 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් උතුරු මැද ප්‍රධාන අමාත්‍යාංශය 2016 වර්ෂයේ දී ගෙවා ඇති නමුත් ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර නොතිබුණි. එසේ වුවත් එකී අත්තිකාරම් අයකර ගැනීමට සහ ගිවිසුම් ප්‍රකාරව වැඩ නිමනොකළ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීම සිදුකර නොතිබුණි. | 2021 වර්ෂය | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීමට සහ ගිවිසුම් ප්‍රකාරව වැඩ නිමනොකළ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීම සිදුකළ යුතු වේ. | සුරක්ෂණ සම්බන්ධයෙන් නියමිත පරිදි කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත. | එක් කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් රු.3,193,462 ක් අයවිය යුතු අතර, බැඳුම්කර කල් ඉකුත් වීමට ඉඩ හරින ලද නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ඇ) | උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය උදෙසා තාක්ෂණික ප්‍රමිතියෙන් යුතු වාර්තාමය වීඩියෝ වැඩ සටහනක් සකස් කිරීම, ආකර්ෂණීය පින්තූර සහිත ප්‍රමිතියෙන් යුතු පොතක් නිර්මාණය කිරීම සහ විධිමත් | 2021 වර්ෂය | වීඩියෝ වැඩ සටහන, ආකර්ෂණීය පින්තූර සහිත ප්‍රමිතියෙන් යුතු පොත සහ විධිමත් තොරතුරු සහිත වෙබ් අඩවිය සැපයුම්කරු විසින් සැපයීමට පෙර ගෙවීම් කළ | දැනට මෙම පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති නිසි සැලසුමකින් හා අධීක්ෂණයකින් යුක්තව හා කිසිඳු අක්‍රමිකතාවයක් සිදු නොවන පරිදි ක්‍රියාත්මක කල යුතු | ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදුකළ මූලික විමර්ශන වාර්තාව අනුව අදාළ රාජකාරී පැවරී තිබූ නිලධාරීන් කිහිප දෙනෙකුට චෝදනා පත්‍ර නිකුත් කර |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තොරතුරු සහිත වෙබ් අඩවියක් නිර්මාණය කිරීම වෙනුවෙන් ප්‍රධාන ලේකම් විසින් පෞද්ගලික සැපයුම්කරුවෙකු සමඟ රු.15,797,500 ක මුදලකට 2016 මාර්තු 23 දින ගිවිසුම් ගතවී තිබුණි. ගිවිසුම්ගත මුදලින් රු.12,144,500 ක් 2016 දෙසැම්බර් 26 දින වන විට ගෙවා තිබුණු නමුත් 2021 මැයි 10 දින වන විටද සැපයුම්කරු විසින් මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කර උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය උදෙසා යොදා ගැනීමට හැකිවන ලෙස පළාත් සභාව වෙත භාරදී නොතිබුණි. | | නිලධාරීන්ට එරෙහිව කටයුතු කළයුතු වේ. | බවට පළාත් සභාවේ ප්‍රධාන විගණන කළමනාකරන කමිටු රැස්වීමේදි සියලු නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | විනය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවට නිර්දේශ කර තිබුණි. |
| (ඇ) | 2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු දස අවුරුදු තිරසර ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම වෙනුවෙන් රු.27,606,176 ක මුදලක් වැයකර ඇතත් 2022 ඔක්තෝබර් 17 දින වන විටත් එකී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි. | 2021 වර්ෂය | තිරසර ඒකාබද්ධ සංවර්ධන අරමුණු ඉටුකර ගැනීමට මෙම සැලැස්ම පිළියෙළ කළ යුතු වේ. | දැනට කිසිදු අක්‍රමිකතාවයක් සිදු නොවන පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතු බවට පළාත් සභාවේ ප්‍රධාන විගණන කළමනාකරන කමිටු රැස්වීමේදි සියලු නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | දස අවුරුදු තිරසර ඒකාබද්ධ සංවර්ධන සැලැස්ම පිළියෙල කර අවසන් කර නොමැත. |
| (ඉ) | ඒජන්සියේ වාහන අළුත්වැඩියා අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ | 2021 වර්ෂය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව අමතර කොටස් මිලදී | වාහන අලුත්වැඩියා කටයුතු සහ සේවා අංශය සඳහා අවශ්‍ය අමතර කොටස් සහ | යෝජිත ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුමත කර |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.22,702,451 ක අමතර කොටස් මිලදී ගෙන තිබූ අතර එම අමතර කොටස් මිල දී ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව සිදු කර තිබුණි. | | ගැනීමට කටයුතු කළ යුතුය. | ලිහිසි ද්‍රව්‍ය මිලදී ගැනීමේ නියමිත ප්‍රසම්පාදන ක්‍රියාදාමයන් අනුගමනය කර අදාළ මිලදී ගැනීම් සිදු කිරීමට කටයුතු කර ඇත. | ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඊ) | උතුරු මැද පළාත් පාසල්වලට අනුයුක්තව සිටි විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් 63 දෙනෙකු මාස 02 සිට වසර 32 ක් දක්වා කාල පරාසයක සිට වෙනත් ආයතනවලට මුදාහැර තිබුණු අතර, එම මුදාහල ගුරුභවතුන්ගෙන් 61 දෙනෙකු සඳහා මුදාහල දින සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අදාළ නිලධාරීන් සේවයට වාර්තා කිරීම, පැමිණීම හා පිටවීම, නිවාඩු ආදිය පිළිබඳ තොරතුරු හා මුදාහල ආයතන වලින් ලබාගත් දීමනා පිළිබඳ තොරතුරු තහවුරු කර ගැනීමකින් තොරව කලාප අධ්‍යාපන කාර්යාල විසින් එකී නිලධාරීන්ට අදාලව ගෙවා තිබූ වැටුප් හා දීමනාවල එකතුව රු.257,490,892 ක් විය. | 2021 වර්ෂය | අදාළ ගුරුවරුන් පාසල් වලට අනුයුක්ත කිරීමේදි හා වැටුප් ගෙවීමේදී ප්‍රමාණවත් සනාථ කිරීම් ලබාගත යුතුය. | ගුරු / විදුහල්පති සේවයට වාර්තා නොකළ නිලධාරීන්ට සේවය හැර යාමේ ලිපි නිකුත් කරන ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත උපදෙස් ලබා දෙන ලදි. | නැවත සේවයට වාර්තා කළ බවට හෝ සේවය හැර යාමේ ලිපි නිකුත් කළ බවට සාක්ෂි නොතිබුණි. |
| (උ) | නිලධරයෙකුගේ පරිවාස කාලය අවසන්වීමේදී ඔහු | 2022 වර්ෂය | අදාල ගුරුභවතුන් කඩිනමින් ස්ථිර කිරීමට කටයුතු | අදාළ ගුරුභවතුන් කඩිනමින් ස්ථිර කිරීමට අවශ්‍ය කටයුතු | ගුරු සේවයට පත්වීම් ලැබූ ගුරු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සේවයෙහි ස්ථිර කිරීමට හෝ ඔහුගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පරිවාස පත්වීම් අවසන් කිරීමට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා වග බලා ගත යුතු වුවත්, උතුරු මැද පළාත තුළ පිහිටි පාසැල් වල 1989 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේ ගුරු සේවයට පත්වීම් ලැබූ ගුරුභවතුන් 313 දෙනකු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | කළ යුතුය. | සිදු කිරීම සඳහා නිලධාරීන් පිරිසක් කලාප කාර්යාලය වෙත ගොස් ගැටලු සහිත ලිපි ගොනු නිරවුල් කිරීමට සුදුසු පියවර ලබා ගන්නා ලද අතර, ස්ථිර කිරීමේ කටයුතු කාර්යක්ෂම කරන ලදී. | හවතුන්ගෙන් ව්‍යාජ සහතික ඉදිරිපත් කළ 26 ක් අවම සුදුසුකම් නොතිබුණු 14 ක් සහ අනෙකුත් විවිධ හේතුන් මත 23 ක් ලෙස ගුරු භවතුන් 63 කගේ සේවය අවසන් නොකර තව දුරටත් ගුරු සේවයේ තබාගෙන තිබුණි. |
| (ඌ) | පොළොන්නරුව පොදු වෙළඳ සංකීර්ණයේ ඉතිරි වැඩ නිම කිරීමේ ව්‍යාපෘතිය 2019 ඔක්තෝබර් 15 දින අවසන් කර භාර දී තිබූ අතර, එම ඉදිකිරීම්වල පැවති අඩුපාඩු නොසලකා රු.16,745,178 ක අවසන් බිල්පත් ගෙවා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 ඡේදය ප්‍රකාරව කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රඳවාගෙන තිබූ රු.6,655,599 ක රැඳවුම් මුදල්, වාණිජ බැංකු ඇපකරයක් මත නිදහස්කර තිබූ නමුත් ව්‍යාපෘතියේ පැවති අඩුපාඩු අතරැඳවුම් කාලය තුළද නිවැරදි කර නොතිබුණු අතර, | 2023 වර්ෂය | ඉදිකිරීම්වල පැවති අඩුපාඩු කඩිනමින් නිවැරදි කර දීමට කටයුතු කළ යුතු අතර, රැඳවුම් මුදල් සඳහා ලබාගත් බැඳුම්කරයේ කාලය ඉකුත් වීමට ඉඩ හරින ලද නිලධාරීන්ගෙන් එම මුදල අය කළ යුතුයි. | වර්තමානයේ මෙවැනි නිරීක්ෂණ අවම කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේදී උපදෙස් ලබා දේ. | අත්තිකාරම් සුරක්ෂණය කල් ඉකුත්වීම සම්බන්ධ නිලධාරී වගකිව යුතුද යන්න පරීක්ෂා කිරීම සඳහා මූලික විමර්ශණ කමිටුවක් පත් කර ඇත. අදාළ ගොඩනැගිල්ල පොළොන්නරුව මහ නගර සභාවට විධිමත්ව පවරා දීම සඳහා පංච පුද්ගල කමිටුවක් පත් කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අදාළ බැංකු ඇපකරයේ කාලයද ඉකුත්වීම හේතුවෙන් එම මුදලින් අඩුපාඩු නිවැරදිකර ගැනීමටද අපොහොසත් වී තිබුණි. | | | | |
| (එ) | හබරණ සංචාරක තොරතුරු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.598,013,000 ක මුදලකට ගිවිසුම් ගත වූ සමාගම ව්‍යාපෘතිය අඩක් නිමකර රු.369,171,165 ක ගෙවීම් ලබාගෙන ව්‍යාපෘතිය නවතා දමා තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.119,602,600 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබාදී තිබුණි. ව්‍යාපෘතිය ඉදිකිරීම නවතා වසර 06 ක් ඉක්මවා ගතවී ඇතත්, ලබාදුන් අත්තිකාරම් මුදලින් තවදුරටත් අයකරගත යුතුව පැවති රු.45,171,484 ක් විය. අත්තිකාරම් සඳහා ලබාගත් අත්තිකාරම් සුරක්ෂණ බැඳුම්කරය කල් ඉකුත් වී තිබුණි. ව්‍යාපෘතිය සම්පූර්ණ කර භාවිතයට ගැනීමට හැකි තත්ත්වයට පත්කිරීමට අපොහොසත් වීම හේතුවෙන් මේ දක්වා දැරූ රු.369,171,165 ක මුදල නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි. කොන්ත්‍රාත්කරු | 2023 වර්ෂය | ලබාදුන් අතිරික්ත මුදලින් තවදුරටත් අයවිය යුතු මුදල් අයකර ගැනීම සහ ඵලදායි ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. | වර්තමානයේ මෙවැනි නිරීක්ෂණ අවම කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේදී උපදෙස් ලබා දේ. | නවතා ඇති මෙම ව්‍යාපෘතියේ ඉදිරි වැඩ නිම කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම පමණක් සිදු කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඉදිරිපත් කරන ලද 12 වන අතුරු බිල්පතින් වැඩබිමේ ඇති ඉදිකිරීම් ද්‍රව්‍ය වෙනුවෙන් රු.11,611,385 ක් ගෙවා තිබූ නමුත්, 2023 දෙසැම්බර් 15 දිනවන විට එවැනි වටිනාකමට අදාළ ද්‍රව්‍ය වැඩබිම තුළ නොතිබුණි. | | | | |
| (ඒ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් රෝද පුටු මිලදී ගැනීම සඳහා සිදුකරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සුදුසුකම්ලත් අවම මිල සහිත ලංසුකරු ඉදිරිපත් කර තිබූ ලංසු ලියකියවිලිවල පිරිවිතර ඇතුළත් ලේඛන ප්‍රසම්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වූ යම් පාර්ශවයක් විසින් ඉවත්කර එම ලංසුකරු, ලංසු ඇගයීමේ ක්‍රියාවලියෙන් ඉවත් කර ඊට වඩා රු.256,100 ක වැඩි මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුට ටෙන්ඩරය පිරිනමා තිබුණි. | 2023 වර්ෂය | ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිදුවූ අක්‍රමිකතා හඳුනාගැනීම සඳහා විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතුයි. | වර්තමානයේ මෙවැනි නිරීක්ෂණ අවම කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේදී උපදෙස් ලබා දේ. | මේ පිළිබඳ සොයා බැලීමට අනුරාධපුර මහ නගර සභාවේ ගණකාධිකාරී ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් 2024 සැප්තැම්බර් 01 දින පත් කර ඇත. |
| (ඔ) | 2017 වර්ෂය තුළදී පලුගස්දමන මහා විද්‍යාලය සඳහා ශ්‍රවනාගාරයක් ඉදිකිරීම වෙනුවෙන් ගිවිසුම්ගත වටිනාකම රු.542,019,300 ක් වූ මුදලකට ඉදිකිරීම් | 2023 වර්ෂය | ප්‍රතිපාදන නොමැතිව ගිවිසුම්ගත වූ නිලධාරීන්ට එරෙහිව කටයුතු කළ යතු අතර හිඟ අත්තිකාරම් මුදල් අයකර ගැනීමට | වර්ථමානයේ මෙවැනි නිරීක්ෂණ අවම කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේදී උපදෙස් ලබා දේ. | මූලික විමර්ශන කමිටුවක් පත් කිරීමට තීරණය කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සමාගමක් සමඟ ගිවිසුම් ගත වී රු.100,000,000 ක් අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කරුට ලබාදී තිබූ නමුත් ආරම්භක අවස්ථාවේදීම ඉදිකිරීම් නවතා ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත්කළ රු.100,000,000 ක අත්තිකාරම් සුරක්ෂණය කල් ඉකුත්වී ඇති අතර ලබාදුන් අත්තිකාරම් මුදල ආපසු අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. | | කටයුතු කළ යුතුයි. | | |
| (ඕ) | උතුරු මැද පළාත තුළ පාසැල් 258 කට ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් අනුයුක්ත නොකර ගුරු සේවයට අයත් ගුරුවරුන්ට විදුහල්පති තනතුරේ රාජකාරි ඉටු කිරීමට වැඩ බලන තනතුරු ලබා දී තිබුණු නමුත්, පාසල් 397 ක ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් නියෝජ්‍ය විදුහල්පති තනතුරේ රාජකාරි ඉටු කරන බව නිරීක්ෂණය විය. | 2023 වර්ෂය | විදුහල්පති සේවය සමත් ගුරුභවතුන් සඳහා විදුහල්පති තනතුරු ලබාදිය යුතුය | විදුහල්පති සේවයට නවක බඳවා ගැනීම් සිදු කරන ලදි. | අතිරික්ත විදුහල්පතිවරු, දීර්ඝ කාලයක් තිස්සේ වැඩ බලන විදුහල්පතිවරු සිටින පාසල් හැර, අනෙකුත් පාසල් සඳහා පත් කිරීමට ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |
| (ක) | සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ප්‍රතිපාදනවලින් ක්‍රියාත්මක කරන ලද කමත් ඉදිකිරීමේ උප | 2023 වර්ෂය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුයි. | වර්ථමානයේ මෙවැනි නිරීක්ෂණ අවම කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේදී උපදෙස් | කමත් ඉදි කිරීමේ උප ව්‍යාපෘති දෙකකින් අයවිය යුතු මුදල |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ව්‍යාපෘති යටතේ වටිනාකම රු.16,731,899 කට ගිවිසුම් ගතවූ කොන්ත්‍රාත්කරුවන් අදාළ කාර්යය ඉටු කිරීම පැහැර හැර තිබූ අතර කොන්ත්‍රාකරුවන් 03 දෙනෙකු වෙනුවෙන් ගෙවා තිබූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් 03 ක එකතු වටිනාකම රු.3,575,068 ක් ආපසු අයකරගත නොහැකිවී තිබුණි. එම කොන්ත්‍රාත් වෙනුවෙන් ලබාගත් රු.3,575,068ක අත්තිකාරම් බැඳුම්කර සහ රු.462,281ක කාර්යසාධන බැඳුම්කර කාලය ඉකුත් වීමට පෙර මුදල් කරගෙන ප්‍රසම්පාදන අස්ථිත්වයට සිදුවූ පාඩුව පියවාගෙන නොතිබුණි. | | | ලබා දේ. | රු.1,268,976 ක් වූ අතර, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් බැඳුම්කර සහ කාර්යය සාධන අත්තිකාරම් බැඳුම්කර කල් ඉකුත්වීමට පෙර මුදල් කර නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ග) | පූර්ව වකුගඩු රෝග පරීක්ෂාවන්ට අදාළ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විශේෂ දත්ත සැකසුම් මෘදුකාංග (LIS) පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා එකතු වූ වටිනාකම රු.3,000,000 ක් වූ Laptop පරිගණක 12 ක්, මුද්‍රණ යන්ත්‍ර 12 ක් සහ ඊට අදාළ උපාංග සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල 12 ක් වෙත ලබා දී වසර 05 කට ආසන්න | 2023 වර්ෂය | දත්ත සැකසුම් පද්ධතිය ස්ථාපිත කර සේවා කාර්යක්ෂම කිරීමට කටයුතු කළ යුතුයි | වර්ථමානයේ මෙවැනි නිරීක්ෂණ අවම කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටුවේදී උපදෙස් ලබා දේ. | සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල 03 ක පමණක් දත්ත සැකසුම් පද්ධතිය ක්‍රියාත්මක කර තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කාලයක් ගත වී ඇතත්, එම දත්ත සැකසුම් පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. | | | | |
| (ච) | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා බල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගමෙන් ලැබුණු වටිනාකම රු.26,065,432 ක් වූ ත්‍රිපෝෂවලින් වටිනාකම රු.1,094,657 ක් වූ ත්‍රිපෝෂ පැකට් 30 බැගින් අඩංගු මළු 77 ක් අස්ථානගත වී තිබූ අතර, රු.23,497,597 ක් වූ ත්‍රිපෝෂ පැකට් 30 ක් අඩංගු මළු 1750 ක් අනුරාධපුර දුම්රියපලේ දුම්රිය ගැල්තුළ (Wagon) මාස 02 කට වැඩි කාලයක් නිදහස් කර ගැනීමකින් තොරව රඳවා තැබීමට ඉඩ හැර තිබුණි. දුම්රිය මැදිරි තුළ ත්‍රිපෝෂ පැවති කාලය තුළ පැවති සෙල්සියස් අංශක 45 ක උෂ්ණත්වය තුළ ත්‍රිපෝෂවල ගුණාත්මකභාවය අඩුවීමේ අවධානමක් පැවතුණි. වටිනාකම රු.26,065,432 ක් වූ ත්‍රිපෝෂ තොගය ප්‍රතිලාභීන් වෙත ලැබෙන විට කල් ඉකුත්වීමට ආසන්නව | 2023 වර්ෂය | සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශයන් අනුව කටයුතු කළ යුතුයි | විෂය භාර නිලධාරීන් ස්ථාන මාරු කර ත්‍රිපෝෂ බෙදා හැරීමේ අධීක්ෂණ කටයුතු සෘජුවම ගණකාධිකාරී වෙත පවරා ඇත. | විධිමත් පරීක්ෂණයක් මගින් සිදු වූ අලාභය හඳුනාගෙන වාර්තා කර නොතිබුණු අතර, ගෙවිය යුතු ප්‍රමාද ගාස්තු සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පැවතුණි. මෙම ත්‍රිපෝෂ තොග නියමිත කාලය තුළ දුම්රිය ගැල්වලින් ඉවත් කර නොගැනීම නිසා ප්‍රමාද ගාස්තු ලෙස රු.1,080,000 ක මුදලක් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදු වී තිබූ බව නිරීක්ෂණය විය. | | | | |
| (ජ) | රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන සඳහා රු. මිලියන 43 ක් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් උතුරු මැද පළාත් සමූපකාර දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබූ අතර එම මුදලින් සී/ස අනුරාධපුර දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතිය වෙත 2021 වර්ෂයේදී ලබාදී තිබුණු රු. මිලියන 33 ක ණය මුදලින් 2024 පෙබරවාරි 26 දින වන විට රු.මිලියන 27.65 ක් ආපසු අයකරගෙන නොතිබුණි. එම සමිතියෙන් අයවිය යුතු ණය මුදල් අයනොවීම හේතුවෙන් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ණය ලබාදීමේ කටයුතු නවතා ඉතිරි මුදල් රු.මිලියන 15.35 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබීම හේතුවෙන් උක්ත වැඩසටහනේ අරමුණ වූ | 2023 වර්ෂය | චක්‍රීය ණය වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කළ යුතුයි. | ණය නිකුත් කිරීම අත්හිටුවා ඇත. | නිකුත් කළ ණය මුදලින් රු. මිලියන 27.65 ක මුදල තව දුරටත් අය වී නොමැති අතර, ඉතිරි මුදලින් රු. මිලියන 10.35 ක් 2024 සැප්තැම්බර් 30 දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ පවති. |

විවෘත වෙළඳපොල තුළ සහල් හිඟයක් ඇතිවීම වැළැක්වීම සහ සහල් මිල පාලනය'' යන අරමුණු ඉටු වී නොතිබුණි.

### 3.3 වයඹ පළාත් සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය (ඌණතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 87,868,899,536 | 1,112,223,415 | 86,756,676,121 | 3,371,051,580 | තත්ත්වාගණනය කළ |
| **2022** | 96,692,986,297 | 963,657,130 | 95,729,329,166 | 2,644,962,777 | තත්ත්වාගණනය කළ |
| **2023** | 106,379,572,843 | 984,335,452 | 105,395,237,390 | 3,226,929,640 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ආණ්ඩුකාරවර කාර්යාලය සතුව පැවති රු.13,790,000ක් දරන මර්සිඩීස් බෙන්ස් කාර් රථය 2013 වර්ෂයේ වයඹ ප්‍රධාන ලේකම් වෙත භාර දී තිබුණ ද, අයිතිය විධිමත්ව පවරා දී නොතිබුණු අතර, එම වාහනය පළාත් සභා භූමියේ නිශ්කාර්යව අනාරක්ෂිතව ගාල් කර තිබුණි. | 2023 | වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පවත්වා නොගැනීමට කටයුතු කළ යුතුය. | මර්සිඩීස් බෙන්ස් කාර් රථයේ මුල් හිමිකාරීත්වය ආණ්ඩුකාරවර කාර්යාලය සතු වුවද, 2013 ජනවාරි 04 දින ප්‍රධාන ලේකම් කාර්යාලයට භාර දී ඇති බව දන්වා ඇත. | මෙය අපහරණය කිරීම සඳහා සූදානම් කර ඇත |
| (ආ) | හිටපු ආණ්ඩුකාරවරයකු විසින් භාවිතා කරන ලද මෝටර් රථය 2020 ජූලි 01 දින අනතුරකට පත්වී තිබුණු අතර, එම මොටර් රථය අළුත්වැඩියා කිරීම සඳහා රු.5,286,460 ක් පළාත් සභාව විසින් දරා තිබුණද, රක්ෂණ ආයතනයෙන් ලැබී තිබුණේ රු.3,865,731 | 2023, 2022, 2021 | පාඩු හා හානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | එම මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් රියදුරු මහතාට විරුද්ධව කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇති බවත්, නැවත නඩුව 2024 නොවැම්බර් 27 දිනට කැඳවීමට නියමිතව ඇති බවත්. එම නඩුවේ තීරණය අනුව ඉදිරි කටයුතු කරන බවත් දන්වා ඇත. | එම මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් රියදුරු මහතාට විරුද්ධව කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇත. ඉදිරි නඩු දිනය 2024 නොවැම්බර් 27 දිනට නියමිතව ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ක් පමණක් බැවින් ඉතිරි මුදල් වූ රු.1,420,729 ක් රියදුරාගෙන් අය කිරීමට තීරණය කර තිබුණද, විගණිත දිනය වූ 2024 මාර්තු 06 දින වන විටත් එම මුදල් අය කරගෙන නොතිබුණි. | | | | |
| (ඇ) | වයඹ පළාත් සභා ලේකම් කාර්යාලයේ ප්‍රයෝජනයට ලබා දී තිබුණු වාහනයක් විධිමත් අනුමැතියකින් තොරව පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිනිය වෙත ලබා දී තිබියදී 2002 ඔක්තෝබර් 11 වන දින එම රථය අනාරක්ෂිතව ගාල් කර තිබිය දී සම්පූර්ණයෙන්ම ගිනිගෙන විනාශයට පත් වීමෙන් සිදු වූ අලාභය 2024 ජනවාරි 19 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 | නඩු තීන්දුවේ පිටපතක් ලබාගෙන අලාභය අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | මේ වන තෙක් එම නඩු තීන්දුවේ පිටපතක් හෝ පවතින වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු ලැබී නොමැත. | වර්තමානය වන විටද නඩු තීන්දුවේ පිටපතක් ලබාගෙන නොමැති අතර සිදු වූ අලාභය අයකරගෙන නැත. |
| (ඇ) | ජනකලා කේන්ද්‍රයේ ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.209,673,158 ක් වැයකර තිබුණු නමුදු, 2023 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිය අතරමඟ නතර කර දමා තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා | 2023, 2022, 2021 | මුදල් ආර්ථිකව කාර්යක්ෂමව සහ ඵලදායීව භාවිතා කළ යුතුය. | නිරීක්ෂණ පිළිගෙන ඇත. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය (PPP) මඟින් යෝජිත, ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇති බවත්, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බවත් | වර්තමාන තත්ත්වයේ වෙනසක් සිදුව නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යයනයන් නිවැරදිව සිදු නොකිරීම තුළින් මෙම තත්ත්වය ඇති වී තිබුණි. | | | විගණනයට දක්වා තිබුණි. | |
| (ඉ) | **වයඹ පළාත් සභාව සහ කුරුණෑගල මහා නගර සභාව ඒකාබද්ධව ඉදිකරනු ලබන සය මහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය** | | | | |
| (i) | උක්ත ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි අංක 15(1) හා 15(2) (a) (b) වල සඳහන් හේතූන් මත කොන්ත්‍රාත්තුව අවලංගු කළ හැකි බව නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත 2022 ඔක්තෝබර් 05 දින කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ (Termination) නිවේදනය නිකුත් කර තිබුණි අතර, 2022 ඔක්තෝබර් 06 දින බැංකු සුරක්ෂණය නිදහස් කරන ලෙස වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් බැංකු වෙත දන්වා තිබුණි. 2022 ඔක්තෝබර් 14 කොන්ත්‍රාත්කරු විසින් බැඳුම්කර මුදල් නිදහස් කිරීම අත්හිටුවමින් උසාවි නියෝගයක් ලබාගෙන තිබුණු මුත්, එය කොළඹ දිසා අධිකරණය විසින් 2023 මැයි 31 දින නිෂ්ප්‍රභා කර තිබුණි. ඒ අනුව, වයඹ පළාත් | 2023 | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කොන්ත්‍රාත්කරු විසින් 2022 ඔක්තෝබර් 14 දින කොළඹ දිසා අධිකරණයේ සෘජුව නඩු පවරා ඇති අතර, 2023 මැයි 31 දින එම නඩුවේ තීන්දුව ප්‍රකාශ කරමින් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කර ඇත. එදිනම ප්‍රධාන අමාත්‍යාංශය විසින් බැංකුවට අදාළ බැඳුම්කර මුදල් කර දෙන ලෙස ලිපි ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත. | අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වූ පසු ගිවිසුමේ කොන්දේසි අනුව කටයුතු කරන බව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් නමට වූ එකතුව රු.260,618,293 ක් වටිනා බැඳුම්කර 03 ක් නිදහස් කර ගැනීමට අදාළ අවස්ථාවන් වලදී වගකිව යුතු පාර්ශව කටයුතු කර නොතිබුණි. | | | | |
| (ii) | උක්ත ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරු වෙත 2020 දෙසැම්බර් 24 දිනට ලබාදී තිබුණු අත්තිකාරම් මුදල වූ රු.185,124,755 ක මුදලින් ගෙවන ලද අටවන (08) බිල්පතෙහිදී රු.24,237,977 ක මුදලක් පමණක් අයකර තිබුණි. ඒ අනුව ගිවිසුම්ගත වූ දින සිට විගණිත දිනය වූ 2023 නොවැම්බර් 28 දින දක්වා කොන්ත්‍රාත්කරුගෙන් අය නොකර සිටින අත්තිකාරම් මුදල රු.160,886,778 ක් විය. | 2023 | ගෙවන ලද අත්තිකාරම් මුදල අයකරගැනීමට කටයුතු කළ යුතුය. | කොන්ත්‍රාත්තුවක අත්තිකාරම් අය කිරීමේ ක්‍රමවේදය කොන්ත්‍රාත් කොන්දේසි 14.2හි පැහැදිලිව දක්වා ඇති බවද, ඒ අනුව කටයුතු කර ඇති බවද, කොන්ත්‍රාත්තුව අවසන් කිරීමෙන් පසු හිඟ අත්තිකාරම් මුදල් අයකර ගැනිමේ දැනුම් දීම නියමිත බැංකුවලට දැනුම් දී ඇති බවද, කොන්ත්‍රාත්කරු විසින් අතුරු වාරණ නියෝගයක් කොළඹ දිසා අධිකරණයෙන් ලබාගෙන එම අත්තිකාරම් හා කාර්යසාධන ඇපකරයන් අයකර ගැනිම තාවකාලිකව අත්හිටුවා ඇති බවද එම ක්‍රියාවලිය අවසන් වූ වහාම එම අය කිරිම් නිර්ණය කර අවසන් ගෙවීම් සහතිකයක් මඟින් සේවායාගේ සියළු හිමිකම් ලබා ගැනිමට කටයුතු | අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වී නොමැති බැවින් අයකරගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | කරන බවද දන්වා ඇත. නමුත් මෙම අත්තිකාරම් මුදල් ගෙවීමෙන් අනතුරුව පළාත් සභා වෙත පියවා ගැනිම කොන්ත්‍රාත්තු අවසන් කිරිමකින් තොරව සිදුකල නොහැකි බව සඳහන් කර ඇත. | |
| (ඊ) | 1996 වර්ෂයේ සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ වයඹ පළාතේ පළාත් පාලන ආයතනවල කටයුතු සම්බන්ධයෙන් විගණකාධිපති විසින් නිකුත් කර තිබුණු එකතුව රු.3,325,756 ක් වූ අධිභාර සහතික 07 ක් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග වගකිව යුතු පාර්ශවයන් විසින් ගෙන නොතිබුණි. | 2023, 2022, 2021 | අධිභාර අයකර ගැනීම සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය | පළාත් පාලන ආයතන 03 ට අදාළ මෙම අධිභාර සහතික 07 සම්බන්ධයෙන් ලබා දී ඇති තීරණ අනුව අය කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන බව දන්වා ඇත. | තවමත් අයකරගෙන නොමැත. |
| (උ) | 2023 වර්ෂයේ වයඹ පළාත් තුල ප්‍රතිලාභීන් සඳහා සූර්යබල විදුලිකෝෂ කට්ටල සැපයීම හා ස්ථාපනය කිරීම වෙනුවෙන් ගිවිසුම්ගත වූ රු.8,750,186 ක වටිනාකමැති ගිවිසුම ප්‍රකාරව 2023 දෙසැම්බර් 11 දින වැඩ නිමකල යුතු වුවත් එදින සිට සිව් වතාවක් සිදුකරන ලද දින දීර්ඝ කිරීම් වලට අනුව 2024 මාර්තු 31 දින තෙක් | 2023 | අනවශ්‍යා ආකාරයෙන් දින දීර්ඝ කිරීම් සිදුනොකර කඩිනමින් ව්‍යාපෘතිය නිම කිරීමට අවශ්‍යා ක්‍රියාමාර්ග ගත යුතුය. | ව්‍යාපෘතියේ සූර්යබල උපාංග ස්ථාපනය රටේ පවතින ආනයන සීමාවන් නිසා ප්‍රමාද වූ අතර විදුලි උපාංග මෙරටට ගෙන්වා ස්ථාපනය කිරීමේදී අධීක්ෂණ කටයුතු ප්‍රමාද දෝෂයකින් ප්‍රාදේශීය ඉංජිනේරු - පුත්තලම වෙත පවරන ලද අතර පසුව එම සූර්යබල විදුලි යෝජනා ක්‍රියාත්මක කිරීමට නියමිත අදාල ප්‍රාදේශීය ඉංජිනේරු | ව්‍යාපෘතියේ කටයුතු නිම වී නොමැති අතර ව්‍යාපෘති ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරීමේදී සිදුකළ නිරීක්ෂණ අනුව ස්ථාපනය කරන ලද පැනල වලට වඩා ඉහළ වෝල්ටීයතාවය කින් යුතු පැනල සවි කිරීමට කටයුතු කරමින් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දින දීර්ඝ කර පැවති නමුත් විගණිත දිනය වන 2024 අප්‍රේල් 02 දින වන විටත් මෙම ව්‍යාපෘතිය අවසන් කර භාරදීමට කටයුතු කර නොතිබුණි. | | | කොට්ඨාශවල ඉංජිනේරු හා තාක්ෂණික නිලධාරීන් අධීක්ෂණ කටයුතු සිදුකරනු ලබන අතර මෙම ව්‍යාපෘති සඳහා සම්බන්ධිත ආයතන ගණනාවක් පවතින බැවින් කාල පරාසය ප්‍රමාණවත් නොවීම මත නැවත ගිවිසුම්ගත කාලය දීර්ඝ කරගෙන ඇති අතර හැකි ඉක්මනින් මෙම ව්‍යාපෘති කටයුතු නිම කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | පවතී. |
| (ඍ) | වයඹ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් විගණනයට ඉදිරිපත් කරන ලද 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන හා පුද්ගලයින් 55 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟහිටි දීර්ඝකාලීන බදු වටිනාකම රු.107,864,841ක් විය. | 2023 | අයවිය යුතු හිඟ බදු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ශේෂය නිවැරදි බව දක්වා තිබුණි. | තවදුරටත් රු.97,392,829 ක ශේෂයක් අයකරගත යුතුව පවතී. |
| (එ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය, දඹදෙණිය මූලික රෝහල් 02 හි හා නාරම්මල ප්‍රාදේශීය රෝහලේ නේවාසික රෝගී වාට්ටු හා අනෙකුත් ඒකක වල අවශ්‍යතාවය | 2023 | ශල්‍ය උපකරණ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වීම. | කොරෝනා වසංගත කාලය තුළ විවිධ ආයතන මඟින් පරිත්‍යාග වශයෙන් හා රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ජීව වෛද්‍ය උපකරණ බෙදාදීම තුළ අතිරික්ත | මෙම උපකරණ වලින් කොටසක් තවමත් භාවිතයට ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වෙනුවෙන් ප්‍රමාණවත් ජීව වෛද්‍ය උපකරණ යොදවා තිබියදී 2017 වර්ෂයේ සිට 2022 වර්ෂයේ නොවැම්බර් දක්වා රෝහල් වෙත ලබාදෙන ලද 2023 වර්ෂයේ දළ වෙළඳපල වටිනාකම රු.10,109,760 ක් වූ ශල්‍ය උපකරණ වර්ග 15 ක ඒකක 101 ක් ශල්‍ය ගබඩා තුළ ගබඩා කර තිබුණි. | | | උපකරණ රෝහල් තුළ පවතී. මෙමගින් උපකරණ කිහිපයක් උපස්ථ උපකරණ ලෙස පවතින අතර අනිකුත් උපකරණ සියල්ල අවශ්‍යතා පවතින රෝහල් වෙත බෙදා දෙන ලෙස ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇති බවත් ඒ අනුව ඉදිරියේදී කටයුතු සිදුවන බවත් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දන්වා ඇති බව දන්වා ඇත. | |
| (ඒ) | නියමිත දෛනික සේවා කාලය තුළට ගැනෙන දිවා විවේකය සඳහා වූ විනාඩි 30 ක කාලයද ඇතුළත්ව මධ්‍යහන 12.00 සිට ප.ව 1.00 දක්වා වූ පැයක කාලය සඳහා 2022 හා 2023 වර්ෂ සඳහා අතිකාල දීමනා ලෙස කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්ත වෛද්‍යවරු 21 දෙනෙකු සඳහා රු.1,863,392ක්ද, පුත්තලම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්ත වෛද්‍යවරු 11 දෙනෙකු සඳහා රු. 1,241,141ක අතිකාල දීමනා ගෙවා තිබුණි. | 2023 | ගෙවීම් කිරීමේදී නිතීරීති හා චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධව වයඹ ප්‍රධාන ලේකම් සමග පළාත් විගණන කමිටුවේදී සාකච්ඡා කිරීමෙන් පසු රේඛීය හා පළාත් ආයතනවලට අදාලව ඒකීය ගෙවීම් ක්‍රමයක් යෝජනා කරන ලෙස පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වෙත උපදෙස් ලබාදී ඇති හෙයින් එම උපදෙස් ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | වර්තමානය වන විටත් නිවැරදි වී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඔ) | 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008 (vi) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (අ) වගන්තිය අනුව අනුයුක්ත නිල වාහන හිමිකම් ඇති නිලධාරීන්ට හිමි මාසික ඉන්ධන ලීටර් 135 සීමාව ඉක්මවා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතියක් නොමැතිව ඉන්ධන ලීටර් 4943.4 ක් සමාලෝචිත වර්ෂයේදී වාහන 02 ක් සඳහා ලබාදී තිබුණි. ඒ අනුව පූර්ව අනුමැතියකින් තොරව මාසික ඉන්ධන සීමාව ඉක්මවා 2020 ජනවාරි 01 සිට 2023 මාර්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුළ වටිනාකම රු.1,989,376 ක් වූ ඉන්ධන ලීටර් 4943.4 ක් ලබාගෙන තිබුණි. | 2023 | චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළයුතුය. | අංක PJ – 4705 හා PG – 9401 දරණ කැබ් රථ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සංචිත වාහන වන අතර, සංචිත වාහන සඳහා ඉන්ධන සීමාවන් නොමැති බැවින් ඉන්ධන සැපයීම සඳහා ප්‍රධාන ලේකම් වෙතින් අනුමැතියක් ලබාගෙන නොමැති බව දන්වා සිටිමි. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ, මධ්‍යම රජයේ රාජකාරීවලට යොදා ගන්නා වාහන සඳහා අමතර ඉන්ධන සැපයීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත එම රාජකාරී සඳහා පොළොන්නරුව මහ රෝහලෙන් ඉන්ධන සපයාගෙන ඇති බව දන්වා ඇත. | සීමාව ඉක්මවා ලබාගත් ඉන්ධන වටිනාකම සම්බන්ධයෙන් කටයුතු කර නොමැත. |
| (ඕ) | කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන දෙකක් අනතුරුට ලක්වී පිළිවෙලින් වසර 3 ½ ක් හා වසර 02 මාස 03 ක් ගතවී තිබුණද මූලික පරීක්ෂණ අවසන් වී විනය පරීක්ෂණ අවසන් වී නොතිබීමෙන් එකතුව රු.18,334,550 ක අලාභ අදාළ | 2023 | පළාත් මූල්‍ය රීති අනුව විනය පරීක්ෂණ ප්‍රමාදයකින් තොරව පවත්වා ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. | LW-1790 ගිලන් රථය රියදුරුගේ වරදින් අනතුරට ලක්වී ඇති අතර එහි මුළු අලාභයවන රු.11,705,790 (දෙපාර්තමේන්තු ගාස්තු ද ඇතුලත්ව) රියදුරුගෙන් අයකිරීමට හා වරදකරු වූ රියදුරු සේවයෙන් පහකිරීම සඳහා විනය නියෝග | එක් වාහනයකට අදාළව විනය පරීක්ෂණ සිදු කර ඇති අතර අනෙක් වාහනයට අදාළ මූලික විමර්ශන කටයුතු සිදුකරමින් පවතී. අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර නොතිබුණි. | | | ලබාදී ඇති බව හා PE-4736 දරණ කැබ් රථය අනතුරට ලක්වීමට අදාලව කමිටුවක් මඟින් පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතින බව දන්වා ඇත. | න් අයකරගෙන නොතිබුණි. |
| (ක) | මාරවිල මූලික රෝහලේ බාහිර රෝගී අංශය ජාලගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ ලැප්ටොප් පරිගණක 09 ක්, ප්‍රින්ටර් 07ක්, බාකෝඩ්රීඩර් 25 ක් ඇතුළු උපකරණ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම භාවිතයට නොගෙන ගබඩාවේ තබා තිබුණි. | 2022 | අවශ්‍ය පුහුණු කාර්යමණ්ඩල ලබාගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා ළඟා විය යුතුය. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යාම සඳහා අවශ්‍ය පරිගණක දැණුම ඇති පුහුණු කාර්ය මණ්ඩලයේ හිගය මීට හේතු වී ඇත. | වර්තමානය වන විටත් ක්‍රියාත්මක කර නොමැත. |
| (ග) | පුත්තලම මූලික රෝහල වෙත 2017 වර්ෂයේදී වෛද්‍ය අංශ අතර ජාලගතකරණය සඳහා ලැප්ටොප් පරිගණක 33 ක් ලැබී තිබූ අතර එයින් අංශ 16 ක් වෙත පරිගණක 26ක් පමණක් බෙදා හැර තිබුණි. බෙදාදුන් පරිගණක ඇතුළු සියලු පරිගණක සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිශ්කාර්යව පැවති අතර මේවායෙහි වගකීම් කාලයන්ද ඉක්මවා ගොස් පැවතුණි. | 2022 | අදාළ උපකරණ භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ප්‍රමාණවත් වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාවක් යෙදවීමට තිබූ ගැටලුව නිසා මෙහි යම් ප්‍රමාදයක් සිදු වි ඇති අතර ඉදිරියේදී අඩු පාඩු සම්පූර්ණ කර වැඩසටහන ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කර ඇත. | වැඩසටහන වර්තමානය වන විටත් ආරම්භ කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ච) | පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.4,866,842 ක වියදමින් මීගලෑව අම්ල සෙවන ළමා නිවාස පරිශ්‍රයේ ඉදිකල අවිවාහක ගර්භණී මව්වරුන් සඳහා වූ රැකවරණ මධ්‍යස්ථානයේ කටයුතු එම නිවාසයේ ඉතිරි වැඩ හා නිවාසයේ තාප්පය හා ගේට්ටුව ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්ය පැවතුණි. | 2023 | ඉදිකිරීම් කටයුතු අවසන් කර ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. | මීගලෑව අම්ල සෙවන ළමා නිවාස පරිශ්‍රයේ ඉදිකරන ලද අවිවාහක ගර්භණී ළමා මවුවරුන් සඳහා රැකවරණ මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ නිමකිරීමට 2023 වර්ෂයේ පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව (ජාතික) විසින් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරන බව දන්වා තිබූ හෙයින් එම වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ ඉදිකිරීමට ඇතුලත් නොකල නමුත්, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව (ජාතික) විසින් ප්‍රතිපාදන ලබා දීමට ප්‍රමාද වූ බැවින් වැඩ නිම කිරීමට නොහැකි වූ බවත් මෙම වසරේදී වැඩ නිම කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බවත් දන්වා ඇත. | වර්තමානය වන විටත් නි්ශකාර්යව පවතින අතර ඉදි කිරීම් කටයුතු නැවත ආරම්භ කර ඇත. |
| (ඡ) | වලකුඹුර මැටි නිෂ්පාදන හා පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ 2020 වර්ෂයේදී රු.9,727,058 ක වියදමක් දරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම | 2022 | අප්‍රමාදව නිමකිරීම් සිදුකර අදාළ කාර්ය සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. | ඉදිකිරීම් කටයුතු 2023 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර ඇත. | ඉදිකිරීම් නැවත ආරම්භ කර ඇතත් වැඩ අවසන් කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ව්‍යාපෘතිය නිමකර නොතිබුණි. | | | | |
| (ට) | කොස්හේනාගාර, මිරිහානේගම, වෙන්නරුව, කොස්ගහ ඇල හා රන්දෙණිගම යන පේෂ මධ්‍යස්ථාන වලට අයත් අබලන් වූ ගොඩනැගිලි පහක් පවතින අතර වර්තමානය වනවිට එම මධ්‍යස්ථාන නිෂ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතුණි. | 2022 | අදාළ ගොඩනැගිලි ප්‍රයෝජනවත් කාර්යයකට යෙදිය යුතුව ඇත. | මෙම ගොඩනැගිලි පිහිටි ඉඩම් රජයේ ඵලදායී කටයුත්තක් සඳහා භාවිතා කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත වාර්තා කිරීමට කටයුතු කර ඇත. | නිශ්කාර්යව පවතී |
| (ඩ) | ගොඩවෙල අපජල පිරිපහදු පද්ධතිය නවීකරණය කිරීම සඳහා උපමාන පාදක ප්‍රතිපාදන හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂය තුළදී රු.3,148,922 ක මුදලක් වැයකර පැවතියද අළුත්වැඩියා කටයුතු නිසිපරිදි ඉටුනොවීම හේතුවෙන් වර්තමානය වනවිට පිරිපහදු පද්ධතිය නිෂ්ක්‍රියව පැවතුණි | 2022 | පිරිපහදු පද්ධතිය කඩිනමින් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | නැවත ප්‍රසම්පාදන කටයුතු සිදුකර අදාල කාර්යය සිදු කරන ලෙස ප්‍රධාන ලේකම් සමඟ 2023.05.10 දින පැවති රැස්වීමේදී තීරණය කර ඇත. | ව්‍යාපෘතියේ වැඩ නිම කිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුම්ගත වී නවීකරණ කටයුතු සිදු කරමින් පවතී. |
| (ත) | 2018 ඔක්තෝබර් 10 දින පළාත් සභාව විසුරුවා හැරීමට පෙර දේශපාලන අධිකාරිය වෙත වෙන්කර තිබූ ද්විත්ව කාර්යය කැබ් රථය 2014 දෙසැම්බර් 30 දින සිදුවූ අනතුරට අදාලව රු.6,019,533 ක අලාභයක් සිදුවී තිබූ | 2023 | රාජ්‍ය දේපලවලට සිදුවූ හානි සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් හෝ නඩු පැවරීමක් සිදුකර අදාල පාර්ශවයන්ගෙන් හානියේ වටිනාකම අයකර ගැනීමට | වාහනයේ තව දුරටත් හිගව පවතින රු.2,059,533ක මුදල අය කිරීම සඳහා අදාල රියදුරුට විරුද්ධව හලාවත දිසා අධිකරණයේ නඩුවක් මේ වන විට විභාග වෙමින් පවතී. එසේම නව වැසි අංකය | අධිකරණයේ පවතින නඩුව නිම වී නැති අතර අදාළ අලාභය අයකරගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අතර, ඉන් රු.3,960,000 ක මුදලක් රක්ෂණ සමාගම මඟින් ප්‍රතිපූර්ණය කර තිබුණි. ඉතිරි රු.2,059,533 ක මුදල අදාල වගකිවයුතු පාර්ශවයන්ගෙන් 2023 අගෝස්තු 08 දින වන විටත් අයකරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | | කටයුතු කළ යුතුය. | රජයේ කර්මාන්ත ශාලාව වෙත යොමු කර මුද්‍රණය කර ඇති අතර මෙය සංශෝධනය කර ගැනීමට ඇති හැකියාව පිලිබඳව රජයේ කර්මාන්ත ශාලාව වෙතින් විමසා ඉදිරි කටයුතු කරන බව දන්වා ඇත. | |
| (ද) | පළාත් නිශ්චිත ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.7,945,669 ක් වූ ව්‍යාපෘති 11 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.1,128,892 ක් වැය කර තිබුණද එම ව්‍යාපෘති නිමකර නොතිබුණි. | 2021 | කාල රාමුව තුළ ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතුය. | පැවති අධික වර්ෂාව නිසා වාරි ව්‍යාපෘති ජලයෙන් පිරියාම හා කොරෝනා වසංගතය හේතුවෙන් මෙම ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි වී ඇත. | ව්‍යාපෘති 11 න් ව්‍යාපෘති 02 ක වැඩ නිම කර ඇත. |
| (න) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් හා ඉලෙක්ට්‍රොනික් ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියෙන් වාහන 288 ක ලියාපදිංචිය සම්බන්ධයෙන් ලබාගත් තොරතුරු අනුව, වයඹ පළාත් සභාවේ ආයතන නමින් ලියාපදිංචි කර ඇති වාහන 38 ක් පළාත් සභාවේ ආයතන සතුව නොපැවතුණි. | 2023 | පළාත් සභාව නමින් ලියාපදිංචි වාහන අස්ථානගත වීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. | කාර්යාලයේ පවත්නා ලේඛනවල සඳහන්ව නොමැති බැවින් සනාථ කළ නොහැක. | වාහන හඳුනා ගැනීම සිදුකර නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ප) | නිකවැරටිය, කොටවෙහෙර, පොල්පිතිගම, ඉබ්බාගමුව හා පන්නල යන ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ 5 ක 2023 දෙසැම්බර් 31 දිනට දීර්ඝකාලීන, එලදා හා වාර්ෂික බදු වශයෙන් රු.7,800,774 ක හිඟ බදු මුදලක් අයවිය යුතුව තිබුණි. | 2023 | හිඟ මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | හිඟ මුදල් අයකර ගැනීමට අදාළ බදුකරුවන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | හිඟ මුදල් අයකරගෙන නොමැත. |
| (බ) | **ඒකාබද්ධ අභිජනන ගොවිපල - මාවතගම** වයඹ පළාතට උචිත ඉහළ නිෂ්පාදනයක් හා ගුණාත්මක ලක්ෂණ සහිත උසස් ආරයේ කිරි ගව සතුන් බිහිකර ක්ෂේත්‍රයට සැපයීම අරමුණු කරගෙන මාවතගම සත්ත්ව අභිජනන ගොවිපල ඉදිකිරිම සඳහා සමාලෝචිත වර්ෂය වන විට රු.3,762,207 ක් වැය කර තිබුණද, 2022 පෙබරවාරි 03 දින සිදුකරන ලද ස්ථානීය පරීක්ෂණ අවස්ථාව වන විටත් ඉහත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කර ගැනීමකින් තොරව අදාළ ගොඩනැගිලි නිශ්කාර්යව පැවතුණි. | 2021 | සත්ව අභිජනන ගොවිපල ක්‍රියාකාරී ගොවිපලක් වශයෙන් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම ගොවිපල රාජ්‍ය සහ පුද්ගලික ආයතනයක් සමඟ සහයෝගයෙන් (PPP) ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. | පැවති යෝජනාව වෙනුවට ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත පවරා දීමට කරන ලද තීරණය අනුව ඩෙනවර්වත්ත ගොවිපල 2022/09/26 දින සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් නාවික හමුදාව වෙත භාර දී ඇත. |
| (ම) | ගල්ගමුව රජයේ ගොවිපලේ පවතින 2022 වර්ෂයේ පෙබරවාරි 02 දින වැඩ අවසන් කර භාරදී | 2023, 2022 | නිෂ්කාර්යය වත්කම් අදාළ අරමුණට යෙදවීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. | භාවිතා නොකර නිශ්කාර්යව පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තිබුණු රු.3,662,756 ක් වටිනා ලූණු ගබඩාව සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි. | | | | |
| (ය) | මානව සම්පත් සංවර්ධන අධිකාරිය විසින් 2006 – 2017 කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘති 08 ක් වෙනුවෙන් පුද්ගලයින් 178 දෙනෙකු සඳහා ලබාදී තිබුණු රු.24,286,413 ක ණය මුදලින් 2023 දෙසැම්බර් 31 දින වන විට රු.7,502,349 ක් අයවීමට පැවතුණි. | 2023 | දිගු කාලීන හිඟ හිටි ණය නොපමාව අය කරගත යුතුය. | විගණනය විසින් පෙන්වා දී ඇති ණය ශේෂයන්ට අදාලව 2023.05.31 දින පැවති රු.8,992,220.00 ක් වූ මුදල 2023.12.31 දින වන විට රු.7502349.00 ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය. | රු.7,502,349 ක් වූ අයකර ගත යුතු ශේෂය නොවෙනස්ව පවතී. |
| (ර) | වයඹ පළාතේ සියලුම පෙර පාසල් වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයඹ පළාත තුළ ක්‍රියාත්මක පෙර පාසල් 2152 කින් පෙර පාසල් 910 ක් ලියාපදිංචි කර නොතිබුණි. ඒ අනුව වයඹ පළාතේ පිහිටි පෙර පාසල් සංඛ්‍යාවෙන් සියයට 42 ක් ආයතනයේ නියාමනයට ලක් වී නොතිබුණි. | 2023 | පූර්ව ළමා සංවර්ධන ආයතන ලියාපදිංචි කළ යුතු අතර ඊට අනුකූල නොවන ආයතන සම්බන්ධව නීතිමය කටයුතු කළ යුතුය. | මෙම පෙර පාසල් 386 ට අයත් වන්නේ අන්තර්ජාතික ඉලක්ක වලට අදාළ වන පෙර පාසල් ද, අධිකාරියේ අවසරයක් හා නිසි ප්‍රමිතියකින් තොරව ආරම්භ කර ඇති පෙර පාසල් ද වේ. ප්‍රඥප්තියේ මෙම පෙර පාසල් වලට ගත යුතු නීතිමය පියවර සඳහන් කර නොමැති බැවින් මීට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වුවද ඉදිරියේ දී ප්‍රඥප්ති සංශෝධනයක් තුලින් නිසි ක්‍රියාමාර්ග ගැනිමට බලාපොරොත්තු වන බව සඳහන් කර ඇත. | ප්‍රඥප්තියේ මෙම පෙර පාසල් වලට ගත යුතු නීතිමය පියවර සඳහන් කර නොමැති බැවින් මීට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වුවද ඉදිරියේ දී ප්‍රඥප්ති සංශෝධනයක් තුලින් ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ල) | වයඹ පළාත් පරිසර අධිකාරියේ විධායක නිලධාරීන් හට නෛතික ප්‍රතිපාදනයන් නොමැතිව 2015 සිට 2023 දෙසැම්බර් 31 දින වන විට විධායක දීමනා ලෙස රු.4,525,000 ක් ගෙවා තිබුණි. | 2023 | චක්‍රලේඛ විධිවිධාන වලට කටයුතු කළ යුතුය. | මේ සඳහාද පරීක්ෂා කර කරුණු වාර්තා කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති අතර ඒ අනුව 05/2017 චක්‍රලේඛය වයඹ පළාත් සභාව 2017.10.25 දින සිට අදාල කර ගෙන ඇත. ඒ අනුව ඊට පෙර කාලපරිච්ඡේද සඳහා වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු අය කිරීමට කටයුතු කරමින් පවතින අතර අය කිරීම් පිළිබඳ තොරතුරු ඉදිරියේදී වාර්තා කරන බව දන්වා ඇත. | අයකරගෙන නොමැත. |
| (ව) | අධිකාරි පරිශ්‍රය පිහිටි ඉඩමේ මත්ස්‍ය තටාකාංගනය ඉදිකිරීම වෙනුවෙන් 2008 වර්ෂයේදී රු.4,925,000 ක් වැයකර තිබුණද ව්‍යාපෘතියේ ඉදිරිකිරීම් කටයුතු අතරමඟ නවතා තිබූ අතර, එකී ඉදිකිරීම්ද වර්තමානය වන විට ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි. | 2022 | ව්‍යාපෘති නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසු ව්‍යාපෘති ආරම්භ කර සැලසුම් කළ පරිදි පවත්වාගෙන යා යුතුය. | මෙම මත්ස්‍ය තටාකාංගන අත්තිවාරම මත නැවත ඉදිකිරීමක් කිරීමට සුදුසු මට්ටමක නොපවතින බැවින් මෙම ටැංකි කොටස් පස් පුරවා එම බිම් ප්‍රදේශය අධිකාරියේ ප්‍රයෝජනයට ගත හැකි ලෙස සකස් කර ඇත. | අපේක්ෂිත අරමුණු කරා ළඟා වී නොමැත. |
| (ස) | ඉස්සන්ට වැළදෙන සුදු පුල්ලි වෛරස් රෝග පාලනය සඳහා රු.7,511,710 ක පිරිවැයක් දරා ආරම්භ කර තිබුණු “PCR” විද්‍යාගාරයෙහි 2018 වර්ෂයේ සිට | 2022 | ව්‍යාපෘති සැලසුම් කළ පරිදි පවත්වාගෙන යැමටත්, අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමටත් කටයුතු කළ යුතුය. | ඉස්සන් වගාවට කාලීනව පැවති බාධා හා සීමා වීම්, රසායනාගාර අතර තරගකාරීත්වය වැනි හේතුමත ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීමට නොහැකිවීම | අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත 2018 වර්ෂයේ සිට පී.සී.ආර්. රසායනාගාරය වසා දමා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රසායනාගාර කටයුතු නවතා තිබුණි. | | | නිසා රසායනාගාර කටයුතු අපේක්ෂිත ඉලක්කය කරා ළඟා වීමට නොහැකිවිය. | |
| (හ) | **වයඹ කර්මාන්ත සේවා කාර්යාංශය -** 2023 වර්ෂයේ අගෝස්තු 24 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ අංක 05 ඡේදය අනුව හෙරලියාවල කර්මාන්තපුරය තුළ දැනට ක්‍රියාත්මක හා ක්‍රියාත්මක නොවන ආයතන මගින් 2006 සිට 2016 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව කර්මාන්ත සංවර්ධන අරමුදල (IPF) වෙත අයකර ගත යුතු රු.3,299,488 ක් අයකර ගෙන නොතිබුණි. | 2023 | අයකර ගත යුතු මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඒ පිළිබඳ ඉදිරියේ දී අදාල ක්‍රියාමාර්ග ගන්නා බවත්, ඊට අමතරව මේ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් උපදෙස් ක්‍රියාත්මක කිරීමට ද ඉදිරියේ දී කටයුතු කරන බව දන්වා ඇත. | අයකරගෙන නොමැත. |
| (ශ) | වයඹ සංවර්ධන අධිකාරියට අයත් ගොඩනැගිල්ලේ පවත්වාගෙන යනු ලබන හෝටල් පාසැලට වර්ෂ 02 කට බදු දීමේදී තක්සේරු වාර්තාවක් නොගෙන මාසික රු.200,000 කට බදු ගිවිසුමකට 2021 දෙසැම්බර් 27 දින භාණ්ඩ උපකරණ සහිතව බදු දී තිබුණු අතර, 2022 ජනවාරි 10 දින භාණ්ඩ උපකරණ සහිතව ගොඩනැගිල්ලේ මාසික | 2023 | ආයතන අදාළ වත්කම් තෙවන පාර්ශවයක් වෙත පැවරීමේදී රජයේ තක්සේරුවක් ලබා ගැනීමෙන් පසුව ආයතනයට අලාභයක් සිදුනොවන පරිදි ගිවිසුම් ගත වීමට කටයුතු කළ යුතුය. | රජයේ තක්සේරු වාර්තාවට අනුව රු.360,000 ක් මුදලක් තක්සේරු කර තිබුණ ද, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතන විසින් සිදු කරනු ලබන සේවාවන් සැලකිල්ලට ගනිමින් ඔවුන් විසින් පාඨමාලා පවත්වාගෙන යාමෙන් වයඹ පළාත ඇතුළු අනෙකුත් පළාත් වල සිසුන්ට තම වෘත්තිය හැකියාවන් වර්ධනය | 2025 වර්ෂය සඳහා ගිවිසුම් ගතවීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට නියමිත බව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කුලිය රු.360,000 ක තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර තිබුණි. එබැවින් 2022 හා 2023 වර්ෂ වෙනුවෙන් තක්සේරු කුලියට වඩා අඩු මුදලට ගිවිසුම්ගත වීමෙන් 2022, 2023 වර්ෂය වලට අදාළව වයඹ සංවර්ධන අධිකාරියට සිදු වූ මුළු අලාභය රු.3,840,000 ක් විය. | | | කර ගැනීමට මහඟු අවස්ථාවක් ලැබී ඇත. තවද මෙම පරිශ්‍රයට අදාළ ආරක්ෂක වියදම් විදුලි හා අනෙකුත් සුළු නඩත්තු කටයුතු ඔවුන් විසින් පවත්වාගෙන යන බැවින් බදු කුලිය ලෙස රු.280,000 ක් මුදලක් ගෙවන ලෙස දන්වා ඇත. | |
| (ෂ) | දෙස් විදෙස් සංචාරකයන්ට වයඹ පළාත තුළ හිතකර පරිසරයක් ගොඩනැඟීමේ අරමුණින් 2014 වර්ෂයේ රු.මිලියන 53.3 ක් වැය කර අධිකාරිය විසින් ඉදිකරන ලද සංචාරක මධ්‍යස්ථානය වසර 05 කට වැඩි කාලයක සිට කිසිදු ආදායමක් උත්පාදනය කර ගැනීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි. | 2021 | වත්කම් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | 'Colombo Sanctuary Resort' පුද්ගලික ආයතනයට වර්ෂ 10 ක කාලයක් සඳහා බදුදීමට කටයුතු කළද, ජල ගැටළුව හේතුවෙන් නව ජල සැපයුමක් ලබාගෙන ඉතිරි ඉදිකිරීම් අවසන් කරන තෙක් මෙහි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වී ඇත. | 2018 වර්ෂයේ මෙම ස්ථානය බදු පදනම මත ලබා දී ඇත. නමුත් මෙහි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම සඳහා සිදුකළ යුතු අත්‍යාවශ්‍ය ඉදිකිරීම් හා අළුත්වැඩියාවන් පවතින බැවින් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට නොහැකි මට්ටමක ඇත. |
| (ළ) | වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති ණයගැති ශේෂය වූ රු.66,166,834 තුළ 2004 වසරට පෙර සිට පැවත එන රු.7,049,985 ක හිඟ මෙහෙයුම් ආදායමක් | 2021 | හිඟ ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය. | හිඟ මුදල දිගින් දිගටම අය නොවන ණය ශේෂ ලෙස ගිණුම් වල පවතින බැවින්, පළාත් භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගෙන ගිණුම්වලින් අඩු කිරීමට කටයුතු කරනු ඇත. | මෙතෙක් නිරවුල් කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සහ වසර 2009 – 2012 කාල පරිච්ඡේදයට අදාළ එකතුව රු.739,755 ක හිඟ අලුත්වැඩියා ආදායමක් විය. | | | | |
| (හ) | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය 2013 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව අධිකාරිය වෙත ලැබිය යුතු මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තු රු.13,490,500 ක් හා ප්‍රමාද ගාස්තු රු.2,706,150 ක් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | 2023, 2022 | ලැබිය යුතු මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම මුදල් ගිණුම් වලින් ඉවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම පිණිස වයඹ ප්‍රධාන අමාත්‍යාංශය මගින් කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු වාර්තාව ලැබූ පසු එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. | තවදුරටත් මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තු රු.13,223,000 ක් හා ප්‍රමාද ගාස්තු රු.2,628,100 ක් අය කරගත යුතුව පවතී. |

## 3.4 සබරගමුව පළාත් සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය (ඌණතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 14,625,000,000 | 1,276,400,000 | 13,348,600,000 | 2,234,800,000 | තත්ත්වාගණනය කළ |
| **2022** | 16,436,400,000 | 1,256,900,000 | 15,179,500,000 | 273,300,000 | තත්ත්වාගණනය කළ |
| **2023** | 38,992,200,000 | 1,020,900,000 | 37,971,300,000 | 1,573,800,000 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | අංක අමප/21/1596/304/134 හා 2021 සැප්තැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් මූලධන සංවර්ධන වැඩසටහන් යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන භාවිතයෙන් සිදුකරනු ලබන විවිධ ද්‍රව්‍ය භාණ්ඩ හා උපකරණ බෙදා දීම් සමාලෝචනය කර ඒවා අත්හිටුවා තිබුණ ද පරිපූරක ප්‍රතිපාදන වෙන්කර ගෙන රු.මිලියන 11.6 ක් වැයකර ස්වේච්ඡා සංවිධානවලට බෙදා දීම සඳහා ප්ලාස්ටික් පුටු, විදුලි ජනක යන්ත්‍ර හා මුළුතැන්ගෙයි උපකරණ යනාදි ය මිල දී ගෙන තිබුණි. | 2021 | අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව කටයුතු කර නොමැති බැවින් අදාල නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | එක් අයෙකුට හිමි ඉන්ධන දීමනාව තවත් අයෙකුට ලබා දීමට අංක පීඑස්/සීඑස්ඒ/00/1/4/2 හා 2018 ඔක්තෝබර් 12 දිනැති ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණි. එහෙත්, ගරු ආණ්ඩුකාරතුමා දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළ ඔහුට නිශ්චය කළ රු.මිලියන 0.7 ක ඉන්ධන දීමනාව පෞද්ගලික ලේකම්වරිය වෙත ගෙවා තිබුණි. | 2022 | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. | ගෙවා ඇති මුදල ආපසු අයකරන ලෙස ජනාධිපති ලේකම් විසින් ප්‍රධාන ලේකම් වෙත ද ප්‍රධාන ලේකම් විසින් ආණ්ඩුකාර ලේකම් වෙත ද දන්වා ඇත. | වැයකළ මුදල රජයට නැවත අයකර නොතිබුණි. |
| (ඇ) | ආණ්ඩුකාර ලේකම් කාර්යාලයට අයත් වාහනයක් 2020 වර්ෂයේදී අනතුරට පත්ව අළුත්වැඩියා කර තිබුණ ද, අලුත්වැඩියාවට අදාල රු.මිලියන 6 ක වන්දි මුදල රක්ෂණ ආයතනයෙන් ලබාගෙන නොතිබුණි. | 2022 | වන්දි මුදල කඩිනමින් ලබාගත යුතු ය. | නිතිපති දෙපාර්තමේන්තුව හා පළාත් සභාවේ නිති අංශය මගින් ඉතිරි රක්ෂණ වන්දි ලබා ගැනිමට නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබුණි. | රක්ෂණ වන්දි රු.මිලියන 1 ක් අය වී තිබුණි. |
| (ඈ) | 2017 වර්ෂයේදී ප්‍රධාන අමාත්‍යාංශයට අයත් වාහනයකට වූ හානිය පූර්ණ හානියක් ලෙස සලකා රක්ෂණ ආයතනය විසින් රු.මිලියන 25 ක රක්ෂණ වන්දියක් ගෙවීමට එකඟ වී තිබුණි. එසේ වුවත්, එවකට සිටි ප්‍රධාන | 2022<br>2021 | රජයට සිදු වී ඇති අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. | රථයේ අළුත්වැඩියා කටයුතු නිමකර තිබුණ ද මෙතෙක් රක්ෂණ වන්දි ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් නොගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව දැනුවත්කර තිබුණි. | රක්ෂණ වන්දි අය වී නොතිබු අතර,රථය පළාත් සභාව වෙත ගෙනවිත් නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලේකම් විසින් එම වන්දිය ප්‍රතික්ෂේප කරමින් හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට ද පටහැනිව, එය අලුත්වැඩියාව සඳහා 2018 වර්ෂයේ පෞද්ගලික ගරාජයකට භාර දී 2019 පෙබරවාරි මාසයේදී රු.මිලියන 3 ක අත්තිකාරමක් ද උක්ත රක්ෂණ නියෝජිත ආයතනය වෙතින් පෞද්ගලික ගරාජය වෙත ලබා දී තිබුණි. එහෙත් දැනට වර්ෂ 04 ක කාලයක් ගත වී තිබුණ ද, මේ දක්වාම මෝටර් රථය පළාත් සභාව වෙත ගෙනවිත් නොතිබූ අතර, සම්පූර්ණ රක්ෂණ වන්දි මුදල ද ලබාගෙන නොතිබුණි. | | | | |
| (ඉ) | පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් විසින් සබරගමුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය සම්බන්ධයෙන් 2022 ජනවාරි මාසයේ නිකුත් කළ මූලික විමර්ශන වාර්තාව මඟින් හඳුනාගත් රු.මිලියන 54.4 ක හානි 03 ක් වෙනුවෙන් වූ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | 2022 | අලාභ හානි සම්බන්ධව මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතු ය. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීම සඳහා අවස්ථා දෙකක දි කමිටු පත්කර තිබුණි. | රජයට සිදු වී ඇති පාඩුව අයකර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශයේ 2007 වර්ෂයේ සිට පැවැත එන නොපියවූ උප අග්‍රිම ශේෂයක් වන රු.මිලියන 0.9ක් සමාලෝචිත වර්ෂය තුළ දී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 | රජයට සිදුවී ඇති අලාභය අයකරගැනීමට කටයුතු කළ යුතුය. | බේරුම්කරණය වෙත යොමුවීම සඳහා අවශ්‍ය නීති සහය ලබා ගැනීමට කටයුතු කර තිබුණි. | අග්‍රිම පියවා නොතිබුණි. |
| (උ) | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතියේ රු.මිලියන 500.98 ක ඉදි කිරීම් 24 ක් අත්හැර දමා තිබුණි. | 2022<br>2021 | මෙම ගොඩනැඟිලි ප්‍රයෝජනට ගත හැකි තත්ත්වයට පත් කළ යුතු ය. | අක්මුදල් ඉල්ලුම් කර ඇත. | ව්‍යාපෘති 04 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණි. |
| (ඌ) | රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ජල ව්‍යාපෘති 06 කට අදාළව එකතු වටිනාකම රු.මිලියන 2.5 ක් වූ හිඟ ජල බදු අයකර නොතිබුණි. | 2022 | හිඟ ජල බදු අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. | බදු ගෙවීම් කරන ලෙස ලිපියොමු කර ඇත. | හිඟ බදු අයකර නොතිබුණි. |
| (එ) | 2022 දෙසැම්බර් 31 දිනට හිඟහිටි රු.මිලියන 90.2 ක ඉඩම් බදු ශේෂයක් අයකර නොතිබුණු අතර ඉන් රු.මිලියන 31 ක් වර්ෂ 02 කට වඩා පැරණි විය. | 2022 | මූල්‍ය රීති ප්‍රකාරව කඩිනමින් හිඟ හිටි බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ලිපි හා සාකච්ඡා මඟින් දැනුවත් කිරීම, වාරික වශයෙන් ගෙවීමට අවස්ථාව සැලසීම වැනි පියවර ගෙන තිබුණි. | තව දුරටත් හිඟ බදු රු.මිලියන 79 ක් අයවිය යුතුව පැවැතුණි. |
| (ඒ) | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට පැවැති රු.මිලියන 90.8 ක් වූ හිඟ ආදායමෙන් රු.මිලියන 7.6 ක් වසර 10ත් 22ත් අතර ද, රු.මිලියන 2.5 | 2023 | හිඟ ආදායම් අයකළ යුතු ය. | හිඟ බදු අයකර ගැනීම හා නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී. | 2024 ජුනි 30 දිනට හිඟ ආදායම රු. මිලියන 48.1 ක් අයවීමට ඇති අතර අවසන් නොවූ නඩු 130 කි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ක් වසර 05ත් 10ත් අතර ද රු.මිලියන 80.7 ක් වසර 01ත් 05ත් අතර ද පැවැතිණි. මේ වෙනුවෙන් නීතිමය පියවර ගෙන 2023 දෙසැම්බර් 31 දිනට අවසන් නොවූ නඩු 174ක් පැවැතිණි. | | | | |
| (ඖ) | 2023 වර්ෂයේදී ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 165.3 ක් වූ ඉදිකිරීම් කර්මාන්ත 32ක් ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ හා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය වෙත ලබා දී තිබුණි. | 2023 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු ය. | වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමානයේ දී ද ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව අධිකාරිය වෙත ඉදිකිරීම් කර්මාන්ත පිරිනැමීම සිදුකෙරේ. |
| (ඕ) | සබරගමුව සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරියේ වසර 05කට වඩා පැරණි රු.මිලියන 23 ක් වූ ණයගැති ශේෂය, මුළු ණයගැතියන්ගෙන් සියයට 38 ක් විය. | 2023 | අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය. | මේ සඳහා “බේරුම්කරුවෙකු” පත්කරන ලෙස ප්‍රධාන ලේකම්ගෙන් ඉල්ලීම් කර ඇත. බාහිර ආයතනවලට අදාල ශේෂ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර තිබුණි. | ණයශේෂ අය වී නොතිබුණි. |
| (ක) | රාජ්‍ය ආයතනවල සභාපතිවරුන්ට හිමි ලීටර් 150ක ඉන්ධන ප්‍රමාණය නියම කළ 2022 ජනවාරි 03 දිනැති PS/SP/Circu/01/02/20 | 2023 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු ය. | නව ආණ්ඩුකාරතුමියගේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කර ඇත. | වැඩිපුර ගෙවීම් අයකර නොතිබුණු අතර මේ වන විට සභාපතිවරයා ධූරයෙන් ඉවත් වී තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 20 ජනාධිපති චක්‍රලේඛයට පටහැනිව ලබාගත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත 2023 නොවැම්බර් මස සිට සබරගමුව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපතිවරයාට මසකට ඉන්ධන ලීටර් 300 ක් ලබා දී තිබුණි. | | | | |
| (ග) | සබරගමුව පළාතේ පළාත් සභාවේ 1994 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ, 17 වගන්තිය අනුව මගී සේවා බලපත්‍රයක් පැවරිය නොහැකි වුවද, 2023 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කයේ පමණක් අවස්ථා 197ක දී රු.මිලියන 19.5 ක් වටිනා මගී සේවා බලපත්‍ර වෙනත් පුද්ගලයින්ට පවරා තිබුණි. | 2023 | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. | අදාල වගන්ති සංශෝධනය කර නව ප්‍රඥප්තියක් කෙටුම්පත් කර ඇත. | වර්තමානයේ ද මගී සේවා බලපත්‍ර පැවරීම සිදු වේ. |
| (ඝ) | සබරගමුව පළාතේ පළාත් සභාවේ 1994 අංක 01 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තියේ, 09 හා 19 වගන්ති අනුව, මගී සේවා බලපත්‍ර නොමැති බස් රථ 192කින් රු.මිලියන 3.5 ක් බලපත්‍ර ගාස්තු හා අධිභාර ලෙස අයවිය යුතුව පැවැතිණි. | 2023 | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය. | දඩ හා අධිභාර අය කිරීමට කටයුතු කර ඇත. | රු.මිලියන 0.6 ක් පමණක් අය වී තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ජ) | බස් රථ 168 කින් වර්ෂ 03ක් පැරණි හිඟහිටි රු.මිලියනයක දඩ මුදල් අයකර නොතිබුණි. එමෙන්ම, 2023 දෙසැම්බර් 31 දිනට බස් රථ 119 කින් රු.මිලියන 6.4 ක ලොග් පත්‍ර ආදායමක් ද, බස් රථ 86කින් අන්තර් පළාත් පිවිසුම් ගාස්තු රු.මිලියන 1.1 ක් ද අයවිය යුතුව පැවැතිණි. | 2023 2022 | හිඟ මුදල් අප්‍රමාදව අයකළ යුතු ය. | මෙම හිඟ හිටි මුදල් අයකරමින් පවතින අතර, හිඟ හිටීමට හේතු සලකා බැලීමෙන් අනතුරුව අවලංගු කිරීම් හා නිදහස් කිරීම් සිදු කර තිබුණි. | 2024 ජූලි 31 දිනට දඩ හා අධිභාර ලෙස රු.මිලියන 0.7 ක් ද ලොග් පත්‍ර ආදායම ලෙස රු.මිලියන 5.4 ක් ද අන්තර් පළාත් පිවිසුම් ගාස්තු ලෙස රු.මිලියන 3.1 ක් හිඟව පැවතුණි. |
| (ට) | ගොඩකවෙල ප්‍රාදේශීය රෝහලේ රු.මිලියන 3.4 ක් වැයකර 2021 වර්ෂයේ ඉදිකිරීම් නිම කළ එක්ස් කිරණ කාමරය ඉදි කළ දින සිට සහ 2019 වර්ෂයේදී වෙනත් රෝහල් වෙතින් ලද එක්ස් කිරණ යන්ත්‍ර 02 ක් හා 2021 වර්ෂයේ ලද ජෙනරේටරයක් ලද දින සිට නිශ්කාර්යව පවතී. | 2023 | වත්කම් අභාවිතව නොතැබිය යුතු ය. | ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ජෙනරේටර් ඒකකය සඳහා ඇස්තමේන්තුවක් ලබා ගැනීම<br>X-Ray යන්ත්‍රය සඳහා අවශ්‍ය අමතර කොටස් අමාත්‍යාංශය වෙතින් ඉල්ලුම් කර ඇත. | තවදුරටත් නිශ්කාර්යව පැවතුණි. |
| (ඩ) | කෑගල්ල ආයුර්වේද රෝහල සතු 2020 වර්ෂයේ වැඩ නිම කළ රු.මිලියන 67 ක් වූ ගෙවන වාට්ටු සහිත ගොඩනැගිල්ල 2024 ජනවාරි වන විටත් අභාවිතව පැවැතිණි. | 2023 | වත්කම් අභාවිතව නොතැබිය යුතු ය. | අළුත්වැඩියා කටයුතු කිහිපයක් සිදු කර තිබුණි.<br>අවශ්‍ය උපකරණ යම් ප්‍රමාණයක් මිලදී ගෙන තිබුණි. | තවදුරටත් නිශ්කාර්යව පැවතුණි. |
| (ත) | සමුපකාර සංවර්ධන අරමුදල මඟින් වර්ෂ 2000 - 2018 අතර කාලය තුළ දී සමුපකාර | 2023 | ණය අයකර ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ය. | ණය අයකිරීමට කටයුතු කර ඇත. | 2024 අගෝස්තු 30 දිනට රු.මිලියන 3.7 ක් අය වී තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සමිති 12ක් වෙත ලබාදුන් ණයවලින් 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 11.4 ක ණය අයවිය යුතුව පැවතුණි. | | | | |
| (ද) | රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 08 ක 2023 නොවැම්බර් වන විට අලෙවි කළ නොහැකිව පොහොර 6,001,815kg ක් ගබඩාවල රඳවා තිබුණි. මීට විසඳුමක් ලෙස කාබනික පොහොර සඳහා වෙළඳපොළක් ඇතිකර ගැනීමට තත්ත්ව සහතිකයක් ලබා ගැනීම සඳහා පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වීම කළ යුතු වුවත්, පළාත් පාලන ආයතන කිසිවක් පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වී එම පොහොර අලෙවි කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | 2023 | තත්ත්ව සහතිකයක් ලබාගෙන කාබනික පොහොර අලෙවි කර ගැනීම සඳහා කටයුතු කළ යුතු ය. | පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචිය සිදු කිරීම සම්බන්ධව සියලු පළාත් පාලන ප්‍රධානීන් දැනුවත් කර තිබුණි. | කිසිදු ආයතනයක් ලියාපදිංචි වී නොතිබුණි. ගබඩාවල පොහොර තොග තවදුරටත් පැවැතුණි. |
| (න) | බලවින්න පෙරනිම් කොන්ක්‍රීට් අංගනයට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ වර්ෂ 01 ට වැඩි රු. මිලියන 3 ක ණය ශේෂ පැවැතිණි. | 2023 | හිඟ ණය කඩිනමින් අය කළ යුතු ය. | අයකර ගැනීම සඳහා කටයුතු කර ඇත. | ණය ශේෂයෙන් රු.මිලියන 0.1 ක් පමණක් අයකර ගෙන තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ප) | 2021 වර්ෂයේ ලද රු.මිලියන 2 ක් වූ ශ්‍රවණාධාර උපකරණ 143ක් සහ 2023 වර්ෂයේ මිල දී ගත් රු.මිලියන 5.6 ක කිහිලිකරු 44ක්, කොමඩ් රෝද පුටු 98ක්, රෝද පුටු 04ක්, කොමඩ් පුටු 22 ක්, ඇවිදින රාමු 84ක්, අත්වාරු 63ක් හා වායු මෙට්ට 72ක් 2024 මාර්තු වන විටත් පරිවාස, ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ගබඩාවේ අභාවිතව පැවැතිණි. | 2023 | අවශ්‍ය අයට කඩිනමින් එම භාණ්ඩ ලබාදීමට කටයුතු කළ යුතු ය. | ඉල්ලුම්කරුවන් දැනුවත් කර ඇත. | උපකරණවලින් සියයට 50 ට වැඩි ප්‍රමාණයක් තවදුරටත් ඉතිරිව පැවැතුණි. |
| (බ) | ඉකුත් වර්ෂ 03 තුළ දූෂණ වංචා පිළිබඳ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ලද විනය පැමිණිලි 68 කින් පැමිණිලි 20ක් ලද දින සිට වර්ෂයකට වඩා කල්ගත වී තිබුණ ද, අවසන් කර නොතිබුණි. | 2023 | විනය පැමිණිලි අප්‍රමාදව අවසන් කළ යුතු ය. | අදාළ පැමිණිලි පරීක්ෂා කර වාර්තා ලබා දීම සඳහා ඒ ඒ කලාප කාර්යාල වෙත යොමු කර තිබුණි. | විනය කටයුතු අවසන් කර නොතිබුණි. |
| (ම) | පෙර පාසල් ලියාපදිංචි කිරීම පූර්ව ළමාවිය සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යයක් වුවද, පළාතේ පෙර පාසල් 1481 කින් 495ක ලියාපදිංචිය 2023 වර්ෂයට සිදුකර නොතිබුණි. | 2023<br>2022 | ලියාපදිංචි නොකළ පෙර පාසල් සොයා බලා යාවත්කාලීන කළ යුතු ය. | පෙර පාසල් සඳහා නිර්ණායක සම්පූරණ කිරීමෙන් අනතුරුව යාවත්කාලීන කිරීමට උපදෙස් ලබා දී ඇත. | 2024 අගෝස්තු දක්වා ලියාපදිංචි නොකල පෙර පාසල් 577 ක් පැවැතුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ය) | මාර්ග සංවර්ධනය යටතේ 2006 හා 2007 වර්ෂවල දී ලබාදුන් අත්තිකාරම් රු. මිලියන 4.8 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 15 ක් ඉක්මවා තිබුණද, නිරවුල්කර නොතිබුණි. | 2022 2021 | රජයට සිදුවී ඇති අලාභය අයකරගැනීමට කටයුතු කළ යුතුය. | බේරුම්කරණය වෙත යොමු වීම සඳහා නීතිපති වෙත යොමු කර ඇත. | අත්තිකාරම් මුදල් අය වී නොතිබුණි. |

## 3.5 ඌව පළාත් සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය (ඌණතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 91,842,613,965 | 1,608,270,777 | 90,217,571,820 | (2,205,982,794) | තත්ත්වාගණනය කළ |
| **2022** | 88,219,947,816 | 1,046,809,389 | 87,167,999,819 | (3,328,737,257) | තත්ත්වාගණනය කළ |
| **2023** | 85,386,842,340 | 867,319,641 | 84,519,522,699 | (2,943,894,498) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ආණ්ඩුකාරවරයා හා ආණ්ඩුකාරවරයාගේ සම්බන්ධීකරණ ලේකම් වෙත මාසිකව උපරිම ඉන්ධන ප්‍රමාණයට අදාළ දීමනාවක් ලබාදී තිබියදී 2020 සැප්තැම්බර් මස සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා අතිරේක ඉන්ධන ලෙස පිළිවලින් ඉන්ධන ලීටර් 5,247.37 ක් වෙනුවෙන් රු.909,322 ක් හා ඉන්ධන ලීටර් 3,420 ක් වෙනුවෙන් රු.426,100 ක් ගෙවා තිබුණි | 2021 (1.5.1) | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක පීඑස්/සීඑස්ඒ/11-18දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය | පළාතෙන් පිටත රාජකාරී කටයුතු සඳහා ගරු ආණ්ඩුකාරතුමා සහභාගීවීමේදී අමතර ඉන්ධන බිල්පත් විශේෂත්වයක් සේ සලකා ප්‍රතිපූරණය කර ඇති අතර ගරු ආණ්ඩුකාරතුමා විසින් ලබාදුන් නියෝග ප්‍රකාරව සම්බන්ධීකරණ ලේකම්වරයා පළාතෙන් පිටත රාජකාරි ඉටු කිරීම සඳහා ඉදිරිපත් කළ ඉන්ධන බිල්පත් ප්‍රතිපූරණය කර ඇත. | වැඩිපුර ගෙවන ලද ඉන්ධන සඳහා ගෙවන ලද මුදල් ආපසු ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. |
| (ආ) | 6 වන ඌව පළාත් සභාවේ සිටි පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 187 දෙනෙකුට | 2021 1.5.2 .ඇ.(i) | අවිධිමත්ව ගෙවන ලද දීමනා ආපසු අයකර ගත යුතුය. | 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනතේ සේවා යෝජකයකු වශයෙන් රජයේ දෙපාර්තමේන්තු හා | නෛතික විධිවිධානයට අනුරූප නොවන ලෙස සිදුකළ ගෙවීම් ආපසු අයකරගත යුතු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඔවුන්ගේ සේවය 2019 ඔක්තෝබර් මාසයේදී අවසන් වීම වෙනුවෙන් ගෙවනු ලබන අවසාන ගෙවීමක් ලෙස දක්වා, එම නිලධාරීන්ට ගෙවන ලද මාසික දීමනාවෙන් සියයට 12 ක් වන පරිදි හා ඔවුන් සේවය කළ මාස ගණන අනුව සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. 8,867,895 ක් වූ පාරිතෝෂික දීමනා ගෙවා තිබුණි. මෙම ගෙවීම සඳහා කිසිදු නෛතික විධිවිධානයක් නොපැවතුනි. | | | අමාත්‍යාංශඅදාළ කර ගත නොහැකිය. රජයේ ව්‍යවස්ථාපිත ආයතන හා සංස්ථා වෙනුවෙන් මෙම පනත ක්‍රියාත්මක වන අතර මෙම ගෙවීම් එම පනතේ විධිවිධාන අනුව සිදුව නොමැත. | වුවද අයකරගෙන නොතිබුණි. |
| (ඇ) | පාසල්වල හදිසි ආපදා කළමනාකරණය වෙනුවෙන් ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණු ප්‍රතිපාදනයනයෙන් රු. 2,257,872 ක් වැය කර වැලිමඩ විජය විදුහලේ ඉදිකළ මීටර් 05 ක උසකින් සහ මීටර් 12 ක දිගකින් යුත් රැඳවුම් බැම්මේ ඉහළ කෙළවරින් වැලිමඩ බදුල්ල මාර්ගය දෙසට මිලිමීටර් 100 පමණ නෙරා තිබීම නිසා අනතුරුදායක තත්ත්වයක් පැවතුනි. | 2021<br>1.5.11(අ) | අනතුරුදායක තත්ත්වය අවම කර ගැනීමටඅවශ්‍ය පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය. | රැඳවුම් බැම්මට ඉහළින් වූ මිදුල ජලය කාන්දු නොවන පරිදි සකස් කළ අතර රැඳවුම් බැම්මෙහි ඉදිරියට නෙරා ඇති කොටසනැවත ඉදිකිරීමට කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇත. | වර්තමාන වන විට ද නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (ඈ) | 6 වන ඌව පළාත් සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසුව නාමික ධූරයක් වූ | 2021<br>1.5.2<br>ඇ.(ii) | සභාපතිවරයාගේ පෞද්ගලික කාර්යමණ්ඩලය සඳහා ගෙවීම් | 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 7(2) වගන්තිය ප්‍රකාරව පළාත් | නෛතික ප්‍රතිපාදනයකින් තොරව ගෙවන ලද මුදල ආපසු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සභාපතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 11 දෙනෙකු වෙනුවෙන් 2019 ඔක්තෝබර් 08 දින සිට 2021 දෙසම්බර් 31 දින දක්වා ඌව පළාත් සභාවට කිසිදු සේවයක් ලබා ගැනීමෙන් තොරව රු. 14,034,374 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.<br><br>2022 ජනවාරි 01 සිට 2022 ජුලි 31 දක්වා රු. 4,170,265 ක් ගෙවා තිබුණි. | 2022 1.5.2(ආ) | කිරීමට නෛතික ප්‍රතිපාදන සලසා නොමැති බැවින් ගෙවන ලදමුදල් නැවත අය කර ගත යුතුය. | සභාවේ සභාපතිවරයාගේ ධූරය අවසන් නොවන අතර සභාපතිවරයා වෙත හිමි වරප්‍රසාද අඩු කිරීමටද නීතිමය ප්‍රතිපාදනයක් නොමැත. | අයකරගත යුතු වුවත් අයකරගෙන නොතිබුණි. |
| (ඉ) | ඌව පළාත් ආණ්ඩුකාරවරයාට අතිරේක නිවසක් ලෙස ප්‍රධාන අමාත්‍ය නිල නිවස ලබාදී තිබුණු අතර එම නිවස, කුලී අයකිරීමකින් තොරව ආණ්ඩුකාරවර කාර්ය මණ්ඩලය සඳහා පාවිච්චියට ලබාදී තිබුණි. ඒ සඳහා 2021 ජනවාරි සිට 2022 ඔක්තෝබර් දක්වා කාලයට අදාළව එම කාර්ය මණ්ඩලය විසින් ගෙවිය යුතු රු.314,761 ක් වූ ජල බිල්පත් හා විදුලි බිල්පත් වියදම ඌව පළාත් සභා අරමුදලින් ගෙවා තිබුණි. | 2022 1.5.1 | ප්‍රධාන අමාත්‍ය නිල නිවාසය භාවිතා කිරීම වෙනුවෙන් නිවාස කුලී අයකරගත යුතු අතර විදුලි හා ජල බිල්පත් පියවීම සඳහා පළාත් සභා අරමුදලින් දරන ලද වියදම් නිවස උපයෝජනය කළ කාර්ය මණ්ඩලයෙන් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ප්‍රධාන අමාත්‍යතුමා වෙත වෙන්ව ඇති නිල නිවස ඒ හා සමාන තත්ත්වයේ වෙනත් අයෙකු නොමැති බැවින් සහ මෙම නිල නිවස නිසි නඩත්තුවකින් යුතුව පවත්වාගෙන යායුතු බැවින් ඉහත අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන ආණ්ඩුකාරතුමා වෙත තාවකාලික ප්‍රයෝජනය සඳහා වෙන් කර දී ඇත. | සභා අරමුදලින් දරන ලද ජල හා විදුලි බිල්පත් අයකරගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව සිය ආයතනවල කාර්ය මණ්ඩලය වෙත ගෙවනු ලබන දීමනා තීරණය කිරීමෙන් වැලකිය යුතු බව දක්වා තිබිය දී ඌව පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලයේ නිලධාරීන් 30 දෙනෙකුට 2017 අගෝස්තු මස සිට 2022 ජුනි මස දක්වා ඔවුන්ගේ මූලික වැටුපෙන් සියයට 25 ක් වන පරිදි රු. 13,222,231 ක විශේෂ දීමනාවක් ගෙවීම් කර තිබුණි. | 2021 1.5.2(අ) සහ<br><br>2022 1.5.2 (අ) | ගිණුම්කාරක සභාවේ නිර්දේශය අනුව නෛතික තත්ත්වය පැහැදිලි කරගත යුතුය. | මෙම දීමනාව ගෙවා ඇත්තේ ඌව පළාත් සභාවේ 2017 අංක 03 දරන ප්‍රඥප්තිය අනුව වේ. පළාත් සභාව සක්‍රියව ක්‍රියාත්මක නොවන හෙයින් මේ වන විට මෙම දීමනාව තාවකාලිකව නවතාලීමට කටයුතු කර ඇතත් අදාළ ප්‍රඥප්තිය තව දුරටත් බලාත්මකව පවතී.2023.05.09 දින පැවති රාජ්‍ය ගිණුම්කාරක සභාවේදී මේ සම්බන්ධයෙන් පවතින නෛතික බලය පරීක්ෂා කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් නියෝග කර ඇත. | මේ දක්වා නෛතික තත්ත්වය පැහැදිලි කරගෙන නොතිබුණි. |
| (උ) | ඌව පළාත් සභාවේ නිලධාරීන් සඳහා පස්මහල් නිවාස සංකීර්ණයේ ඉදිකිරීම් 2016 වර්ෂයේදී රුපියල් මිලියන 131.2 කට ඇස්තමේන්තු කර තිබුණු අතර රුපියල් මිලියන 88.1 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2018 මැයි 09 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණු මෙම කර්මාන්තය සඳහා කොන්ත්‍රාත්කරුවන්ට | 2022<br><br>1.5.14. (ii) | කොන්ත්‍රාත්තුවට අදාළ ඉතිරිවැඩ කඩිනමින් නිමකර නිල නිවාසය නිලධාරීන් වෙත ලබාදීමට කඩිනමින් පියවර ගත යුතුය. | මෙම කර්මාන්තය 2016 වර්ෂයේදී ආරම්භ කළ අතර ලංසු ප්‍රදානය පිළිනොගැනීම හේතුවෙන් අධිකරණ ක්‍රියාමාර්ගයකින් නතර විය. ඒ අනුව, 2 වන ප්‍රසම්පාදනය 2017.09.14 දින ආරම්භ කරන ලද අතර, 2019 වර්ෂයේ මුල දක්වා සාර්ථකව ඉදිකිරීම් කටයුතු සිදුකරගෙන යන ලදි. 2019 වර්ෂය වන විට කොන්ත්‍රාත්කරුගේ | මේ වන විටද කර්මාන්තය නිම වී නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රුපියල් මිලියන 49.7 ක් ගෙවා තිබුණ ද මේ දක්වා කර්මාන්තය අවසන් කර නොතිබුණි. කර්මාන්තයේ ඉතිරි සියයට 45 ක ප්‍රමාද වූ වැඩ කොටස් නිම කරවා ගැනීම සඳහා රුපියල් මිලියන 155.2 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා නිසා මෙම කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු වසර 04 ක ප්‍රමාදයක් නිරීක්ෂණය වන අතර ඇස්තමේන්තුව වරින්වර සංශෝධනය කිරීම මත රුපියල් මිලියන 88.1 කට ඉදිකිරීම් කටයුතු අවසන් කර දැමීමට හැකියාවක් තිබුණු කර්මාන්ත වෙනුවෙන් රුපියල් මිලියන 204.9 ක් වැය කිරීමට සිදුවී තිබුණි. ඒ අනුව මුල් ඇස්තමේන්තුව ඉක්මවා තවදුරටත් ඉටුකළ යුතු වැඩ කොටස් නිමකර ගැනීමට රුපියල් මිලියන 73.7 ක් වැඩිපුර දැරීමට සිදු වී තිබුණි. | | | දැඩි අසනීප තත්ත්වය හා ඔහුගේ ව්‍යාපාර කටයුතු කඩාවැටීම (Bankrupt) හේතුවෙන් 2020 වර්ෂයේදී තෙවන ප්‍රසම්පාදන කටයුත්තකට යොමු වූ අතර එවකට රටෙහි පැවති තත්ත්වය අනුව ඔහු විසින් ඒකපාර්ශවිකව ගිවිසුම අවලංගු කරන ලදී. 2022 වර්ෂයේදී නැවත වරක් ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත. එහිදී පවත්නා මුදල් තත්ත්වය අනුව කොටස් වශයෙන් ඉදිරි කටයුතු නිම කිරීමට සැලසුම් කර ඇත. 2023.05.09 දින පැවති පාර්ලිමේන්තු ගිණුම්කාරක සභාවට පැවති තත්ත්වය දැනුම් දීම සිදු කරන ලදී. | |
| (ඌ) | රජයේ නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව ගෙවීමේදී අදාළ මාසයේ පළමු දින | 2022 1.5.18 (II) | 2014 ජනවාරි 01 දිනැති අංක 01/2014 දරන ජාතික අයවැය | නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනා ගෙවීම සම්බන්ධයෙන් | වැඩිපුර ගෙවීම් කරන ලද මුදල ආපසු නිලධාරීන්ගෙන් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ප්‍රකාශිතව පැවැති සාමාන්‍ය පෙට්‍රල් හා ඩීසල් මිල ගණන් මත පදනම්ව ගණනය කළයුතු වුවත් නිලවාහන හිමිකම් ලබන නිලධාරීන් 72 දෙනෙකුට මාසයේ පළමු දිනට පවතින සුපිරි පෙට්‍රල්වල සහ ඩීසල්වල මිල පදනම් කරගෙන මාසික ඉන්ධන දීමනාව ගණනය කර 2009 ජනවාරි මස සිට 2022 ජුලි මාසය දක්වා කාලය තුළ රු. 7,842,436 ක් වැඩිපුර ඉන්ධන දීමනා ගෙවා තිබුණි. | | චක්‍රලේඛයේ 2.1.3(ii) ඡේදය ප්‍රකාරව වැඩිපුර ගෙවූ මුදල් ආපසු අයකර ගත යුතුය. | නිශ්චිත ඉන්ධන ලීටර ප්‍රමාණයක් සඳහන් කර ඇතත් නිශ්චිත ඉන්ධන වර්ගයක් සඳහන් කර නොමැත. ඒ අනුව, විශේෂයෙන් රජයේ නව වාහන වෙනුවෙන් තාක්ෂණික නිර්දේශ අනුව විශේෂිත ඉන්ධන වර්ගයක් නියම කර ඇති අවස්ථාවලදී වාහන සඳහා එම ඉන්ධන වර්ගය භාවිතා කිරීම සිදු කරයි. කෙසේ වෙතත්, පසුගිය කාලය තුලදී ඉන්ධන මිල ඉහළ යාම හා ඉන්ධන හිඟය හා ඒ අනුව ඉන්ධන වර්ගයන් වෙළඳපොළ තුල නොමැති වීම, ප්‍රතිපාදන සීමා වීම සැලකිල්ලට ගෙන 2022 ජුනි මස සිට සාමාන්‍ය ඉන්ධන වෙනුවෙන් ගෙවීම තීරණය කර ඇත. | අයකරගෙන නොතිබුණි. |
| (එ) | පළාත් සභාවේ ආණ්ඩුකාරවරයාට සහ ඔහුගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයට හිමිවිය යුතු පහසුකම් පිළිබඳව චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස පෞද්ගලිකව දැරිය යුතු රු.808,334 ක වියදම් පළාත් සභා අරමුදලින් ගෙවා තිබුණි. | 2023 1.5.1 **(අ) (i)** | ජනාධිපති ලේකම් චක්‍රලේඛය අනුව කටයුතු කර වියදම් කළමනාකරණය කළ යුතුය. | ඌව පළාත් ආණ්ඩුකාරවර නිල නිවසේ භාවිතය සඳහා ගෑස් ලබාදුන්නද මේවා ගරු ආණ්ඩුකාරතුමාගේ පෞද්ගලික පරිහරණය සඳහා එතුමා වෙත ලබාදීමක් සිදු නොවේ. | පෞද්ගලිකව දැරිය යුතු වියදම් රජයේ මුදලින් දරා ඇති බැවින් ආපසු අයකරගත යුතු වුවත් අයකරගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඒ) | මාසික ඉන්ධන දීමනා ගෙවීමේදී අදාළ මාසයේ පළමුවන දින දේශීය වෙළඳපොලෙහි පවතින ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සාමාන්‍ය ඉන්ධන මිල අනුව දීමනා තීරණය කළයුතු වුවද, ඊට අනුකූල නොවන පරිදි ඌව පළාත් ආණ්ඩුකාර වරයා සහ ඔහුගේ සම්බන්ධීකරණ ලේකම්, පුද්ගලික ලේකම්, මාධ්‍ය ලේකම් හා මහජන සම්බන්ධතා නිලධාරී වෙත 2022 අගෝස්තු සිට 2023 ජුනි දක්වා සුපිරි ඩීසල් වෙනුවෙන් ඉන්ධන ගාස්තු රු.2,439,475 ක් ද සභාපතිවරයා වෙනුවෙන් රු.344,800 ක් ද වැඩිපුර ගෙවා තිබුණි. | 2023<br><br>1.5.1(අ)<br>(ii)<br>1.5.2(අ) | ඉන්ධන භාවිතය කළමනාකරණය කර ගැනීම වාහන භාවිතා කරන නිලධාරීන්ගේ වගකීමක් වන අතර චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය. | ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා සහ එම කාර්යය මණ්ඩලය වෙත වෙන්කර ඇති යුරෝපයේ සහ ජපානයේ නිෂ්පාදිත නවීන වාහන සඳහා සුපර් ඩීසල් භාවිතා කරන ලෙස දේශීය නියෝජිත ආයතන විසින් ලිඛිතව දන්වා තිබීම හේතුවෙන් නඩත්තු සහ සේවා පිරිවැය අවම කර ගැනීමේ අවශ්‍යතාවය මත සුපර් ඩීසල් සපයා ඇත.<br>ඔබ විසින් පෙන්වා දුන් චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් සියලු වාහන සඳහා 2023 අප්‍රේල් මස සිට සමාන්‍ය ඩීසල් භාවිතා කරන නමුදු, එම රථ වාහනවල ඉන්ධන දහන පද්ධතිය (Injector system) තුළ දෝෂ මතුවී වාර්ෂික වායු විමෝචන පරික්ෂාව ද අසමත්වීමේ තත්ත්වයක් නිරීක්ෂණය වුනු බව සඳහන් කරන අතර, එම හේතුවෙන් නඩත්තු වියදම් වැඩිවීම් තත්ත්වයක් දක්නට ලැබේ. | ඉන්ධන බිල්පත් සඳහා ගෙවීමේදී සාමාන්‍ය වෙළඳපල මිල පදනම් කරගත යුතු අතර සුපරි ඉන්ධන යොදන්නේනම් අමතර මුදල් ලබාගන්නා පාර්ශවය දැරිය යුතුය. ඒ අනුව වැඩිපුර ගෙවා ඇති මුදල අයකරගත යුතු වුවත් අයකරගෙන නොතිබුණි. |
| (ඔ) | ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ ජේෂ | 2023<br><br>1.5.4 (අ) | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු විය යුතුය. | රේඛීය සංචාරක අමාත්‍යංශයේ ප්‍රතිපාදන මුදල් යටතේ බණ්ඩාරවෙල | ව්‍යාපෘතිය මේ වන විටද ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය ඌව පළාත තුළ සංචාරක ආකර්ෂණය ඉහල නැංවීම සඳහා බණ්ඩාරවෙල දුම්රියපොළ ස්ථානය අසල අදියර 03 ක් යටතේ නැරඹුම් වේදිකාවක් හා ගිමන්හලක් ඉදිකිරීමට සැලසුම්කර තිබුණි. එහි පළමු අදියර යටතේ රු.2,232,537 ක් වැයකර නැරඹුම් වේදිකාව පමණක් ඉදිකර තිබුණි. 2023 නොවැම්බර් 20 වන විටද නැරඹුම් වේදිකාවට පිවිසෙන පඩිපෙල අර්ධ වශයෙන් නිමකර භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවතියද ඇස්තමේන්තු ප්‍රකාරව පඩිපෙල සඳහා සම්පූර්ණ වටිනාකම වූ රු.552,543 ක් ගෙවා තිබුණු අතර පසුව ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු නතර කර දමා තිබීමෙන් ව්‍යාපෘති පරිශ්‍රය වල් බිහිවී තිබූ අතර වැය කරන ලද රු.2,232,537 ක මුදල අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි. | | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ව්‍යාපෘතිය ඉටු කිරීමේ අරමුණින් පළාත් සභා සංචාරක අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ 2022 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.<br><br>ඒ අනුව මුල් අදියර වෙනුවෙන් ලද මුදලින් 2022 වසරේ ව්‍යාපෘතියෙන් කොටසක් නිමකළ අතර ඉතිරි වැඩ අවසන් කිරීම වෙනුවෙන් රේඛීය සංචාරක අමාත්‍යාංශය මගින් මෙම වසර තුළ අක්මුදල් ලබා දීමට නියමිත වේ. | |
| (ඕ) | දියතලාව, මහියංගනය හා වැලිමඩ රෝහල්වල ඖෂධ ගබඩාවල 2023 ඔක්තෝබර් 11 දිනට රු. 6,737,293 ක් | 2021 1.5.5(අ) (i) 2023 | කල් ඉකුත් වූ හා තත්ත්වයෙන් අසමත් ඖෂධ විධිමත් පරිදි බැහැර කිරීමට පියවර ගත | 2019, 2020, 2021 හා 2022 මුල දක්වා පැවති කොවිඩ් වසංගතය හමුවේ කොවිඩ් රෝගය | කල් ඉකුත් වීමට හේතු පරීක්ෂා කර අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| වටිනා කල් ඉකුත් වූ ඖෂධ, රු. 1,168,303 ක් වටිනා තත්ත්වයෙන් අසමත් වූ ඖෂධ ගබඩාවල රඳවා තබාගෙන තිබුණි. | 1.5.9 (අ) (i) | යුතු අතර ඖෂධ කල්ඉකුත් වීමට පෙර භාවිතයට ගැනීමට ක්‍රමවේදයක් සකස් කළ යුතුය. | සඳහා බොහෝ පිරිස් ප්‍රතිකාර ලැබුවද සාමාන්‍ය බාහිර රෝගී අංශය හා වෙනත් රෝග සඳහා වැයවන ඖෂධවල භාවිතා වීම අඩුවිය. මුළු දිවයින පුරා මෙම තත්ත්වය බලපාන අතර එම ඖෂධ භාවිතා කිරීමෙන් තොරව කල් ඉකුත් වීම සිදුවිය.<br>එසේම ඇතැම් ඖෂධ ජීවිතාරක්ෂක සේවාව සඳහා අතිශයින්ම අත්‍යවශ්‍ය වන අතර ඒවා කල් ඉකුත් වන දිනය තෙක් රෝහල තුළ රඳවා ගැනීමට සිදු වේ.<br>එසේම,<br>• Atrophin sulphate<br>• Aminophilin<br><br>වැනි ඖෂධ වෙනත් රෝහලක් තුළට යවා ඒ වෙනුවට අලුත් තොග ගෙන්වා ගන්නා අතර, මෙම ඖෂධ බොහෝමයක් ජීවිතාරක්ෂක ඖෂධ වේ.<br>තත්ත්වයෙන් අසමත් ලෙස හඳුනාගෙන වාර්තා කර ඇති ඖෂධ සම්බන්ධව නියමිත පරිදි කටයුතු කොට වෙන් කර තැබීමට පියවර ගෙන ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ක) | ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) යටතේ "තම ප්‍රදේශයේ පවත්නා කර්මාන්තවලට අදාළව ඒවායේ ඵලදායිතාවය ඉහළ නැංවිය හැකි නව ක්‍රම පිළිබඳව ගවේශනය කිරීම හා ඒ අනුව උචිත උපකරණ සකස් කිරීම තුළින් ප්‍රදේශයට මෙන්ම දළ දේශීය නිෂ්පාදිතය නගා සිටුවීමට දායක වීමට ශිෂ්‍ය අවධියේදීම ඉඩකඩ සැලසීම" අරමුණු කරගෙන මෙන්ම පාසල් සිසුන්ගේ නිර්මාණාත්මක කුසලතාව, තර්කානුකූල චින්තනය, සාමූහිකව ක්‍රියාකිරීම, මනෝ සංනිවේදනය හා අභියෝගවලට මුහුණදීමේ කුසලතාව වර්ධනය කිරීම අපේක්ෂා කර, පාසල් වෙත රු. 44,000,000 ක මූල්‍ය ප්‍රතිපාදන ලබාදී 2023 ජුලි 31 දින වන විට වසර 1 ½ ක් ගතවී තිබුණ ද, අපේක්ෂිත අරමුණු ඉටුකරගෙන නොතිබුණි. | 2023 **1.5.10 (අ) (ii)** | ව්‍යාපෘති අරමුණු අනුව ප්‍රතිපාදන උපයෝජනයට පියවර ගත යුතුය. | මේ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2023 දෙසැම්බර් 18 සහ 19 දෙදින විදුහල්පති හා නව නිපැයුම් විෂයභාර ගුරු භවතුන් සඳහා පවත්වන ලදී. එහි දී මො/කතරගම ජාතික පාසලේ සිසුන් විසින් ජලයේ පවතින ආක්‍රමණශීලි ශාක එකතු කිරීමේ උපකරණයක් සකස් කර ඇති බවත්, මො/මල්ලාත්තාවල ජාතික පාසලේ සිසුන් color light උපකරණයක් ද බ/ධර්මපාල විද්‍යාලයේ සිසුන් විසින් කෘෂි නිෂ්පාදන ආශ්‍රිත අත්හදා බැලීම් සිදුකරන බව සඳහන් කර ඇත. පාසල් සිසුන්ගේ කැමැත්ත පවතින්නේ රොබෝ තාක්ෂණය සහ නව පරිගණක තාක්ෂණය සඳහා වන අතර, ප්‍රාදේශීය ගැටළුවලට විසඳුම් සෙවීමට යොමු වීමට මැලිකමක් දක්වයි. ඒ අනුව එම රොබෝ තාක්ෂණය හා නව පරිගණක තාක්ෂණයට අදාළව නිර්මාණ සකස් කර ඇත. | ප්‍රතිපාදන ව්‍යාපෘති අරමුණු මත පදනම්ව පමණක් වියදම් දැරීමට පියවර ගෙන නොතිබුණි. |
| (ග) | ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් කලාප 06 ක් තුළ | 2023 1.5.10 | පළාත තුළ විධිමත් අයුරින් ගුරු තුලනයක් පවත්වා | සියලුම කලාප අධ්‍යාපන කාර්යාල විසින් වාර්ෂික ස්ථාන | නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග |

| | | | | | |
|---|---|---|---|---|---|
| | විධිමත් ගුරු තුලනයක් සිදු නොකිරීම හේතුවෙන් අනුමත ගුරු සංඛ්‍යාව ඉක්මවා ගුරුවරු පත්කර අතිරික්ත ගුරු කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම තුළ ග්‍රාමීය පාසල් 382 ක ගුරුවරු 2214 කගේ ඌනතාවයක් පැවැති අතර නාගරික පාසල් 165 ක ගුරුවරු 583 කගේ අතිරික්තයක් පැවතුණි. අතිරික්ත ගුරුවරුන් සඳහා 2022 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා වැටුප් වශයෙන් රු. 549,754,310 ක් ගෙවා තිබුණි. | (ඇ) **(i)** 2022 1.5.5 (ආ) | ගැනීමට කටයුතු කළ යුතුය. | මාරු ක්‍රියාත්මක කිරීම මේ වන විට සිදුකර ඇත. එමගින් ගුරු තුළනය කිරීමට කටයුතු කර ඇත. | ගනිමින් පවතී. |
| (ච) | බණ්ඩාරවෙල, වැලිමඩ අධ්‍යාපන කලාප 02 කට අයත් ඇතැම් පාසල්වල නියෝජ්‍ය සහ සහකාර විදුහල්පති තනතුරුවල ඌනතාවයන් පැවතියදී එම කලාපවලම ඇතැම් පාසල්වලට අනුමත සීමාව ඉක්මවා නියෝජ්‍ය සහ සහකාර විදුහල්පතිවරුන් 26 ක් පත්කර 2021 මැයි 01 සිට 2023 ඔක්තෝබර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ පමණක් වැටුප් වශයෙන් රු. 43,762,329 ක් ගෙවා තිබුණි. | 2023 1.5.10 (ඇ) **(ii)** | විධිමත් කාර්ය මණ්ඩල තුලනයක් තුළින් එම විදුහල්පතිවරුන් ගෙන් ඵලදායි සහ කාර්යක්ෂම සේවයක් ලබාගත හැකිවන පරිදි පුරප්පාඩු පවතින පාසල්වලට අනුයුක්ත කර සේවයේ යෙදවීමට කටයුතු කළ යුතුය. | පාසල්හි අනුමත සීමාව ඉක්මවා පත් කර ඇති නියෝජ්‍ය සහ සහකාර විදුහල්පතිවරුන් ස්ථාන මාරු කිරීමට මේ වන විට කටයුතු කර ඇති බව සඳහන් කරමි. | නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ජ) | විදුහල්පති තනතුරුවල රාජකාරි ආවරණය කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවා ගැනීම සම්බන්ධයෙන් වූ අංක අමප/12/1101/530/03 5 හා 2012 අගෝස්තු 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඌව පළාතෙහි අධ්‍යාපන කලාප 10 ට අයත් පාසල් 118 ක සේවයේ නියුක්තව සිටි ගුරුවරුන් 120 ක් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට පත්කර, තිබුණු අතර පත්වීමේ ලිපියේ කොන්දේසි අනුව වැටුප් ලබාගැනීමේ හිමිකම හැර වෙනත් කිසිදු හිමිකමක් නොලැබෙන බවට සඳහන් කර තිබියදී කොන්දේසියට අනුකූල නොවන පරිදි විදුහල්පතිවරුන් 110 කට 2013 වර්ෂයේ සිට 2023 ඔක්තෝබර් 31 දින දක්වා විදුහල්පති දීමනා වශයෙන් රු. 22,972,094 ක් ගෙවා තිබුණි. | 2023<br>1.5.10 (ඈ) (iii) | පත්වීම් ලිපි චක්‍රලේඛයට පසුව නිකුත් කර ඇති බැවින් පත්වීම් ලිපියේ කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. | අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/4/60/01/13 හා 2009 පෙබරවාරි 26 දිනැති ලිපිය මගින් විදුහල්පතිවරුන් සඳහා විශේෂ දීමනාවක් ලබාදීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදුකර ඇත. ඒ අනුව එදින සිට විදුහල්පතිවරුන් වශයෙන් සේවය කරන විදුහල්පති ශ්‍රේණිධාරීන් හා ශ්‍රේණිධාරීන් නොවන එහෙත් විදුහල්පති සේවයේ වැඩ බලන උප ගුරුවරුන් සඳහා මාසිකව ගෙවීම් සිදු කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/04/60/01/වී.දීමනා /2017 හා 2017 මාර්තු 14 දිනැති ලිපිය මගින් හා චක්‍රලේඛ අංක 16/2017 අනුව විදුහල්පතිවරුන් සඳහා ලබා දෙන විශේෂ දීමනාව සංශෝධනය කර ඇත. එම සංශෝධිත දීමනාව විදුහලිපතිවරුන් වශයෙන් සේවය කරන හා එම තනතුරු වල වැඩ බලන නිලධාරීන් සඳහා 2017 වර්ෂයේ මාර්තු මස සිට ගෙවීම් කර ඇත. ඌව පළාත් ආණ්ඩුකාර | වැඩිපුර ගෙවන ලද විදුහල්පති දීමනාව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ලේකම්ගේ අත්සනින් යුතුව ඌව පළාතේ ප්‍රධාන ලේකම් වෙත යොමු කර ඇති අංක 1/3/7-ix හා 2018 සැප්තැම්බර් 29 දිනැති ලිපිය මගින් ද වැඩබලන විදුහල්පතිවරුන් සඳහා විශේෂ දීමනාව ගෙවීමට අනුමැතිය ලබා දී ඇත.<br><br>ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් යුතුව සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත පිටපත් සහිතව ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කර ඇති අංක 9/ආ/8 හා 2018 ඔක්තෝබර් 03 දිනැති ලිපිය මගින් ද වැඩ බලන විදුහල්පතිවරුන් සඳහා විශේෂ දීමනාව ගෙවීමට අනුමැතිය ලබා දී ඇත. ඉහත සඳහන් චක්‍රලේඛ හා ලිපි පදනම් කරගෙන විදුහල්පතිවරුන් සඳහා විදුහල්පති දීමනාව ගෙවා ඇත. | |
| (ට) | ඌව පළාත තුළ රසායනාගාරයක් රහිත පාසල් 27 ක් සඳහා රසායනාගාර සහායක සේවකයින් 32 දෙනෙකුද, පුස්තකාලයක් රහිත | 2023 1.5.10 (ඇ) (iv) | රසායනාගාර සහායක සේවකයින් හා පුස්තකාල සහායක සේවකයින් එම පහසුකම් පවත්නා | රසායනාගාර සහායක සේවකයින් හා පුස්තකාල සහායක සේවකයින් රසායනාගාර සහ පුස්තකාල ක්‍රියාත්මක වන පාසල් වෙත | නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පාසල් 14 ක් සඳහා පුස්තකාල සහායක සේවකයින් 17 දෙනෙකු ද පත්කරමින් එකී සේවකයින් පත්කිරීමේ අරමුණු ඉටුකර නොගෙන නිශ්කාර්ය කාර්යය මණ්ඩලයක් පවත්වාගෙන යමින් 2022 ජනවාරි 01 සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ ඔවුන්ට වැටුප් වශයෙන් රු. 28,621,714ක් ගෙවා තිබුණි. | | පාසල් වල සේවය සඳහා යෙදවිය යුතුය. | යොමු කිරීමට කටයුතු කර ඇත. | |
| (ඩ) | ඉඩම් දීර්ඝ කාලීනව බදුදීම වෙනුවෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් වාණිජ පදනමින් බදුකර ලෙස ලබාදී තිබුණු දීර්ඝකාලීන බදු බලපත්‍ර 122 කට අයත් බදුකරුවන් 122 කගෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු. 139,242,705 ක හිඟ බදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | 2021,2022 හා 2023 1.5.14 (අ) | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | බදුකරුවන් 122 දෙදෙනෙකු සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් බදු ගෙවන ලෙසට දැන්වීම් කර ඇති අතර, බදු ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගැනීමට බලතල මෙම දෙපාර්තමේන්තුව සතුව නොමැති බැවින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරි පියවර ගැනීම සඳහා දන්වා යවා ඇත. | හිඟ මුදල් අයකර ගැනීමට ගතයුතු නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ත) | ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල වලින් බැහැරට ස්ථාන මාරුවී ගිය, නිලධාරීන්ගෙන් රු. 36,203,255 ක | 2023 1.5.19 **(ඇ)** | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | ණය ශේෂ අයකර ගැනීමට අන්තර් පළාත් සභා හා මධ්‍යම රජයේ ආයතන දැනුවත් කර සාකච්ඡා කර ඇති අතර එම ශේෂ ක්‍රමිකව | අයවිය යුතු මුදල් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ශේෂයක් හා මියගිය හා විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය වෙනත් නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 22,378,751 ක් වූ ණය ශේෂය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ විධිවිධාන සහ 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(අ)(ආ)(ඉ) විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | | | පියවෙමින් පවතී. එමෙන්ම පළාත් සභා නිලධාරීන් මාරු වී යන අවස්ථා වලදීම මුළු ණය ශේෂයම එකවර අයකර ගැනීමට කටයුතු කිරීමට සියලුම ආයතන වලට දන්වා ඇත. විශ්‍රාමික නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මාර්ගයෙන් පියවා ගැනීමට අදාළව කටයුතු සිදුකර ඇති නමුත් එම දෙපාර්තමේන්තුවේ පවතින ද්‍රවශීලතා ගැටළු නිසා ණය පියවීම ප්‍රමාද වී ඇත. මියගිය හා සේවය හැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ පියවා ගැනීමට අදාළ උපදෙස් අදාළ ආයතව වලට ලබාදී ඇත. | |
| (ද) | ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ කාර්යාල 07 කින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ රු. 31,104,029 ක් වූ ණය ශේෂය නිරවුල් කර නොතිබුණි. | 2023 1.5.19 (ඇ) (i) | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | වෙනත් පළාත් සභා මධ්‍යම රජය හා පළාත් පාලන ආයතන වලින් පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂයන් මේ තුළ අන්තර්ගත වේ. මෙම ශේෂයන් මේ වන විට ක්‍රමිකව නිරවුල් වෙමින් පවතී. | නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| (න) | ඌව පළාත් සභාවට අයත් ආයතන 04 ක් නමින් මෝටර් රථ ප්‍රවාහන | 2023 1.5.20(ඇ ) | අදාළ වාහන හා යතුරු පැදිවල භෞතික පැවැත්ම හෝ අපහරණය | 80- 9282 , 36-0136, 71-4458, 42-0319, 42-2182, 42-4236 හා GB 4823 දරන වාහන | මෙම වාහන සම්බන්ධව ගතයුතු ක්‍රියාමාර්ග |

| | | | |
|---|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වාහන 12 ක සහ යතුරුපැදි 04 ක භෞතික පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. | කිරීම් විස්තර සනාථ කිරීමට අදාළ සාක්ෂි විගණනයට වාර්තා කළ යුතුය. | ආදායම් බලපත්‍ර ලබාගෙන නොමැති හෙයින් මෙම වාහනය භාවිතයක් සිදුව නැති බවත් නිෂ්පාදන වර්ෂයන් අනුව මීට වසර 10 කට පෙර කාලය තුළ මෙම වාහනය අපහරණයන්ට යොමුවී තිබිය හැකි අතර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොරතුරු යාවත්කාලීන වී නොතිබිය හැකිය.<br><br>53-5063 දරන වාහන 53-5060 සිට 53-5080 දක්වා සියලුම වාහන පැවති ඇත්තේ පළාත් පාලන ආයතනවලට 1993 වර්ෂයන්හිදී සභාවන් වෙත ලබා දී ඇත. මෙම වාහනය හැරුණු විට අනෙකුත් සියලුම වාහන 2012 වර්ෂයේ සිට අවස්ථා කිහිපයකදී අපහරණය කර ඇත. පසුගිය කාල සීමාව තුළ පැවති යුදමය කටයුතු සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් පළාත් සභාවල පැවති මෙම වාහන යොදවා ගෙන ඇති අතර එම වාහන නැවත ලබා දීමේදී අබලන් තත්ත්වයෙන් පැවති බැවින් එම වාහන විකිණීමට කටයුතු කර ඇත. | ගෙන නොතිබුණි. |

මෙම වාහනයේ ලියාපදිංචි සහතිකය කාර්යාලයේ පැවතිය ද වාහනය නැවත භාර දීමක් සිදු කර නොමැත. එබැවින් එම කාලය තුළ වාහනය විනාශ වීමක් සිදු වී ඇතැයි නිරීක්ෂණය වේ.

GG- 3905, XZ-9423 හා XZ-9439 දරන වාහන ස්ථාවර වත්කම් පිළිබඳ දත්ත පරිගණක පද්ධතියට ඇතුළත් කිරීම සඳහා දැනුවත් කර ඇත.

HK-5808, RW 0501 හා SP 1349 දරන වාහන පැවරුම වෙනස් කිරීම සඳහා දැනුවත් කිරීමට සටහන් තබා ගෙන ඇත.

17-1012, 16-7667 වසර 10 කට පෙර කාලය තුළ මෙම වාහන අපහරණයට ලක්ව ඇති අතර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොරතුරු යාවත්කාලීන වී නොතිබිය හැකිය.

## 3.6 මධ්‍යම පළාත් සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය (ඌණතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 11,293,518,648 | 6,822,755,407 | 4,470,763,241 | (40,297,646,972) | තත්ත්වාගණනය කළ |
| **2022** | 9,257,890,058 | 7,664,707,228 | 1,593,182,829 | (45,730,819,954) | තත්ත්වාගණනය කළ |
| **2023** | 13,755,650,851 | 12,093,224,677 | 1,662,426,174 | (45,340,002,526) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | 2009 ජූනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 (i) සහ 2021 ඔක්තෝබර් 01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2021 (v) හි 07 ඡේදය පරිදි සේවකයන් සේවයට පැමිණීම හා පිටවීම, ලබාගත් නිවාඩු ආදිය පිළිබඳ ලිඛිත සනාථ කිරීම් නොමැතිව ආණ්ඩුකාරවරයාගේ පුද්ගලික කාර්ය මණ්ඩලයේ සේවකයන් 09 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ දී රු.1,990,147 ක වැටුප් හා වේතන ආණ්ඩුකාර ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි | 2021 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය | විගණනයෙන් පෙන්වාදීමෙන් පසුව පැමිණීම හා පිටවීම, ලබාගත් නිවාඩු ආදිය පිළිබඳව ලේඛන පවත්වාගෙන යනු ලබන අතර ඒ අනුව වැටුප් ගෙවනු ලබන බව දන්වා සිටිමි. | ගෙවීම් කරන ලද වැටුප් වලට අදාලව පැමිණීම, පිටවීම සහ නිවාඩු පිළිබඳ ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කර නොමැත. වර්තමානය වන විට පැමිණීමේ ලේඛණයක් නඩත්තු කරනු ලබන අතර ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා නොකෙරේ |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික 2022 සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ඡේදයේ 2.1 වගන්තිය හා ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/ 202හි XIII ඡේදය අනුව සත්‍ය වශයෙන්ම සේවයේ නිරතවී සිටින බව තහවුරු කර ගැනීමකින් තොරව, ආණ්ඩුකාරවරයා විසින් කාර්යාල පරිශ්‍රයෙන් බැහැර ද, ගාල්ල, කොළඹ, නුවරඑළිය වැනි මහනුවර නගරයෙන් දුර බැහැර ප්‍රදේශවල ආණ්ඩුකාරවරයා සමඟ සාකච්ඡා සඳහා ගමන් කළ බව දක්වමින්, ආණ්ඩුකාරවරයාගේ නිල රථවල හා ආරක්ෂක රථයේ රියදුරන් විසින් ඉදිරිපත් කර තිබුණු ධාවන සාරාංශ සඳහා නිසි අධීක්ෂණයකින් තොරව සාවද්‍ය ලෙස අතිකාල දීමනා සහ සංයුක්ත දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,206,215 ක් ආණ්ඩුකාරවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ රියදුරන් වෙත ගෙවා තිබුණි. | ආයතන සංග්‍රහය හා චක්‍රලේඛය ප්‍රකාර කටයුතු කළ යුතුය. | නිල රථයේ රියදුරු සහ ආරක්ෂක රථයේ රියදුරු ගරු ආණ්ඩුකාරතුමාගේ සැලසුම් කර ඇති රාජකාරි සහ හදිසියේ යෙදෙන රාජකාරි සඳහා සේවයේ යොදවා ඇති අතර, මොවුන්ගේ රාජකාරී ගරු ආණ්ඩුකාරතුමාගේ සම්බන්ධීකරණ ලේකම් විසින් නිර්දේශ කර ගෙවීම් කිරිම සඳහා ඉදිරිපත් කර ඇත .ගරු ආණ්ඩුකාරතුමා, කාර්යාල පරිශ්‍රයේ විවිධ නිල හමු හා සාකච්ඡා වලට සහභාගී වන ඇතැම් අවස්ථා වලදී විශේෂ කාර්යයන් සඳහා නිල රථය ගාල්ල, කොළඹ, නුවරඑළිය වැනි මහනුවර නගරයෙන් දුර බැහැර ප්‍රදේශ වලට යවන ලද අවස්ථාවන් පැවතුණ ද ඒවා ඉතා සීමිත බවත් මින් ඉදිරියට රියදුරන්ගේ අතිකාල දීමනා සහ ගමන් වියදම් ගෙවීමේදී විශේෂයෙන් අවධානය යොමු කරන ලෙසට ගරු ආණ්ඩුකාරතුමාගේ ලේකම්වරුන් දැනුවත් කර ඇති බවත් දන්වා සිටිමි. | සාවද්‍ය ලෙස ගෙවන ලද අතිකාල හා සංයුක්ත දීමනා, අදාළ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | 2018 ඔක්තෝබර් 12 දිනැති අංකසීඑස්/සීඑස්ජ්/11-18 දරන ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 7. 3 ඡේදයේ උපදෙස්වලට අනනුකූලව ආණ්ඩුකාරවරයා භාවිතා කරන නිල වාහන 02කට 2020 මැයි සිට 2022 අප්‍රේල් දක්වා මාස 24 ක කාල පරිච්ඡේදය සඳහා ඉන්ධන දීමනාවට අමතරව අතිරේක ඉන්ධන වශයෙන් ලීටර් 6720. 21 කට අදාළව රු.930,020 ක් ගෙවීම්කර තිබුණි. | 2022 2023 | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. | 2021 සැප්තැම්බර් 22 වන දින පවත්වන ලද ආණ්ඩුකාර සංසදයේ තීරණයට අනුව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමන් විසින් පළාතෙන් පිට රාජකාරි කටයුතු සඳහා ගමන් කිරීමේදී, ඒ සඳහා වැයවන අතිරේක ඉන්ධන ප්‍රමාණය ප්‍රතිපූරණය කිරීම සිදුකර ඇත. | චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි වැයකරන ලද රු.930,020 ක අතිරේක ඉන්ධන දීමනා අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොමැත. |
| (ඈ) | 2009 ජූනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 (i) සහ 2021 ඔක්තෝබර් 01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2021 (v) හි 07 ඡේදය පරිදි සේවකයන් සේවයට පැමිණීම හා පිටවීම, ලබාගත් නිවාඩු ආදිය පිළිබඳ ලිඛිත සනාථ කිරීම් නොමැතිව හා පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසු කළ යුතු කිසිඳු රාජකාරී කටයුත්තක් නොමැතිව තිබියදී මධ්‍යම පළාත් සභාවේ | 2021 | චක්‍රලේඛ ප්‍රකාරව පැමිණීම් පිටවීම් වාර්තා පවත්වා ගත යුතුය. | ඉකුත් වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂයේ ද පෞද්ගලික කාර්යමණ්ඩලයේ වැටුප් හා වේතන ගෙවීම් සිදු කර ඇත්තේ එක් එක් මාසය සඳහා පෞද්ගලික කාර්යමණ්ඩලයේ පැමිණීම පිළිබඳව ගරු සභාපතිතුමා ලබාදී ඇති සහතික අනුව වන අතර 2022 අගෝස්තු 01 සිට යාත්මක වන පරිදක්‍රි 18 වැනි පොදු ආකෘතිය අනුවපත්‍ර සභාපතිවරයාගේ පෞද්ගලික | ගෙවීම් කරන ලද වැටුප් වලට අදාලව පැමිණීම, පිටවීම සහ නිවාඩු පිළිබඳ ලිඛිත සනාථ කිරීම් ඉදිරිපත් කර නොමැත. වර්තමානය වන විට පැමිණීමේ ලේඛණයක් නඩත්තු කරනු ලබන අතර ඇගිළි සලකුණු යන්ත්‍රය භාවිතා නොකෙරේ. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සභාපතිවරයාගේ පෞද්ගලික කාර්යමණ්ඩලයේ සේවකයන් 13 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේ තුළ දී රු.7,260,274 ක වැටුප් හා වේතන ගෙවා තිබුණි. | | | කාර්යමණ්ඩලයේ පැමිණීම සහ පිටවීම වාර්තා කිරීමට පැමිණීමේ ලේඛනයක් පවත්වා ගැනීමට උපදෙස් ලබා දී ඇත . | |
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට පළාත් සභා ආදායම් ගිණුමේ විෂයයන් 04 කට අදාළව රු.135,833,299 ක හිඟ ආදායම් අය කර නොතිබුණි .ඉන් වර්ෂ 05කට වඩා වැඩි කාලයක සිට අයකර නොගත් හිඟ ආදායම රු.28,513,534 ක් විය . එය මුළු ආදායමින් සියයට 21ක් වී තිබුණි. | 2021 2023 | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | කඩිනමින් හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | 2024 ජූනි 30 දිනට හිඟ ඉඩම් බදු රු.93,068,441 ක්ද, හිඟ මුද්දර ගාස්තු, බණිජ බදු හා පිරිවැටුම් බදු රු.81,647,146 ක්ද අය කර නොමැත. |
| (ඊ) | මධ්‍යම පළාත් කලාපීය ආර්ථික සංවර්ධන ආයතනය, 2020 නොවැම්බර් 11 දිනැති පළාත් මුල්‍ය රීති 422 (ප්‍රසම්පාදන කමිටු සීමා සංශෝධන) සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 වගන්ති වලට පටහැනිව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අනුමත මිලදී ගැනීම් සීමාව ඉක්මවා 2021 වර්ෂයේදී රු.1,587,200 ක් සෘජු මිලදී ගැනීම් සිදු | 2021 2023 | මුල්‍ය රීති හා අදාළ ලිපියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. | 2021 වර්ෂයේදී පළාත් මුල්‍ය රීති 457 (අ) ප්‍රකාරව මධ්‍යම පළාත් විවිධ සේවා සමූපකාර සමිතියෙන් වියළි ආහාර ද්‍රව්‍ය මිලදී ගත් අතර 2023 වර්ෂයේදී රජයේ අනුබද්ධ ආයතන 02 ක් වන සතොස සහ සි/ස විවිධ සේවා සමුපකාර සමිති සංගමය වෙතින් මිල ගනන් කැඳවා අදාළ මිලදී ගැනීම් සිදු කරන ලදි. | පළාත් මුල්‍ය රීති හා ප්‍රසම්පාදන මාර්ගොපදේශ වලට අනුකූල නොවන පරිදි මිලදීගැනීම් සිදුකර තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කර තිබුණු අතර 2023 වර්ෂයේ ප්‍රසම්පාදනයේදී ආයතන 05 කට නොඅඩු සංඛ්‍යාවකින් මිල ගනන් කැඳවිය යුතු වුවත්, ආයතන 02 කින් ඉතාම සීමිත මිල ගනන් කැඳවා රු.1,339,380 ක මිලදීගැනීම් සිදුකර තිබුණි. | | | | |
| (උ) | 2013 සිට 2022 දක්වා කාල පරිච්ඡේදය තුළ පළාත් පාලන ආයතන 06 කට අදාළව නිකුත් කර තිබුණු එකතුව රු.9,704,687 ක් වූ විගණන අධිභාර 15 ක් අයකිරීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට 2023 වර්ෂය අවසාන දින වන විටත් පළාත් පාලන දෙපාර්තමේනතුව කටයුතු කර නොතිබුණි. | 2021 2022 2023 | අධිභාර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අයකිරීම් ප්‍රගතිය අනුව තවදුරටත් අයකිරීමට ඇති මුදල රු.9,704,687.32 කි. | අධිභාර මුදල් අදාළ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හගුරන්කෙත කලාප අධ්‍යාපන කාර්යාලයේ වැටුප් ගෙවීමේදී සිදුවී තිබුණු රු.14,239,938 ක මූල්‍ය අක්‍රමිකතාවයට අදාලව රු.3,816,590 ක මුදලක් 2022 දෙසැම්බර් 31 වනවිට තවදුරටත් අයවිය යුතුව පැවතුණි. 2023 දෙසැම්බර් 31 දින | 2021 2022 2023 | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. | ගුරු සේවයේ නිලධාරින් දෙදෙනා හා පාසල් කම්කරු වෙත විධිමත් පරිදි චෝදනා පත්‍ර භාරදී විනය පරීක්ෂණ සඳහා විනිශ්චය සභා පත්කර ඇති අතර ලිපි ලේඛන වල පවතින අඩුපාඩු හේතුවෙන් පරීක්ෂණ කටයුතු ප්‍රමාද වී ඇත. අධීක්ෂණ මට්ටමේ නිලධාරින් 07 දෙනා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II | වගකිවයුත්තන්ගෙන් තවදුරටත් අයකර ගැනීමට තිබූ රු.3,789,300.84 මුදලින් මේ වන විට මියගොස් ඇති සේවකයකුගෙන් රු.767,215.75 ක මුදලක් තවදුරටත් අයවීමට ඇත. එම ණය ගෙවීම |

| | | | | |
|---|---|---|---|---|
| | වනවිටත් අදාල නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II බාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදය අනුව විනයානුකූලව කටයුතු කර නොතිබුණි. | | වැනි බාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 25 වගන්තිය අනුව, එක් අයෙකුට 2023 නොවැම්බර් 07 දිනැති ලිපිය මඟින් තරයේ අවවාද කර තිදෙනෙකුට 2023 ඔක්තෝබර් 16 දිනැති ලිපි මඟින් ලඝු විනය යටතේ දඬුවම් ලබා දී ඇත. | සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සඳහා උපදෙස් ලබා ගැනීමට ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. ආයතන සංග්‍රහයේ II බාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 25 වගන්තිය ප්‍රකාරව නිලධාරීන් තිදෙනෙකුට ලඝු විනය යටතේ දඬුවම් ලබාදී ඇති අතර එක් නිලධාරියකු හට තරයේ අවවාද කිරීමක් සිදු කර ඇත. ලිපි ලේඛණ වල පවතින අඩුපාඩු හේතුවෙන් තිදෙනෙකු සම්බන්ධයෙන් විනය පරීක්ෂණ සිදු කිරීමේ ප්‍රමාදයක් සිදු වී ඇත. |
| (එ) | මුල්‍ය රිති 179.1 අනුව 2023 චෙක්පතක් මුදල්කර අදාළ ආදායකයා වෙත සෘජුවම ගෙවීමේ හැකියාවක් තිබියදී පළාත් අධ්‍යාපන | මුල්‍ය රීති ප්‍රකාර කටයුතු කළ යුතුය. | 104(4) පරීක්ෂණය සිදුකරමින් පවතී. ඉදිරියේ දී විගණනයට වාර්තා කරන බව. | මේ සම්බන්ධයෙන් මු.රෙ 104(4) ප්‍රකාරව පරීක්ෂණයක් සිදුකර එකී |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ ගලේවෙල මධ්‍ය මහා විදුහලේ විදුහල්පතිවරයා විසින් 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා දිවා මුරකරු, රාත්‍රී මුරකරු හා සනීපාරක්ෂක කම්කරු යන තනතුරු දරන පුද්ගලයන් තිදෙනාට අදාළ මුළු වේතනය වූ රු.1,843,850 ක් අවස්ථා 23 කදී පාසලේ දිවා මුරකරුගේ නමින් පාසල් සංවර්ධන ගිණුමෙන් චෙක්පත් ලියා ගෙවීම් කර තිබුණි. | | | | වාර්තාව අනුමැතිය සඳහා ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. |
| (ඒ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXX පරිච්ඡේදයේ 1.4 වගන්තිය අනුව අනුමැතිය ලබාගැනීමකින් තොරව මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන් 12 දෙනෙකු 2019 වර්ෂයේ සිට 2023 ජනවාරි දක්වා කාලය තුළ සී/ස මධ්‍යම පළාත් අධ්‍යාපන සේවා සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට තම රාජකාරි කාලය තුළ සහභාගීවී එකතුව රු.3,674,354 ක දීමනා | 2023 | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. | සිදුකරනු ලබන පරීක්ෂණ අවසන් වූ වහාම ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව | එක් නිලධාරියකුගෙන් රු.219,000 ක මුදලක් අධිභාර කර ඇති අතර ඉතිරි නිලධාරීන් 11 දෙනා සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු අවසන් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාගෙන තිබුණි. | | | |
| (ඔ) | මධ්‍යම පළාත් 2023 අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගම්පොල සහ හැටන් කලාපවලට අයත් පාසල්වල සේවය කල ගුරුභවතුන් සහ අනෙකුත් සේවකයන් 27 දෙනෙකු විදේශ නිවාඩු ලබා විදේශගතව හා ධූරය හැරගොස් තිබුණද එම නිලධාරීන් හට රු.854,912 ක වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවූ වැටුප් ඊට අදාළ වගකිව යුතු පාර්ශවයෙන් අයකර ගත යුතුය. | මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව | නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු.89,443 ක මුදලක් පමණක් අයකර ගැනීමට කටයුතු කර තිබුණි. |
| (ඕ) | මධ්‍යම පළාත් 2023 අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගලේවෙල මධ්‍ය මහා විද්‍යාලයේ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 02 ක දී පෞද්ගලික ආයතනයකින් ගොඩනැගිලි ද්‍රව්‍ය මිලදී ගැනිම වෙනුවෙන් ගෙවීම් ලෙස දක්වා ව්‍යාජ බිල්පත් සකස් කර පාසල් සංවර්ධන අරමුදලින් එකතුව රු.710,533 ක චෙක්පත් 07 ක් විද්‍යාලයේ එවකට විදුහල්පතිවරයාගේ හා ඔහුගේ භාර්යාවගේ බැංකු ගිණුම් වලට බැර කරගෙන අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි. | මූල්‍ය අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු පරීක්ෂණ සිදු කිරීමෙන් අදාළ නෛතික ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් 104(4) පරීක්ෂණයක් පැවැත්වේ. ඒ අනුව කටයුතු කර විගණනයට වාර්තා කරන බව. | මු.රෙ 104(4) පරීක්ෂණ වාර්තාව ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ක) | මධ්‍යම පළාත් 2023 අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මහ/ශාන්ත අන්තෝනි බාලිකා විදුහලේ හිටපු විදුහල්පතිනිය පාසලට අයත් වෑන් රථය භාවිතා කර 2018 ජනවාරි 15 දින සිට 2023 ජූනි 16 දින දක්වා පාසලට ඒමට සහ යාමට දිනකට ගමන් වාර 04 බැගින් එක් දිනකට කි.මී.112 බැගින් ගමන් කිරීම සඳහා පාසල් සංවර්ධන සමිතිය මඟින් අනුමැතියකින් තොරව එකතුව රු.1,283,037 කට ආසන්න මුදලක් ඉන්ධන සඳහා වැය කර තිබුණි. | මූල්‍ය රීති ප්‍රකාරව සහ ආයතන සංග්‍රහයේ පවතින විධිවිධාන ප්‍රකාරව අක්‍රමිකතා සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | මූ.රෙ. 104(3) පරීක්ෂණයක් පැවැත්වේ. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | මේ සම්බන්ධයෙන් මූ.රෙ.104(3) ප්‍රකාරව සිදුකළ පරීක්ෂණය අනුව මූ.රෙ.104(4) පරීක්ෂණයක් සිදු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත. ඒ අනුව මූ.රෙ.104(4) පරීක්ෂණය සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇත. |
| (ග) | මධ්‍යම පළාත් 2023 අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 2018 සිට 2022 දක්වා කාලපරිච්ඡේදය තුළ අ.පො.ස(සා.පෙළ) විභාගයට පෙනී සිටි මධ්‍යම පළාතේ සිසුන්ගේ ප්‍රතිඵල අනුව දීපව්‍යාප්ත පළාත් කුසලතා මට්ටම 5 ත් 8ත් අතර ස්ථානයකට පත්ව තිබුණි. තවද එම ප්‍රතිඵලවලට අනුව මධ්‍යම පළාතේ කලාප 15 න් කලාප 10 ක ප්‍රතිඵල දීපව්‍යාප්ත කලාප මට්ටම අනුව 50 වැනි ස්ථානයෙන් ඉහල අගයන් ගෙන තිබුණි. | සිසුන්ගේ ප්‍රතිඵල ඉහළ නැන්වීමට කටයුතු කළ යුතුය. | මධ්‍යම පළාත ලබාගෙන ඇති සියයට 72.73 ක ප්‍රතිඵල මට්ටම පහළ අගයක් නොවන බව දන්වමි. 50 වන ස්ථානය පිළිගනිමි. අසමත්වීමේ මට්ටමේ සිටින සිසුන් සමත් කිරීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සමඟ ගිවිසුම් ගත විය. | ඉදිරි විභාගයන්වල ප්‍රතිඵල වර්ධනය කර ගැනීමට සහ දීප ව්‍යාප්ත කුසලතා මට්ටම ඉහළ නංවා ගැනීමට අවධානය යොමු කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ච) | මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ 2018 සිට 2022 දක්වා කාලපරිච්ඡේදය තුළ පවත්වන ලද පහ වසර ශිෂ්‍යත්ව විභාගයට මධ්‍යම පළාතේ පෙනී සිටි සිසුන්ගෙන් ලකුණු 70 ඉක්මවා ලබාගැනීමේ ප්‍රතිශතය අනුව මධ්‍යම පළාත දීපව්‍යාප්ත කුසලතා මට්ටමේ හත්වන හා අටවන ස්ථානවලට පත්ව තිබුණි. එසේම එම ප්‍රතිඵලවලට අනුව මධ්‍යම පළාතේ කලාප 15 න් කලාප 11 කම ප්‍රතිඵල දීපව්‍යාප්ත කලාප මට්ටම අනුව 50 වන ස්ථානය ඉක්මවා තිබුණි. | 2021 2023 | දීප ව්‍යාප්ත කුසලතා මට්ටම සහ කලාප මට්ටම ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. | ලකුණු 70 ට අඩුවීමේ ප්‍රතිශතය වාර්ෂික සියයට 19 ක් 25 ත් අතර වේ. මෙම ප්‍රතිශතය අඩුකර ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් වාර්ෂිකව සංවිධානය කරනු ලැබේ. ජාතික මට්ටම හා සසඳන කළ 2.1 ක සුළු ප්‍රමාණයක් වන අතර එය කැපී පෙනෙන අඩුවීමක් ලෙස සැලකිය නොහැක. | ඉදිරි විභාගයන්වල ප්‍රතිඵල වර්ධනය කර ගැනීමට සහ දීප ව්‍යාප්ත කුසලතා මට්ටම ඉහළ නංවා ගැනීමට අවධානය යොමු කර ඇත. |
| (ජ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 ක තෝරාගත් පාසල් 50 ක පාසල් ඉඩම් අත්පත්කර ගැනිමේ අරමුණින් 2010 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ එකතුව රු.64,263,189 ක් පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ප්‍රතිපාදන වෙන්කර වර්ෂ 01 සිට 13 දක්වා කාලයක් ගතවී තිබුණද එම ඉඩම් අත්පත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | 2021 2023 | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු විධිමත්ව සිදුකරවා ගැනීම සඳහා කටයුතු කළ යුතුවේ. | පාසල් 42 ක ඉඩම් පවරා ගැනීම් කටයුතු සිදුවෙමින් පවතී. | පාසල් 42 ක පාසල් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් වී නොමැති අතර පාසල් වල ඉඩම් ආරවුල් පවතින බැවින් පාසල් 08 ක පවතින ගැටළු හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් තැන්පත් කරන ලද මුදල් ආපසු දෙපාර්තමේන්තු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | ව වෙත යොමු කර ඇත. |
| (ට) | පළාත් ඉඩම් දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබන ඉඩම් බදු ආදායම් වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 36 කින් එකතුව රු.68,561,923 ක ඉඩම් බදු බදුකරුවන්ගෙන් අයකර නොතිබුණි. | 2022 2023 | හිඟ බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉඩම් බදු හිඟ ආදායම් අයකර ගැනීම ප්‍රාදේශීය ලේකම් සිදුකරනු ලබන බවත් ඒ පිළිබඳ පසුවිපරම් කිරීමේ ක්‍රියාවලියක් සිදුකරන බව | හිඟ බදු අයකර ගැනීම පිළිබඳ තොරතුරු, විධිමත්ව දෙපාර්තමේන්තුව සතුව නොමැත |
| (ඩ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 ක පිහිටි ජල විදුලි බලාගාර 03 ක් වර්ෂ 03 සිට වර්ෂ 20 දක්වා කාලසීමාවක සිට විදුලිය නිෂ්පාදනය කර ජාතික පද්ධතියට විදුලිය මුදාහැර ඇතත් එම බලාගාර සඳහා සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ජල හැරවුම් අවසර පත් නිකුත් කර බදු අයකිරීමට කටයුතු නොකිරීමෙන් රු.4,668,164 ක බදු ආදායමක් පළාත් ඉඩම් දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි. | 2023 | බදු අවසරපත් විධිමත්ව නිකුත් කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | බදු අයකර නොමැත. | බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ත) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සංවර්ධන අරමුදලින් සමිති 09 ක් සඳහා වර්ෂ 1991 | 2021 2022 | කඩිනමින් හිඟ ණය වාරික අය කර ගැනීමට කටයුතු කළ යුතුය. | සමුපකාර සමිති 02 ක් සඳහා අධිහාර නියෝග නිකුත් කර අධිකරණ කටයුතු සඳහා භාර දී ඇති | 2024 සැප්තැම්බර් 30 දින වන විට ඉහත සමිති 09 න් සමිති 05 ක |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සිට 2016 දක්වා කාලය තුළ ලබාදී තිබුණු රු.3,695,813 ක ණය මුදලින්, 2022 වර්ෂය අවසන් දින වන විට වසර 06 සිට වසර 31 ක කාලයක් ගතවී තිබුණු රු.2,972,188 ක ණය ශේෂ අය කරගෙන නොතිබුණි. | | | බවත්, තවත් සමිති 02 ක් මාසිකව රු.10,000 හා රු.5,000 බැගින් ණය වාරික ගෙවනු ලබන බවත්, තවත් සමිතියක් උසාවි දඩ මුදල් මගින් ඉදිරියේදී ණය වාරික අයකර ගැනීමට කටයුතු කරන බව. | රු.1,306,950 ක ණය ශේෂ තවදුරටත් අය කර ගැනීමට ඇත. |
| (ද) | 2016 සිට 2021 දක්වා කාලසීමාව තුළ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වැටුප් සැකසීමේදී වැටුප් රාජකාරී ඉටු කළ නිලධාරීන් දෙදෙනෙකු විසින් ඔවුන්ගේ හා සමීපතමයින්ගේ පෞද්ගලික බැංකු ගිණුම් 14 කට රු.51,961,088 ක් සහ බැංකු ගිණුම් අංක මඟින් තහවුරු නොවන රු.1.077,550 ක් වශයෙන් එකතුව රු.53,038,638 ක මුදලක් සාවද්‍ය ලෙස ප්‍රේෂණය කර තිබුණි . මෙම සිදුවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා අදාළ වගකිවයුතු පාර්ශව හඳුනාගෙන වංචා කළ මුදල් අය කර ගැනීමට හා වගකිවයුතු | 2021 2022 | සිදුවී ඇති සම්පූර්ණ අලාභය අයකර ගැනීමටත් වංචා කළ අයට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමත් සිදුකළ යුතුය. | මහනුවර නියෝජ්‍ය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ වැටුප් වංචාව සම්බන්ධයෙන් මේ වන විට වැටුප් කට්ටල රාජකාරි කළ නිලධාරින් දෙනෙකුගේ සේවය අත්හිටුවා ඇතමේ සම්බන්ධව නෛතික. කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන අතර, මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මු.රෙ. 104(4) ප්‍රකාරව කටයුතු සිදුකර ඇති බව දන්වා සිටිමි. මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ විගණන අංශය මඟින් සිදු කරන ලද හදිසි පරීක්ෂාවට අනුව අනාවරණය වී ඇති මුදල නොපමාව ගෙවීමට කටයුතු කරන ලෙසට අදාළ නිලධාරින්ට 2022 ජනවාරි 05 දින හා 2022 ජනවාරි 10 දින | සිවිල් නඩුවක් ගොනු කර වගකිවයුතු අයගෙන් අලාභය අය කර ගැනීමට නීතිමය කටයුතු සිදු කර දෙන ලෙස මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් 2024 ජුනි 05 දිනැති ලිපිය මගින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර ඇත. මේ වන විට අදාළ වගකිවයුතු පාර්ශවයන්ගෙන් රු.3,920,781 අයකරගෙන ඇත. රු. 50,442,089 ක මුදලක් තවදුරටත් අයවිය යුතුව ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පාර්ශව හඳුනාගෙන ඔවුනට එරෙහිව විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීමට අදාළ බලධාරීන් කටයුතු කර නොතිබුණි | | | ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ ලිපි වලට ප්‍රතිචාර වශයෙන් එක් නිලධාරිනියක පමණක් රු.200,000 ක මුදලක් මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ ගිණුමට බැර කර ඇත. | |
| (න) | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක මහනුවර වෛද්‍ය සැපයුම් අංශය, මහනුවර ළය රෝහල, මාතලේ මහ රෝහල හා ප්‍රාදේශීය රෝහල් 03 ක 2021 හා 2023 වර්ෂවලදී එකතුව රු.18,665,522 ක ඖෂධ කල් ඉකුත් වී තිබුණු අතර ඉන් ඇතැම් ඖෂධ කල් ඉකුත් වී මාස 03 සිට වසර 14 ක කාල පරාසයක් ගතව තිබුණි. ගලගෙදර ප්‍රාදේශීය රෝහලේ රු.398,280 ක තත්ත්වයෙන් අසමත් ඖෂධ ඒකක 72206 ක් පැවතුණි. | 2021 2023 | ඖෂධ කල් ඉකුත් වීම සහ තත්ත්වයෙන් අසමත්වීම් වලින් බැහැරවීම සඳහා ඖෂධ විධිමත්ව බෙදාහැරීම් සහ තොග ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමේ ක්‍රියාවලියකට ලක් කිරීම. | කල් ඉකුත් වූ ඖෂධ සම්බන්ධයෙන් වෛද්‍ය සැපයුම් ඒකකය මැදිහත් වී අපහරණය කිරීමට කටයුතු කරමින් පවතී. | කල් ඉකුත් වු ඖෂධ හා කල් ඉකුත් වීමට ආසන්න වු ඖෂධ සම්බන්ධයෙන් සියළුම රෝහල් සම්බන්ධ වු ඖෂධ කළමනාකරණ තොරතුරු පද්ධතිය මගින් ඖෂධ ඇති ආයතනවලින් ඖෂධ නොමැති ආයතන සඳහා හුවමාරු කර ගැනීමට අවධානය යොමු කර ඇත. |
| (ප) | 2018 නොවැම්බර් 19 දින අනතුරට පත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ තෙල්දෙණිය මූලික රෝහලට අනුයුක්ත ගිලන් රථය සම්බන්ධයෙන් පොලිස් | 2021 | මූ.රෙ. පරීක්ෂණ සඳහා පොලිස් වාර්තාව හා මෝටර් රථ පරීක්ෂක ගේ වාර්තාවන් සැලකිල්ලට ගත යුතුය. | තෙල්දෙනිය දිස්ත්‍රික් මූලික රෝහලට අයත් WP LW – 1134 අංක දරණ ගිලන් රථය 2018 නොවැම්බර් 19 දින අනතුරට ලක් වීමට අදාළව සිදුවූ රු.5,727,869 ක | පොදු 284 වාර්තාවේ ඇතුළත් වටිනාකම සහ අළුත්වැඩියා වියදම අතර පවතින වෙනසට හේතු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වාර්තාව හා මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාව අනුව රථයේ යාන්ත්‍රික දෝෂයක් නොමැතිව රියදුරුගේ අධික වේගය හේතුවෙන් රථය පාලනය කර ගැනීමට නොහැකි වීම නිසා මෙම අනතුර සිදුව ඇති බව දක්වා තිබියදී එම වාර්තා නොසලකා අදාළ අනතුරින් රජයට වූ අලාභය රු.7,409,132 ක මුදල මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ වාර්තාව මඟින් පොතෙන් කපා හැරීමට අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ කර ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2020 අගෝස්තු 13 දින අනුමත කර අලාභය කපාහැරීමට කටයුතු කර තිබුණි. | | | අලාභය මෙම ගිලන් රථය පැදවූ රියදුරුගේ ප්‍රමාද දෝෂයක්, නොසැලකිල්ලක්, හෝ අපරීක්ෂාකාරී රිය ධාවනයක් නිසා සිදුවූ අනතුරක් බව වාර්ථා නිර්දේශ කර 2022 ඔක්තෝබර් 20 දිනැති ලිපිය මගින්අනුමැතිය සඳහා මධ්‍යම පළාත් සෞඛ්‍ය ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. | මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් විමසා ඇත. |
| (බ) | 2021 හා 2022 වර්ෂවලදී පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කළ ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ අරමුණට පටහැනි කාර්යයන් 33 ක් වෙනුවෙන් රු.64,787,183 ක් වැය කර තිබුණි. | 2021 2022 | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ අරමුණ ඉටු වන අයුරින් ප්‍රතිපාදන යෙදවිය යුතුය. | ම.ප.සෞ.දෙපාර්තමේන්තුවේ ආයතන (දිගන පුනරුත්ථාපන රෝහල) සඳහා ගෘහ භාණ්ඩ මිල දී ගැනීම හා දිගන රෝහලට කෑම මේසයක් හා පුටු 06ක් මිල දී ගැනීම, කඩුගන්නාව ප්‍රාදේශීය සෞඛ්‍ය පුහුණු මධ්‍යස්ථානයේ අළුත්වැඩියා කටයුතු හා උපකරණ මිල දී ගැනීම, නුවරඑළිය ප්‍රා.සේ.සේ.අ. කාර්යාලයේ | ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන අයුරින් ප්‍රතිපාදන යොදවාගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ශ්‍රවනාගාරය අළුත්වැඩියා කිරීම, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය අළුත්වැඩියා කිරීම හා උපකරණ මිල දී ගැනීම, මහනුවර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය අළුත්වැඩියා කිරීම, රිකිල්ලගස්කඩ මූලික රෝහලේ විශේෂඥ වෛද්‍ය නිල නිවස අළුත්වැඩියා කිරීම, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලවල පුහුණු වැඩසටහන් හා 2021 ඇසළ පෙරහැර ස්වේච්ඡා සේවක අවසරපත්/ පොත් පිටකවර මුද්‍රණය කිරීම යන කරුණු සඳහා වියදම් දරා ඇත. ඉහත සඳහන් මෙම වියදම් මහජනතාවට අත්‍යවශ්‍ය, ප්‍රාථමික සෞඛ්‍යයට අදාළ ප්‍රථමාධාර හා රෝග පාලන කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍යවන පහසුකම් සපයා ගැනීම සඳහා වන බැවින් මෙය අරමුණට පටහැනි ක්‍රියාවක් නොවන බව දන්වා සිටිමි. | |
| (ම) | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මහනුවර දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා | 2021 2022 2023 | අධිහාර කළ යුතු මුදල් අයකර ගැනීමටත් අදාළ නිලධාරින් | නිලධරින් 08 දෙනෙකුගෙන් තවදුරටත් අධිහාර කළයුතු මුදල | නිලධරින් 06 දෙනෙකුගෙන් තවදුරටත් රු.1,464,072 ක් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යක්ෂක කාර්යාලය මඟින් සෞඛ්‍ය උපකරණවල තීන්ත ආලේප කිරීම වෙනුවෙන් සාවද්‍ය ලෙස ගෙවා තිබුණු රු.3,114,905 ක මුදල 2019 මැයි 09 දින මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් විසින් අදාළ වගකිව යුතු නිලධාරීන් 14 දෙනෙකුගෙන් අය කර ගැනීමට නිර්දේශ කර තිබුණද ඉන් නිලධාරීන් 08 දෙනෙකුගෙන් එකතුව රු.1,618,191 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අයකරගෙන නොතිබුණි. | | සම්බන්ධව විනයානුකූල ක්‍රියා මාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. | රු.1,594,455කි. | අයකර ගැනීමට ඇති අතර අදාළ නිලධාරීන් සම්බන්ධව විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ය) | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන රෝහල්වල 2022 හා 2023 වර්ෂවල ඒකතුව රු.6,075,049 ක ඖෂධ ඌණතාවයක් පැවතුණි. | 2022 2023 | ඌණතාවය සම්බන්ධයෙන් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වාර්තාවන ඌණතා සම්බන්ධයෙන් ඉදිරියේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව. | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර නොමැත. |
| (ර) | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ තෙල්දෙණිය මූලික රෝහලේ සේවය කළ වෛද්‍ය නිලධාරිවරයෙකු 2016 මැයි 02 සිට 2021 මැයි 01 දින දක්වා කාලය තුළ වැටුප් රහිත නිවාඩු අනුමත කරගෙන විදේශගතවී තිබුණු නමුත් 2023 ඔක්තෝබර් වන විටද | 2023 | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය | ආපසු ගෙවීමට අදාළ නිලධාරියා දැනුවත් කර ඇත. ගෙවීම් පැහැරහරින්නේ නම් නීත්‍යානුකූලව කටයුතු කරන බව. | ගිවිසුම ප්‍රකාරව ගෙවිය යුතු රු.1,175,220 ක මුදල ගෙවීමට කටයුතු කරන ලෙස නිලධාරියාගේ විදේශ හා දේශීය ලිපින වෙත දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සේවයට වාර්තා කර නොතිබුණු බැවින් ගිවිසුම් ප්‍රකාරව අය කරගත යුතු රු.1,175,222 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | | |
| (ල) | ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් 2014 හා 2015 වර්ෂවල දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කම්කරුවන් ලෙස සේවය කළ සේවකයින් 26 දෙනෙකු උපස්ථායක තනතුරේ iii ශ්‍රේණියට පත් කිරීමේදී ආයතන සංග්‍රහයේ vii පරිච්ඡේදයේ 05.03.01 වගන්තියට අනුකූල නොවන පරිදි, උපස්ථායක තනතුරේ ii ශ්‍රේණියේ ආරම්භක වැටුපේ පිහිටුවීම නිසා වැටුප් වර්ධක 10ක ප්‍රමාණයක් ඉදිරියෙන් වැටුප පිහිටුවා තිබීම හේතුවෙන්, 2014 සිට 2023 දක්වා වූ වසර 10 ක කාලයක් සඳහා අතිකාල දීමනා හා වෙනත් දීමනා හැර නිලධාරීන් 26 දෙනෙකුට රු.4,259,877 ක වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. | 2023 | වැඩියෙන් ගෙවූ වැටුප් අයකර ගත යුතුය. | නිවැරදි වැටුපෙහි පිහිටුවා එවකට සිදුකර ඇති වැටුප් පරිවර්ථන සංශෝධනය කරන ලදි. වැඩිපුර ගෙවීම් වාරික මගින් අය කිරීමට කටයුතු කරන බව. | වැඩිපුර ගෙවා ඇති මුදල වාරික වශයෙන් අය කර ගැනීමට අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර ඇති අතර පළමු වාරික මුදල ලෙස 2024 සැප්තැම්බර් මස වැටුපෙන් රු.93,133 ක් හා විශ්‍රාම පාරිතෝෂිතයෙන් රු.240,760 ක් අයකරගෙන ඇත. ඒ අනුව රු.3,925,984 ක් තවදුරටත් අයකර ගැනීමට ඇත. |
| (ව) | මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්ක වල පිහිටි මගී ප්‍රවාහන | 2022 | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | කඩ කාමර බදුකරුවන් වෙත හිඟ මුදල් ගෙවන ලෙස | කඩකාමර බදු කරුවන් වෙතින් තවදුරටත් අය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සේවා අධිකාරියට අයත් කඩ කාමර 219 කින් කඩකාමර 196 ක් සඳහා 2001 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අදාළව අයවිය යුතු හිඟ කඩ කාමර කුලිය රු.15,565,370 ක් වූ අතර විගණන දින වන විටත් එම මුදල අයකරගෙන නොතිබුණි. ඉන් කඩ කාමර 13 ක් සඳහා ගිවිසුම්වලට ද එළඹී නොතිබුණි. | | | දැනුවත් කර ඇති අතර, ගිවිසුම්වලට එළඹ නොතිබු කඩකාමර 13 න් කඩකාමර 03 ක පමණක් නව ගිවිසුම් වලට එළඹ ඇත. කඩකාමර 02 ක් සඳහා නඩු කටයුතු පවතින අතර ඉතිරි කඩකාමර 08 සඳහා ගිවිසුම් ගත වී නොමැත. ගිවිසුම් සම්බන්ධයෙන් නව ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර ඇත. | විය යුතු මුදල රු.13,137,781 ක් විය. |
| (ස) | මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතියෙහි මූලික අධියර අවසන් වී 2021 දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබුණු රු.24,228,128 ක ව්‍යාපෘති මුදල් උපයෝගී කර ගෙන මගී ප්‍රවාහන සේවා අධිකාරියෙහි සමස්ථ කාර්යය මණ්ඩලයයෙන් සියයට 71 ක ප්‍රතිශතයකට KMTT දීමනාව වශයෙන් අමතර දීමනාවක් ගෙවා තිබුණි. | 2022 | ගිවිසුම් ප්‍රකාරව කාර්ය මණ්ඩල දීමනා ගෙවිය යුතුය. | මහනුවර බහුවිධ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියෙහි මහනුවර බස්රථ පාලන වැඩසටහනට අදාල මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරිය සමග ඇතිකරගෙන තිබූ ගිවිසුම 2021.12.31 දිනෙන් අවසන් විය. 2022 වර්ෂය සඳහා නව ගිවිසුමකට එළඹීමට මහනුවර බහුවිධ සංවර්ධන ව්‍යාපෘති ආයතනයද 2021.12.31 දිනෙන් අවසන් වී තිබූ බැවින් නව ගිවිසුම්ගත වීමක් සිදු වී නොමැත. මෙම ව්‍යාපෘතියේ මූලික අදියරෙහි ගිවිසුම් ප්‍රකාරව කාර්ය මණ්ඩල දීමනා 2022 වර්ෂයේ සේවක දිරිගැන්වීමේ දීමනා | 2021 වර්ෂය තුලදී ව්‍යාපෘතිය හරහා වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමේදී සත්‍ය වශයෙන් දරනු ලැබූ වියදම ඉක්මවා, වියදම් කළ බවට සනාථන ඉදිරිපත් කරමින් රු.24,228,128 ක මුදලක් වැඩිපුර ප්‍රතිපාදන වශයෙන් ව්‍යාපෘතියෙන් ලබා ගෙන තිබුණු අතර එම මුදල සේවක දිරි දීමනා ගෙවීම සඳහා යොදා ගෙන තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ගෙවීමට උපයෝගී කරගෙන ඇත. | |
| (හ) | මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ යාන්ත්‍රික ඉංජිනේරු ඒකකයට අනුයුක්ත කර ඇති ලොරි රථ 04 ක ධාවන සටහන් වල සඳහන් කරුණු අනුව මුලින් දක්වා ඇති ලොරිරථ 03 ක ඉන්ධන ලීටරයෙන් කි.මී. 4 ක් ද අනෙකුත් ලොරි රථය ඉන්ධන ලීටරයකට කි.මී. 03 ක් වත් අවම වශයෙන් ධාවනය විය යුතු වුවත්, එම රථවල ඉන්ධන ලීටරයකට ධාවනය වන දුර පිළිවෙලින් කි.මී. 03 හා 02 ලෙස සලකා ඉන්ධන ගැලපීමට ඉඩ දී තිබුණි. මේ තත්ත්වය තුළ ආරම්භයේ සිට එම රථ සඳහා වැඩිපුර ලබාගෙන ඇති ඉන්ධන ප්‍රමාණය ලීටර් 169,229 ක් වූ අතර එහි ප්‍රසම්පාදන වටිනාකම රු.13,572,166 ක් විය. වැඩිපුර ලබාගෙන ඇති ඉන්ධන සඳහා අයකර ගැනීමට ගිණුම් කාරක සභාව නියෝග ලබා දී තිබුණ ද මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | 2021 | ගිණුම් කාරක සභා තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සියළුම වාහන හා යන්ත්‍ර භාවිතයට අදාළ අභ්‍යන්තර ක්‍රමවේද ශක්තිමත් කොට ඇත. | ගිණුම් කාරක සභා නියෝගය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ශ) | ගටනේතැන්න මැදගම්මැද්ද මාර්ගය කාපට් අතුරා | 2022 | වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය | Asphalt Binder ඇතිරිමේදී ඉදිකිරීම් සම්බන්ධ සම්මත | වැඩිපුර ගෙවන ලද මුදල අයකර ගැනීමට කටයුතු |

| | |
|---|---|
| සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ සංශෝධිත ඇස්තමේන්තුවෙහි 2.10 (b) වැඩ විෂයෙහි Asphalt Binder මෙ.ටො.244.5 ක්, ඒකකයක් රු.13,892 බැගින් එකතුව රු.3,396,594 කට ඇස්තමේන්තු කර තිබුණු අතර, මේ සඳහා මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය Core thickness සාමාන්‍ය මි.මි.62.5 ක් ලෙස ගණනය කර තිබුණි. කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ බිල්පතේ මිනුම් පත්‍රයට අනුව Asphalt Binder මෙ.ටොන් 244.5 කට ගෙවා තිබුණි. එහෙත් අවස්ථා 05 ක දී සිදු කරන ලද ABB රසායනාගාර පරීක්ෂණ වාර්තා වලට අනුව Core thickness සාමාන්‍ය අගය මි.මි.30.8 ක් වූයෙන් භාවිතා කරන ලද මෙ.ටොන්.123.5 ක Asphalt Binder ප්‍රමාණය ඉක්මවා කොන්ත්‍රාත්කරුට මෙ.ටොන් 121 ක් සඳහා රු.1,680,932 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | උපදෙස් අත්පොතේ කර නොතිබුණි. (S.S.C.M) හි ක්‍රමවේද අනුගමනය කරමින් කර්මාන්ත අධීක්ෂණ කටයුතු කලයුතු බවට සියළු ඉංජිනේරුවරුන් දැණුවත් කර ඇත |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ෂ) | 2018 ඔක්තෝබර් 18 දින මධ්‍යම පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව අමාත්‍යාංශ 05 ක අමාත්‍යවරයා හා පෞද්ගලික කාර්යය මණ්ඩලය භාවිතා කළ වාහන 61 ක් ප්‍රධාන ලේකම් හා අනෙකුත් ආයතනවලට භාර දී තිබියදී එම වාහන, අවශ්‍යතාවය අනුව මාර්ග සංවර්ධන අධිකාරියට ලබා ගැනීමේ හැකියාව පිළිබඳ සලකා බැලීමකින් තොරව, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එහි ප්‍රධාන /විධායක ඉංජිනේරුවරුන් සඳහා කොට්ඨාශයේ මාර්ග පරික්ෂා කිරීමේ කටයුතු සහ විවිධ රැස්වීම්වලට සහභාගි වීමට ද්විත්වකාර්ය වාහන 12 ක් 2018 සිට 2023 අගෝස්තු දක්වා කාලය තුළ කුලී පදනම මත සේවයේ යොදවා කුලී ලෙස එකතුව රු.75,092,077 ක් පෞද්ගලික පාර්ශවයන් වෙත ගෙවා තිබුණි. | 2023 | වියදමක් දැරීමේ දී ඒ සඳහා අනුගමනය කළ හැකි විකල්ප ක්‍රියාමාර්ගයන් ඇගයීමට ලක් කර වඩා ඵලදායී හොඳම විකල්පය ගැනීමට කටයුතු කළ යුතුය. | වෙනත් ආයතනවල අනුයුක්ත කළ සංචිත රථ ලෙස භාවිතා කරන බව. | 2023 අගෝස්තු මාසයෙන් පසු වාහන කුලී පදනම මත සේවයේ යොදවා ගැනීමට කටයුතු කර නොමැත. |
| (ළ) | 1994 වර්ෂයේ සිට 2001 දක්වා වූ කාලය තුළ මධ්‍යම පළාත් නිවාස දෙපාර්තමේන්තුවේ නිවාස ණය ලාභීන් 880 දෙනෙකුට ලබා දී | 2022<br>2023 | හිඟ නිවාස ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය | මු.රෙ. 104 (4) පරික්ෂණය සඳහා ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය අංක CPC/RM/6/5/13 හා 2023.11.03 දිනැති ලිපිය මගින් හිඟ ණය | හිඟ ණය ශේෂයන් කපා හැරීම සඳහා ප්‍රධාන ලේකම්ගේ අනුමැතියට යොමු කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තිබුණු රු.5,682,579 ක ණය මුදල් අය කිරීමට හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | ශේෂයන් කපා හැරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව කටයුතු කරමින් හිඟ ණය ශේෂ කපා හැරීම සඳහා කටයුතු කිරීමට 109 වර්තාව ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය සඳහා යවා ඇත. | |
| (අඅ) | මධ්‍යම පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා විද්‍යායතනයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් අමාත්‍යාංශය මගින් 2021 වර්ෂයේ ලැබී තිබුණු රු.2,000,000 ක ප්‍රතිපාදන යොදා ගනිමින් බහු ක්‍රීඩා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රු.2,049,192 කට ක්‍රීඩා උපකරණ 1,332 ක් මිලදී ගෙන තිබුණි. බහු ක්‍රීඩා මධ්‍යස්ථාන ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් එම ක්‍රීඩා උපකරණ මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන වෙත ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ඒවා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවල රඳවාගෙන තිබුණි. | 2022 2023 | ප්‍රතිපාදන අදාළ නිශ්චිත අරමුණු ඉටු කර ගැනීමට යෙදවිය යුතු බව සහ ක්‍රීඩා භාණ්ඩ ඵලදායි ලෙස උපයෝජනය කල යුතුය. | 2021 වසරේ බහු ක්‍රීඩා මධ්‍යස්ථාන සඳහා වෙන්කළ රු.මිලියන 03 ක ප්‍රතිපාදන සඳහා භාණ්ඩ මිලදී ගත්තද එම වර්ෂයේ මුදල් නොලැබීම නිසා මෙම මුදල් යොදාගත් බව සහ අදාල වෘත්තීය ක්‍රියාකාරී සහභාගීත්වයක් සහිත නිලධාරීන් පළාත් පාලන ආයතනවල නොමැතිවීමත්, ඒ හා වෘත්තීය ක්‍රියාකාරී සහභාගීත්වයක් දැක්විය හැකි පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවට සම්බන්ධ නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටියත් අපේක්ෂිත අරමුණ ඉටුවී නොමැත. | මහනුවර දිස්ත්‍රික්කය අවරණය වන පරිදි බහු ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන 20 ක්, මාතලේ දිස්ත්‍රික්කය අවරණය වන පරිදි බහු ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන 11 ක් හා නුවරඑළිය දිස්ත්‍රික්කය අවරණය වන පරිදි බහු ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන 5 ක් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සිටින පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තු වට සම්බන්ධ ක්‍රීඩා නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වීමට අවධානය යොමු කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (අආ) | 2021 වර්ෂයේ කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියට වෙන්කල ප්‍රතිපාදන යටතේ මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් නවයාලතැන්න දිස්ත්‍රික් කෘෂිකර්ම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ පාංශු විද්‍යාගාරය නවීකරණය සහ පාංශු පරික්ෂණ උපකරණ සඳහා පිළිවෙලින් රු.3,000,000 ක් සහ රු.14,518,059 ක් ලෙස එකතුව රු.17,518,059 ක් වැයකර තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිට වසරකට වැඩි කාලයක් ගතවී ඇතත් පාංශු පරීක්ෂණ කටයුතු ආරම්භ නොකර ඒ සඳහා සපයන ලද උපකරණ ඇසුරුම් තුළම රඳවා නිෂ්කාර්යයව පැවතුණි. | 2023 | ප්‍රාග්ධන ප්‍රදාන ඵලදායීව උපයෝජනයට ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු බව | 2024 අගෝස්තු මස වන විට නිසි පරිදි පාංශු පරීක්ෂණ කටයුතු ආරම්භ කරන බව | මේ වන විටත් පාංශු පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොමැත. |
| (අඇ) | 2012 මාර්තු 29 දිනැති අංක PS/PCMD/SD/01/08 දරන ජනාධිපති ලේකම්ගේ ලිපියට අනුව පළාත් රාජ්‍ය සේවාවේ නියුතු, ක්ෂේත්‍ර නිලධාරීන්ට වැටුපට අමතරව ගෙවනු ලබන දීමනා සඳහා ජාතික වැටුප් හා | 2022 | නීති රීති රෙගුලාසිවලට අනුකූල විය යුතුය. | වර්තමානය වන විට පළාත් සභාවේ බලතල ක්‍රියාත්මක නොවන බැවින් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය යටතේ සත්ත්ව සංවර්ධන උපදේශකවරුන්ට එක් කෘතිම සිංචනයක් සඳහා ගොවීන්ගෙන් | මේ සම්බන්ධව ජාතික මට්ටමේ තීරණයක් ගැනීමට කමිටු වාර්තාව අධ්‍යක්ෂ ජනරාල් විසින් නිර්දේශ කර කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ හා මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගැනීමෙන් තොරව, පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සත්ව සංවර්ධන උපදේශක නිලධාරීන්ට, කෘතිම සිංචන සේවාව සැපයීම වෙනුවෙන් පරිවර්තිත ගමන් වියදම් දීමනාවට අමතරව සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට නොවැම්බර් දක්වා රු.7,106,823 ක් ගෙවා තිබුණි. | | | අය කරන රු.700 ක මුදල දෙපාර්තමේන්තු පොදු තැම්පත් ගිණුමේ තැම්පත් කිරීමෙන් පසු එම තැම්පත් මුදලින් සියයට 90 ක ප්‍රතිපූරණයක් කරනු ලබන බව දන්වා සිටිමි. | ලේකම් වෙත යොමු කර ඇත. |
| (අඇ) | 2021,2022 හා 2023 වර්ෂ තුළදී මධ්‍යම පළාත් සභාවේ ආයතන 08 කට අයත් එකතුව රු.830,611,345 ක් වූ ගොඩනැගිලි, යන්ත්‍ර උපකරණ හා වාහන වත්කම් ඒකක 17,586 ක් නිශ්කාර්යව පැවතුණි. | 2021<br>2022<br>2023 | වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | නිශ්ක්‍රීය දේශන ශාලා විධිමත් ගාස්තු ක්‍රමයක් යටතේ බාහිර ආයතන වෙත ලබා දීමට, ආයුර්වේද සුවතා මධ්‍යස්ථානය දඹුල්ල මහනගර සභාවට හෝ ආයුර්වේද මධ්‍යස්ථානයකට පැවරීමට කටයුතු කරමින් පවතින අතර අධ්‍යාපන ගොඩනැගිලි වාර්ෂික ප්‍රතිපාදන යටතේ අධියර වශයෙන් සිදු කරන බව දන්වා සිටිමි. තෙකලා විදුලිය සපයා ගැනීමට නොහැකි වීම, රසායන කාර්ය මණ්ඩල දැනුවත් නොකිරීම, පුහුණු සේවකයන් බඳවා | වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ගැනීමට නොහැකි වීම සහ ඇතැම් යන්ත්‍ර සඳහා මිනිස් ශ්‍රමය විශාල වශයෙන් යොදා ගැනීමට සිදුවීම නිසා යන්ත්‍ර නිශ්ක්‍රීයව පවතින අතර අලුත්වැඩියා කර භාවිතා කිරීමට කනොහැකි යන්ත්‍ර අපහරණය කිරීමට කටයුතු කරන බව දන්වමි. නිශ්ක්‍රීය වශයෙන් දක්වා ඇති උපකරණ අවශ්‍යතාවය පැන නැගුණු විට බෙදාහැරීම සඳහා තබාගෙන ඇති බවත් ඇතැම් ව්‍යාපෘති නිම නොවීම නිසා ඊට අදාළ උපකරණ නිදහස් කිරීමට නොහැකි වූ බවත් දන්වමි. නිශ්ක්‍රීය වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අවශ්‍යතාවය පවතින ආයතන වලට ලබා දීමටත් අලුත්වැඩියා කළ නොහැකි වාහන අපහරණය සඳහා කටයුතු කරමින් පවතී. | |
| (අඉ) | මධ්‍යම පළාත් මූල්‍ය රීති 54.1.2, 54.1.3 හා 54.1.6 අනුව කටයුතු කර මධ්‍යම පළාත් සභාවේ ආයතන 02 ක වාහන 09 කට අදාළ එකතුව රු.1,798,533 | 2023 | අයකර නොගත් අලාභහානි අයකර ගැනීමටත් අයකළ අලාභ පිළිබඳව සනාථ කිරීම් ඉදිරිපත් කළයුතුය. | රියදුරුගෙන් අය නොවූ වටිනාකම අයකර ගැනීමටත්, අය නොවීම් සම්බන්ධයෙන් නඩු ක්‍රියාත්මක කිරීමටත්, රක්ෂණයෙන් | අයකර නොගත් අලාභ හානි අයකර ගැනීමටත්, අයකර ගත් අලාභ අයකර ගත් බවට |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ක අලාභ හානි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | ප්‍රතිපූරණය නොවූ කොටස අදාළ වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමටත් කටයුතු කරන ලදි. | තහවුරු කිරීමටත් කටයුතු කර නොමැත. |
| (අඊ) | මධ්‍යම පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 54.5 හා 54.6 අනුව මධ්‍යම පළාත් සභාවේ ආයතන 04 කට අදාළව වාහන 10 කට රු.3,720,072 ක අලාභ හානි සිදුවී තිබුණ ද 2023 ජූනි 30 දින වන විටත් ඒ සම්බන්ධයෙන් කිසිදු මූලික පරීක්ෂණයක් හෝ අවසන් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි | 2023 | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කර පරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුය. | නොපැවැත්වූ මු.රෙ.104(4) පරීක්ෂණ පැවැත්වීමටත්, නොලැබුණු පරීක්ෂණ වාර්තා ගෙන්වා ගැනීමටත් කටයුතු කරමි. මු.රෙ.104(4) පරීක්ෂණ වාර්තාවක් ලැබී ඇත. | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව අලාභ හානි සම්බන්ධයෙන් කටයුතු කර නොමැත. |
| (අඋ) | 2018 මාර්තු 19 දිනැති අංක 1/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ "රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය - ධාවනය කළ නොහැකි තත්ත්වයේ පවතින මෝටර් වාහන අපහරණය" සම්බන්ධයෙන් නිකුත් කළ චක්‍රලේඛ උපදෙස් අනුගමනය කිරීමකින් තොරව මධ්‍යම පළාත් සභාවේ ආයතන 04 ක වසර 01 සිට වසර 10 දක්වා කාලයක් තිස්සේ ධාවනයෙන් ඉවත් කර තිබුණු වාහන 23 ක් අපහරණ | 2023 | වාහන සක්‍රීයව උපයෝජනය කර ගැනීමට කටයුතු කළ යුතුය. | ආයතනයට භාවිතයට අවශ්‍ය නොවන වාහන වෙනත් ආයතන වෙත ලබා දීමටත්, අපහරණය කළ යුතු වාහන අපහරණය සඳහා යොමු කිරීමටත් හා වාහන 02 වෙන්දේසි කිරීමටත් කටයුතු කර ඇත. | වාහන සක්‍රීයව උපයෝජනයට ගැනීමට සහ අපහරණ කටයුතු කඩිනම්ව සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කිරීමට කටයුතු කර නොතිබුණි. | | | | |
| (අථ) | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය භාවිතා කරනු ලබන වටිනාකම හඳුනාගත නොහැකි ගිලන් රථයක් ලියාපදිංචි අයිතිය පෞද්ගලික වැවිලි සමාගමක් නමින් පැවති අතර ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් රු.8,000,000 ක මෝටර් රථයක ලියාපදිංචි අයිතිය පෞද්ගලික පාර්ශවයකගේ නමට පැවතුණි. | 2023 | ලියාපදිංචි අයිතිය වෙනස් වීමට අදාළ තොරතුරු අනාවරණය කර ගත යුතුය. | මෝටර් රථය මූල්‍ය ප්‍රකාශණ වලින් ඉවත් කිරීමටත්, ගිලන් රථය අපහරණය සඳහා යොමු කිරීමටත් කටයුතු කර ඇත. | ලියාපදිංචි අයිතිය වෙනස් වීමට අදාළ තොරතුරු අනාවරණය කර ගෙන නොමැති අතර ගිලන් රථය අපහරණය කිරීමේ කටයුතු සිදුවී නැත. |
| (අඵ) | නුවරඑළිය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ පශු වෛද්‍ය කාර්යාල 07 කට අයත් වාහන 08 ක් අනතුරට භාජනය වී, අළුත්වැඩියා කිරීමකින් තොරවද වාහන 07 ක් අදාළ පශු වෛද්‍ය කාර්යාල වල ගාල්කර තිබූ අතර එක් වාහනයක අළුත්වැඩියා වියදම රු.16,500,000 ක් බව හඳුනාගෙන තිබුණි. | 2023 | අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි වාහන අලුත්වැඩියා කිරීමට හා අනෙකුත් වාහන සම්බන්ධයෙත් අපහරණ කමිටු නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය | මු.රෙ. 104(4) පරීක්ෂණ වාර්තා නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත්, අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි වාහන අලුත්වැඩියා කිරීමටත්, ආයතනයට අවශ්‍ය නොවන වාහන අවශ්‍ය වෙනත් ආයතන වෙත මුදා හැරීමටත් කටයුතු කර ඇත. | අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි වාහන අලුත්වැඩියා කිරීමටත්, අනෙකුත් වාහන සම්බන්ධයෙත් අපහරණ කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කර නොමැත. |

## 3.7 දකුණු පළාත් සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය (ඌණතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 55,372,283,976 | 1,711,798,447 | 53,660,485,529 | 558,915,389 | තත්ත්වාගණනය කළ |
| **2022** | 58,357,835,649 | 1,627,103,945 | 56,730,731,704 | (777,611,692) | තත්ත්වාගණනය කළ |
| **2023** | 60,745,155,722 | 2,211,653,348 | 58,533,502,374 | (850,674,421) | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| **01.** | **නීති,රීති හා රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට අනුකූල නොවීම** | | | | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (8) , (9) වගන්ති ප්‍රකාරව අධිභාර සම්බන්ධයෙන් විගණකාධිපති වරයාගේ තීරණය දැනුම් දෙනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත අධිභාරලාභියා විසින් පළාත් පාලන කොමසාරිස් වෙත අදාළ මුදල ගෙවිය යුතු අතර එසේ මුදල් ගෙවා නොමැති නම් හා අභියාචනාවක් කර නොමැති නම් අදාළ තැනැත්තා පදිංචි ප්‍රදේශයේ අධිකරණ බලය ඇති දිසා අධිකරණය වෙත | 2023 | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කල යුතුය. | අධිභාර සහතික 11 සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය සහ ඒ සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව සංක්ෂිප්ත වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | අධිභාර සහතික 07 කට අදාළව රු.7,249,098 ක් අධිභාරකරුවන් ගෙන් අයකර ගැනීමට පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නියෝග ලබා දී නැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඉල්ලුම් කර අදාළ මුදල් අයකර ගැනිමට පළාත් පාලන කොමසාරිස් විසින් කටයුතු කල යුතු වුවත්, විගණකාධිපති විසින් විවිධ අවස්ථාවන්හිදී නිකුත් කල, වටිනාකම රු.8,649,112 ක් වූ අධිභාර සහතික 11 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එකී නියමයන් අනුව කටයුතු කර නොතිබුණි. | | | | |
| (ආ) | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටියෙහි 4.1 ඡේදය ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක් සඳහා බඳවා ගැනීමේදී බාහිර අයදුම්කරුවන් වෙත තිබිය යුතු සුදුසුකම් ලෙස පිළිගත් උපාධියක් සමඟ පශ්චාත් උපාධියක් දක්වා තිබුණද දකුණු පළාත් සංවර්ධන අධිකාරියෙහි අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ දැනට කටයුතු කරන නිලධාරියා විසින් එම සුදුසුකම් සපුරා නොතිබුණි. | 2023 | බඳවා ගැනීම් පටිපාටිය ප්‍රකාරව කටයුතු කල යුතුය. | නඩු කටයුතු පවතින බව හා මේ වන විට එකී නඩුව වාර 07ක් කැඳවා ඇති බවත් එබැවින් අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා බඳවා ගැනීම තවකාලිකව නතර කර ඇත. එබැවින් 2019 සැප්තැම්බර් 23 දින ආණ්ඩුකාරවරගේ නිර්දේශ අනුව මෙම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත වත්මන් වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කර ඇති බව දන්වා ඇත. | මේ සම්බන්ධයෙන් බඳවා ගැනීම් පටිපාටිය ප්‍රකාරව කටයුතු කිරීමකින් තොරව ආණ්ඩුකාරවර ගේ නිර්දේශය අනුව මෙම අධිකාරීයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පත්කර ඇත. |
| (ඇ) | 2010 අගෝස්තු 09 දිනැති දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/57 | 2023 | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | 2022 වර්ෂයේ නිකුත් කරන ලද පීඑස්/සීඑස් ඒ/11-18(1) හා පීඑස්/සීඑස්ඒ/11-18 | චක්‍රලේඛයන්ට අනුව 2022 ඔක්තෝබර් මස සිට මෙම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වෙළුම 01 දරන ලිපියට අනුකූල නොවන ලෙස 2020 අගෝස්තු මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා කාලයට අදාළව දකුණු පළාත් සභාවේ සභාපතිවරයාට නිවසක් කුලියට ගැනීම වෙනුවෙන් රු.1,350,000 ක දීමනාවක් සභා ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි. | | | (11) ජනාධිපති ලේකම් චක්‍රලේඛයන්ට අනුව 2022 ඔක්තෝබර් මස සිට මෙම දීමනාව ගෙවීම නතර කර ඇති බව දන්වා ඇත. | දීමනාව ගෙවීම නතර කර තිබුණද, ගෙවන ලද දීමනා සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ඇ) | 2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/ 2008 (IV) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2014 ජනවාරි 02 දිනැති 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3 (ii) ඡේදය ප්‍රකාරව අනුමත ඉන්ධන සීමාවන් සහ ඉන්ධන වර්ගය පිළිබඳව පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දැනුවත් කර තිබියදී හා ඒ පිළිබඳ ලබා දී තිබූ නිර්දේශ නොසලකා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ මත ආණ්ඩුකාරවරගේ අනුමැතිය මඟින් 2019 මැයි 16 දිනැති අංක 02- 2019 දරන ප්‍රධාන ලේකම් චක්‍රලේඛය | 2023 | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | නිලධාරීන් භාවිතා කරන වාහන සඳහා එම වාහන වලට භාවිතා කරන ඉන්ධන වර්ගය අනුව වර්ග දෙකක් හඳුනාගෙන ඇති අතර ඒ අනුව භාවිතා කරන සත්‍ය ඉන්ධන වර්ගය පදනම් කර ගෙන දීමනා ගෙවා ඇති බව දන්වා ඇත. | 2023 අප්‍රේල් 01 දින සිට සාමාන්‍ය පෙට්‍රල් හා සාමාන්‍ය ඩීසල් සඳහා ඉන්ධන දීමනාව ගෙවීමට කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දී තිබුණද ගෙවන ලද ඉන්ධන දීමනා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (මුදල්) නිකුත් කර තිබුණු අතර ඒ අනුව දකුණු පළාත් සභාවේ ආයතන 22 කට අදාළව තනතුරු 44 කට අයත් නිලධාරින් 73 දෙනෙකු වෙත 2019 මැයි මස සිට 2023 ජුනි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රු.22,135,624 ක් හා සුපිරි පෙට්‍රල් හා සුපිරි ඩීසල් සඳහා රු.8,801,977 ක් ඉන්ධන දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි. | | | | |
| (ඉ) | ජනාධිපති ලේකම් චක්‍රලේඛ | | | | |
| (i) | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 ජනාධිපති ලේකම් චක්‍රලේඛයේ 1 වන ඡේදය ප්‍රකාරව පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව කාර්යාල දීමනා ගෙවිය නොහැකි වුවද දකුණු පළාත් සභාවේ සභාපතිවරයාට 2019 ඔක්තෝබර් මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා සහා ලේකම් කාර්යාලයෙන් කාර්යාල දීමනාව ලෙස රු.1,850,000 ක් ගෙවා තිබුණි. | 2023 | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | 2022 වර්ෂයේ නිකුත් කරන ලද පීඑස්/සීඑස්ඒ/11-18(1) හා පීඑස්/සීඑස්ඒ/11-18(11) ජනාධිපති ලේකම් චක්‍රලේඛයන්ට අනුව 2022 ඔක්තෝබර් මස සිට මෙම දීමනාව ගෙවීම නතර කර ඇති බව දන්වා ඇත. | චක්‍රලේඛයන්ට අනුව 2022 ඔක්තෝබර් මස සිට මෙම දීමනාව ගෙවීම නතර කර තිබුණද, ගෙවන ලද දීමනා සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ii) | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛයේ 4.1 ඡේදය | 2023 | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | ආණ්ඩුකාර ලේකම්ගේ අංක ජී/එස්පී/1/2/1/3/19 දරන සහ 2019 අගෝස්තු 09 දිනැති | චක්‍රලේඛයන්ට පටහැනිව ආණ්ඩුකාරවර අනුමැතිය මත වැඩිපුර ගෙවන |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රකාරව පළාත් සභාවේ සභාපතිවරයාට පෙට්‍රල් වාහනයක් සඳහා ලීටර් 600 ක්ද ඩීසල් වාහනයක් සඳහා ලීටර් 500 ක්ද ලබා දිය හැකි බව දන්වා තිබියදී එකී විධිවිධාන අභිබවායමින් දකුණු පළාත් ආණ්ඩුකාරවරගේ අංක G/SP/1/2/1 /3/19 හා 2019 ජූලි 09 දිනැති ලිපිය ප්රකාරව ඩීසල් ලීටර් 600 ක් බැගින් ලබා ගැනීම නිසා 2019 ජූලි මස සිට 2022 සැප්තැම්බර් මස දක්වා චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස ඩීසල් ලීටර් 3,900 ක් වෙනුවෙන් රු.708,000 ක් සහා ලේකම් කාර්යාලයෙන් ගෙවා තිබුණි. තවද, චක්‍රලේඛ උපදෙස්වලට අනුකූල නොවන ලෙස සුපිරි ඩීසල් රේටයන් පදනම් කරගෙන ගෙවීම් කිරීම නිසා රු.682,525 ක වැඩිපුර ගෙවීමක්ද කර තිබුණි. | | | ලිපිය අනුව ගරු සභාපතිතුමා සඳහා ලබාදී ඇති නිල රථ දෙක සඳහා එක් වාහනයකට ඩීසල් ලීටර් 600 බැගින් 2019 අප්‍රේල් මස සිට ඉන්ධන දීමනාව ලබාදීමට අනුමැතිය ලැබී ඇති බව දන්වා ඇත. | ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය වෙනුවෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොමැත. |
| (iii) | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන ජනාධිපති ලේකම් චක්‍රලේඛයේ 4.2 ඡේදයට පටහැනිව දකුණු පළාත් සභාවේ සභාපතිවරයාගේ සම්බන්ධීකරණ හා මහජන සම්බන්ධතා ලේකම්වරුන්ට 2019 | 2023 | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | පීඑස්/සීඑස්ඒ/11-18(11) චක්‍රලේඛයන්ට අනුව 2022 ඔක්තෝබර් මස සිට මෙම දීමනාව ගෙවීම නතර කර ඇති බව දන්වා ඇත. | 2022 ඔක්තෝබර් මස සිට මෙම දීමනාව ගෙවීම නතර කර 2022 ඔක්තෝබර් මස සිට සභාපතිවරයා ගේ පෞද්ගලික ලේකම්වරයාට පමණක් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඔක්තෝබර් මස සිට 2022 ඔක්තෝබර් මස දක්වා මසකට රු.50,000 බැගින් රු.3,700,000 ක් වූ වාහන දීමනාවක් සහ නිල වාහන සපයා නොතිබියදී 2019 අගෝස්තු සිට 2022 ඔක්තෝබර් දක්වා රු.2,516,680 ක් වූ ඉන්ධන දීමනාවක් සහා ලේකම් කාර්යාලයෙන් ගෙවා තිබුණි. | | | | නිලවාහනයක් ලබාදී ඇති අතර ඒ සඳහා සාමාන්‍ය ඩීසල් රේටය පදනම් කරගෙන ලීටර් 150 ක් සඳහා ඉන්ධන දීමනාව ලබාදෙනු ලැබුවද, චක්‍රලේඛයට පටහැනිව කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| (ඊ) | මුදල් අමාත්‍යාංශයේ 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03(vii) ඡේදය ප්‍රකාරව සේවක බඳවා ගැනීම් සඳහා මූලික කටයුතු සිදුකර තිබුණද, මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම් කල් තැබිය යුතු වුවද ඊට පටහැනිව දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් 2022 ජුනි 24, 27 හා 28 දිනයන්හිදි සේවකයින් 12 ක් බඳවා ගෙන 2022 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.2,896,161 වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | 2022 1.5.5.1 (ආ) | රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුගත වෙමින් චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | සිදු කරන ලද බඳවා ගැනීම් තුළින් චක්‍රලේඛයේ සඳහන් කරන ලද කොන්දේසි කඩකර ඇති මුත් එහි මුඛ්‍ය පරමාර්ථයට හානියක් නොවන අයුරින් එම චක්‍රලේඛයේ සඳහන් 05 වන කරුණ යථාර්ථයක් බවට පත් කිරීමට කටයුතු යොදා ඇති බව දන්වා ඇත. | බඳවා ගැනීමේ පටිපාටිය අනුව පත්වීම් බලධරයා ලෙස නම් කර ඇත්තේ අධිකාරියේ සාමාජික මණ්ඩලය වන හෙයින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව අදාල බඳවා ගැනීම් සිදු කර ඇති බව දන්වා තිබුණද, චක්‍රලේඛයට පටහැනිව සිදුකරන ලද බඳවා ගැනීම් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (උ) | හාණ්ඩාගාර ලේකම්ගේ 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන චක්‍රලේඛය, 2022 නොවැම්බර් 25 දිනැති අංක 08/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය හා ජනාධිපති ලේකම්ගේ 2022 අගෝස්තු 15 දිනැති අංක PC/SB/ Circular/10/2022-2 දරන චක්‍රලේඛයන්ට පටහැනිව දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2022 නොවැම්බර් 29 දින රු.4,864,268 ක වියදමක් දරමින්, 2020 අ.පො.ස.(සා.පෙ.) සෞන්දර්ය විභාග ප්‍රතිඵල ඇගයීමේ වැඩසටහන පවත්වා තිබුණි. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ මුදල් එහි අරමුණු වලට පටහැනිව මෙම වැඩසටහන සඳහා යොදවා ගෙන තිබුණි. | 2023 | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | අ.පො.ස සා/පෙළ 2020 ප්‍රතිඵල ඇගයීමේ සමස්ථ වැඩ සටහන සඳහා ආණ්ඩුකාරවරගෙන් ලද අනුමැතිය මත 2022 නොවැම්බර් 29 දින මෙම වැඩ සටහන පැවැත්වූ අතර එහිදී ගුරු භවතුන් හා අධ්‍යාපන නිලධාරීන් සියල්ල 1500 කට ආසන්න ප්‍රමාණයක් සඳහා තිළිණපත් ලබාදීම ඇතුළුව මුළු වියදම රු.4,864,268 ක් වූ බව දන්වා ඇත. | මේ දක්වාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| **02.** | **අනෙකුත් අත්තිකාරම් ගිණුම්** | | | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල එකතු ශේෂය රු.1,577,211,969 ක් ලෙස දක්වා තිබූ අතර | 2023 | අයවිය යුතු ණය ශේෂ කඩිනමව අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | 2024 සැප්තැම්බර් මස වන විට තවදුරටත් එකතුව රු.48,125,278 ක ණය ශේෂයක් අයකර |

| | | | | | |
|---|---|---|---|---|---|
| | එම ශේෂයෙන් ස්ථානමාරු වී ගිය/ විශ්‍රාම ගිය, මියගිය, වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන් 3,609 දෙනෙකුගෙන් තවදුරටත් අයවිය යුතු එකතුව රු.53,726,173 ක් වූ ණය ශේෂ ඇතුළත්ව තිබුණි. | | | | ගැනීමට පවතී. |
| **03.** | **කළමනාකරණ අකාර්යක්ෂමතා** | | | | |
| (අ) | වර්ෂ 1994 සිට 2020 දක්වා කාලය තුළ සමුපකාර සමිති 18 ක් සඳහා විවිධ කාර්යයන් වෙනුවෙන් ලබාදී තිබුණු එකතුව රු.45,418,396 ක් වූ ණය මුදල් වලින් 2021 නොවැම්බර් 30 දින වන විට එකතුව රු.23,695,696 ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. | 2021 | පසු විපරම් ක්‍රියාවලිය කාලීනව හා නිසි අධීක්ෂණයකින් යුක්තව සිදු කර අයවිය යුතු ණය ශේෂ අය කර ගැනීමට හෝ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | ආණ්ඩුකාරවර සමග සාකච්ඡා කර පොලී සහන ලබා දී අයකර ගැනීමට උත්සාහ ගනිමින් පවතින අතර නැතහොත් කපා හැරීමට කටයුතු කරන බව දැනුම් දී ඇත. | 2024 අගෝස්තු 15 දින වන විට රු.68,699,013 ක ණය ශේෂයක් තවදුරටත් අයවීමට පැවතුණි. |
| (ආ) | 2021 වර්ෂයේදී සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලේ උපදේශක කාරක සභාවේ සභාපති ඇතුළු සාමාජිකයින් 06 දෙනෙකුට විශ්‍රාම වැටුප් අරමුදලෙන් දීමනා ගෙවීමේ හැකියාවක් නොතිබියදී ආණ්ඩුකාරවරගේ අනුමැතිය මත රු.326,000 ක් ද කාර්යමණ්ඩලයේ | 2021 | සමුපකාර සේවක විශ්‍රාම වැටුප් අරමුදලේ නියෝග මාලාවට අනුව කටයුතු කළ යුතුය. | නියෝග මාලාව අනුව ප්‍රතිපාදන වෙන් කිරීමට සිදු නොවන නමුත් නියෝග මාලාවේ 27 වන වගන්තිය හා 2020 සැප්තැම්බර් 27 දිනැති ආණ්ඩුකාරවරගේ ලිපිය මඟින් උපදේශක කාරක සභාව හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත ගෙවීම් සිදු කර ඇති බව දන්වා | මේ දක්වාම මෙම දීමනා ගෙවීම් කටයුතු සිදුකරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිලධාරීන් 08 දෙනෙක් සඳහා රු.878,139 ක් ද වශයෙන් රු.1,204,139 ක් ගෙවා තිබුණි. | | | ඇත. | |
| (ඈ) | 2021 දෙසැම්බර් 31 දිනට 1999 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ග්‍රාම සංවර්ධන අරමුදල මඟින් ලබා දී තිබුණු ණය මුදල් වලින් ණය හා පොලී ලෙස රු.16,011,413 ක හිඟ ශේෂයක් අයවීමට පැවතුණි. | 2021 | කඩිනමින් හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | තවදුරටත් 1999 – 2019 වර්ෂවලට අදාළ ණය සහ පොළී ශේෂය රු.16,011,413ක් පවතින බව දන්වා ඇත. | 2024 අගෝස්තු 15 දින වන විට තවදුරටත් රු.7,601,941 ක ණය ශේෂයක් අයකර ගැනීමට පවතී. |
| (ඇ) | 2021 වර්ෂයේ ග්‍රාමීය සෞඛ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ කඹුරුපිටිය හා තංගල්ල රෝහල් සඳහා සපයා සවිකර ක්‍රියාත්මක කිරීමේ පදනමට (Supply Installation And Commission) රු.13,681,000 කට මිලදී ගෙන තිබූ යන්ත්‍ර 04 ක් 2022 දෙසැම්බර් ලැබීමෙන් අනතුරුව තැන්පත් ගීණුමේ රඳවා ගෙන තිබූ මුදල් මුදාහැර ගෙවීම් කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටද යන්ත්‍ර සඳහා රැඳවුම් උපකරණ හා උපාංග නොමැති වීමෙන් ක්‍රියාත්මක නොකර නිෂ්කාර්යව පැවතුණි. | 2022 | අවශ්‍යතා හඳුනා ගැනීම, ප්‍රසම්පාදනය කිරීම හා මිලදී ගැනීමේ කොන්දේසි ඉටු කරවා ගෙන ගෙවීම් කළ යුතුය. | 2021 වර්ෂය සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන මඟින්ම උපකරණ ලබාගැනීම වඩාත් වාසිදායක බැවින් පොදු තැන්පත්හි රඳවා 2022 සැපයුම ලද පසු මුදල් නිදහස් කරන ලදි. | මේ දක්වාම මෙම යන්ත්‍රය ඵලදායී ලෙස යොදවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඉ) | මාර්ග සංවර්ධන අධිකාරියේ වාහන අළුත්වැඩියාව සඳහා වෙනම ඒකකයක් පිහිටුවා තිබියදී, සමාලෝචිත වර්ෂය තුල, අධිකාරිය සතු වාහන භාහිර ආයතන වෙතින් අළුත්වැඩියා කිරීම සඳහා රු.7,400,200 ක් වැය කර තිබුණි. | 2022 | වාහන අළුත්වැඩියාව සඳහා පිහිටුවා ඇති ඒකකයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම තුළින් බාහිර ආයතන වෙතින් සිදුකරනු ලබන නඩත්තු අවම කිරීමට කටයුතු කළ යුතුය. | ඒකකය සතු සීමිත මානව සම්පත මේ සඳහා යොදාගනු ලබන අතර පූර්ණ අළුත්වැඩියා සිදුකළ යුතු වාහන යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ නිර්දේශ පරිදි විධිමත් ටෙන්ඩර් පරිපාටියට අනුකූලව බාහිර ආයතන මගින් සිදුකිරීම කරනු ලබන බව දැනුම් දී ඇත. | මේ සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට මේ දක්වාම කටයුතු කර නොමැත. |
| (ඊ) | 2022 දෙසැම්බර් 31 දිනට ගාල්ල, මාතර හා හම්බන්තොට සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් කාර්යාලවල උසාවි දඩ ලෙස අයකර තිබූ එකතුව රු.40,215,178 ක් වූ නිරවුල් කළ යුතු උසාවි දඩ ශේෂයක් පැවති අතර මෙම මුදල අදාළ ප්‍රතිලාභී සමිති හඳුනාගෙන කඩිනමින් ලබාදීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම, මෙම ශේෂය තුළ 2022 වර්ෂයට පෙර කාලයට අදාළ හඳුනා නොගත් රු.27,837,307 ක් වූ ශේෂයක් පැවතුණි. | 2022 | උසාවි දඩ ලෙස අයකර තිබූ මෙම මුදල් ප්‍රතිලාභී සමිති හඳුනාගෙන කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | උසාවි දඩ නිරවුල් කිරීමේ ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු කාලයක් ගත වන බැවින් ඒ සඳහා මෘදුකාංගයක් හඳුන්වා දී ඇත. | 2024 ජූලි 31 දින වන විට තවදුරටත් රු.16,781,525 ක මුදලක් නිරවුල් කිරීමට පවතී. |
| (උ) | ණය ගෙවීම් කිරීමේදී වාරික ලෙස ගෙවීම් කිරීමට ණයකරුවන්ට අධිකරණය මඟින් තීන්දු ලබාදී තිබූ සමුපකාර සමිති 41 කට අදාළ වන රු.7,298,697 ක් වූ මුළු | 2022 | අදාළ ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නිරවුල් නොවූ ණය සම්බන්ධව ඉදිරි පියවර ගැනීමට අපේක්ෂා කරමින් පවතී. | 2024 අගෝස්තු 26 දිනට තවදුරටත් රු.4,020,763 ක් අයවීමට ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ණය ශේෂයෙන් වාරික නොගෙවීම මත රු.4,750,269 ක් වූ ණය ශේෂයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයවිය යුතුව පැවතුණි. | | | | |
| (ඖ) | 2019 මැයි 02 දිනැති හා 2020 ජනවාරි 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි 2019 ජුනි 25 දින සිට ආණ්ඩුකාර උපදේශක සඳහා මසකට රු.75,000 ක මාසික දීමනාවක් සහ රේඛීය අමාත්‍යාංශයක ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරකට අයත් පහසුකම් සහ නිල රථයක් ලබා දී තිබුණි. ඒ අනුව ආණ්ඩුකාරවර උපදේශක වශයෙන් මෙම නිලධාරියා වෙත 2019 ජුනි 25 දින සිට 2023 අගෝස්තු 31 දින දක්වා ඉන්ධන දීමනා ලෙස එකතුව රු.3,203,409 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | | | |
| (i) | ආණ්ඩුකාර උපදේශකවරයෙකු ලෙස සේවය කරමින් සිටියදී 2020 මාර්තු 18 දින සිට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙසද | 2023 | අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි කටයුතු කල යුතුය. | 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 33 වගන්තිය අනුව ආණ්ඩුකාරවර වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව G/SP/ Legal/ 108 හා 2020 මාර්තු | මේ සම්බන්ධයෙන් මේ දක්වාම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මෙම නිලධාරීයා පත් කර තිබූ අතර 2020 මාර්තු 19 දින සිට වැඩ භාරගෙන එදින සිට 2023 අගෝස්තු 31 දක්වා රු.1,166,838 ක දීමනා ලබා ගෙන තිබුණි. | | | 18 දිනැති ලිපිය මගින් අදාල නිලධාරියා දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික තනතුරට පත් කර ඇත. අදාළ තනතුරට හිමි දීමනා සහ අනෙකුත් ගෙවීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් සිදු කරනු ලබන බව දැනුම් දී ඇත. | |
| (ii) | තවද, ආණ්ඩුකාර උපදේශක සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරමින් සිටියදීම ගාලු උරුමය පදනමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද 2020 ජූලි 22 දින සිට පත්කර තිබුණු අතර, 2020 අගෝස්තු 22 දින වැඩ භාරගෙන ඒ සඳහා එදින සිට 2023 අගෝස්තු 31 දින දක්වා රු.2,354,639 ක දීමනා ලබා ගෙන තිබුණි. | 2023 | අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි කටයුතු කල යුතුය. | ගාලු උරුමය පදනම යනු ආණ්ඩුකාරවර යටතේ හෝ දකුණු පළාත් සභාව යටතේ ඇති ආයතනයක් නොවන බව දැනුම් දී ඇත. | මේ සඳහා විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් මේ දක්වාම ගෙන නොමැත. |
| (iii) | ආණ්ඩුකාර උපදේශක විසින් නිල රථය පාවිච්චි කරමින් ඉන්ධන දීමනා ලබා ගෙන තිබුණු අතර, එම රථය ඔහුගේ නිවසේ නතර කර තබා ගැනීමටද අනුමැතිය ලබා ගෙන තිබියදී ගාලු උරුමය පදනමට අයත් කාර් රථයක්ද භාවිතා | 2023 | අමාත්‍ය මණ්ඩල තීරණයන්ට අනුව කටයුතු කල යුතුය. | ගාලු උරුමය පදනම පළාත් සභා ආයතනයක් හෝ ආණ්ඩුකාරවර යටතේ පාලනය වන ආයතනයක් නොවන බව කාරුණිකව දන්වා සිටිමි. අදාල ආයතනයේ රෙගුලාසි සහ විධිවිධාන අනුව එම ආයතනය කටයුතු | මේ සඳහා විධිමත් පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් මේ දක්වාම ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| කර කිලෝමීටර් 2450 ක් ධාවනය කර තිබුණි. එයට අමතරව ආණ්ඩුකාර ලේකම් කාර්යාලය විසින් සපයන ලද වාහනය සඳහා 2022 ජුලි මස සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ගාලු උරුමය පදනමෙන්ද ලීටර් 410 ක් සඳහා රු.142,280 ක ඉන්ධන ලබා ගෙන තිබුණි. තවද, පූර්ණ කාලීනව ගාලු උරුමය පදනමේ අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ඉටු කළ යුතු වුවද, එලෙස කටයුතු කර නොතිබුණි. | | | කරන බවත් අදාල පරීක්ෂා කිරීම් එම ආයතනය සතු වගකීමක් බව දැනුම් දී ඇත. | |
| (එ) **ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ නිල වාහන සම්බන්ධ පරීක්ෂාව** | | | | |
| ජනාධිපති ලේකම්ගේ 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PC/CSA/11-18 දරන චක්‍රලේඛයේ 4.2 වගන්තිය හා 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008(VI) දරන සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මාසික ඉන්ධන දීමනාව ගෙවිය හැකි බව දක්වා තිබුණද, දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ මහජන සම්බන්ධතා නිලධාරී වෙත අනුයුක්ත කර | 2023 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. | ජනාධිපති ලේකම් විසින් රාජ්‍ය වියදම් කළමනාකරණය යටතේ නිකුත් කරන ලද ජනාධිපති චක්‍රලේඛ විධිවිධාන පරිදි මහජන සම්බන්ධතා නිලධාරී භාවිතා කරන නිලරථය සඳහා මාසික ඉන්ධන දීමනාවක් වශයෙන් ගෙවා ඇත. එමෙන්ම ආණ්ඩුකාරවර වෙතද එම චක්‍රලේඛයේම ප්‍රතිපාදන පරිදි ආණ්ඩුකාරවර ආරක්ෂක රථ | මේ දක්වාම මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තිබූ නිල රථය වෙනුවට ආණ්ඩුකාරවර නිල රථය හෝ ආණ්ඩුකාරවර ආරක්ෂක රථය 2023 ජනවාරි මස සිට අගෝස්තු මස දක්වා කාලසීමාව තුළ රාජකාරී කටයුතු සඳහා යොදාගෙන තිබියදී මහජන සම්බන්ධතා නිලධාරී වෙත අනුයුක්ත කරන ලද රථය සඳහා මසකට ඉන්ධන ලීටර් 213 බැගින් ඉන්ධන ලීටර් 1704 ක් වෙනුවෙන් රු.601,512ක් ඉන්ධන දීමනා ලෙස ගෙවා තිබුණි. එමෙන්ම, ආණ්ඩුකාරවර වෙතද ආණ්ඩුකාරවර ආරක්ෂක රථය වෙනුවෙන් එම කාල සීමාව සඳහා මසකට ලීටර් 495 ක් බැගින් ලීටර් 3960 ක් වෙනුවෙන් රු.1,397,880 ක ප්‍රමාණයක්ද ගෙවා තිබුණි. | | | වෙනුවෙන් චක්‍රලේඛයේ සඳහන් ඉන්ධන ලීටර ප්‍රමාණය සඳහා මාසික ඉන්ධන දීමනාවක් ගෙවීම සිදු කර ඇති බව දැනුම් දී ඇත. | |
| (ඒ) | වර්තමාන සාමාජිකයින් සංඛ්‍යාව 06 දෙනෙකුගෙන් සමන්විත දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වර්තමාන සභාපතිවරයාගේ වයස අවුරුදු 78 ක්ද එක් සාමාජිකයෙකුගේ වයස අවුරුදු 54 ක්ද අනෙක් | 2023 | කොමිෂන් සභා සාමාජිකයින් ලෙස සුදුසු සහ යම් වයස් සීමාවකට යටත්ව සාමාජිකයින් පත් කිරීමට කටයුතු කල යුතුය. | දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා සාමාජිකයන් මෙතෙක් දකුණු පළාත් සභාවේ සේවය කරන ලද විවිධ ආණ්ඩුකාරවරුන් විසින් ඔවුන්ගේ එක් එක් ධුර කාල තුලදී පත් කරන ලද සාමාජිකයන් වේ. යම් | මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් මේ දක්වාම ගෙන නොමැත. |

සාමාජිකයන්ගේ වයස අවුරුදු 65 ත් 77 ත් අතර පරාසයකද පැවති අතර ඔවුන්ගේ සේවා කාලය අවුරුදු 03 සිට අවුරුදු 29 දක්වා වූ කාල පරාසයක පැවතුණි. තවද, වයස අවුරුදු 77 හා 78 ක් වූ සාමාජිකයන් දෙදෙනෙකු 1994 වර්ෂයේ සහ 1997 වර්ෂයේ සිට කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස දිගින් දිගටම නැවත පත් කිරීම් සිදු කර තිබූ අතර ඔවුන්ගේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සේවා කාලය පිළිවෙලින් වර්ෂ 29 ක් හා 26 ක් ලෙස පැවතුණි. මේ අනුව, කොමිෂන් සභාවේ සාමාජිකයන් ආණ්ඩුකාරවර විසින් පත්කිරීමේදී වයස් සීමාවක් සඳහන් කර නොමැති වුවද, කාර්යයන් ඉටු කිරීමේදී කාලෝචිත හා ඵලදායි තීන්දු තීරණ ගැනීමට ඉතාමත් සුදුසු නිලධාරීන් පත් කිරීම වඩාත් යෝග්‍ය බව නිරීක්ෂණය කරන අතර සාමාජිකයින් අඛණ්ඩව දීර්ඝ කාලීන සේවය තුළින් පුද්ගල ආධිපත්‍ය ගොඩනැගීම සිදුවන බවද වැඩිදුරටත් නිරීක්ෂණය විය.

සාමාජිකයකු අලුතින් පත් කිරීම සඳහා මෙන්ම ඉහත දක්වා ඇති ප්‍රතිපාදන යටතේ කොමිෂන් සභාවට පත් කරනු ලැබ සිටි අයකු නැවත පත් කිරීමට පළාත් ආණ්ඩුකාරවරයාට හිමිවන බලතල කිසිදු නෛතික ප්‍රතිපාදනයකින් සීමා වී නොමැති බව හා එය පළාත් ආණ්ඩුකාවරයාගේ අභිමතය අනුව ක්‍රියාත්මක වන කාරණයක් බව දැනුම් දී ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඔ) | අමාත්‍යවරුන්ට හා මන්ත්‍රීවරුන්ට රු.10,484,810 ක මුදලක් වැය කර ලැප්ටොප් යන්ත්‍ර 51 ක්, ටැබ් යන්ත්‍ර 54 ක් හා පරිගණක යන්ත්‍රයක් 2015 අගෝස්තු 25 දින ලබා දී තිබූ අතර 2019 අප්‍රේල් 10 දින සිට පළාත් සභාව විසුරුවා හැර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ඒවා ආපසු සභා ලේකම් කාර්යාලයට භාරදී නොතිබුණු නමුත් මේ දක්වාම ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2023 | අදාළ ලැප්ටොප්, ටැබ් හා පරිගණක යන්ත්‍ර නැවත ලබා ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරි කටයුතු සඳහා සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස දන්වා ඇති බව හා නැවත පළාත් සභාවක් පිහිටුවන තෙක් මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ගයක් ගත නොහැකි වී ඇත. | 2024 සැප්තැම්බර් 30 දින දක්වාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ඕ) | 2019 වර්ෂයේ සිට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ආරම්භකර තිබුණු, රු.626,355,000 ක ස්ථාවර තැන්පත් සඳහා රු.34,023,029 ක පොලී ආදායමක් ලැබ් තිබුණු අතර, එම පොළිය වෙනුවෙන්, බැංකුව විසින් අඩු කර, ඍජුව දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට යවා තිබුණු සියයට 05 ක් වූ රු1,790,685 ක රඳවා ගැනීමේ බදු වටිනාකම (WHT) දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙන් යලි අයකර ගැනීමට හෝ අධිකාරියට බදු බැදියාවක් නොමැති | 2023 | අධිකාරිය විසින් ගෙවනු ලබන රඳවා ගැනීමේ බදු (WHT) සම්බන්ධයෙන් අදාල විධිවිධාන පරිදි කටයුතු කල යුතුය. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත රඳවා ගැනීමේ බදු සම්බන්ධයෙන් දැනුම් දී ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන උපදෙස් අනුව ඉදිරියේදී කටයුතු කරනු ඇත. | 2024 සැප්තැම්බර් 30 දින දක්වාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | බැවින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා නිෂ්කාෂන සහතිකයක් මත රඳවා ගැනීමේ බදු අඩු නොකරන ලෙස අදාල බැංකුවෙන් ඉල්ලීමට හෝ කටයුතු කර නොතිබුණි. | | | | |
| (ක) | 2015 මැයි 21 දින ඉමදූව දිසා රෝහලට අයත් ගිලන් රථයකට සිදුවූ අනතුර සම්බන්ධයෙන් අනතුර සිදුවී වසරකට පසු රක්ෂණ ආයතනය දැනුවත් කිරීම නිසා රක්ෂණ වන්දි ලැබී නොතිබුණි. 2016 දෙසැම්බර් 14 දිනැති ත්‍රිපුද්ගල කමිටු වාර්තාව අනුව අළුත්වැඩියාව ඵලදායී නොවන බැවින් අබලි ද්‍රව්‍ය ලෙස අපහරණය කිරීම සඳහා 2017 ජනවාරි 10 දින රථය සෞඛ්‍ය අමාත්‍යාංශයට භාරදී තිබුණි. මේ සම්බන්ධයෙන් 2015 නොවැම්බර් 23 දින පත් කරන ලද මූලික විමර්ශන කමිටුවේ වාර්තාව විගණනයට ඉදිරිපත් නොවූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම විමර්ශන වාර්තාවේ නිර්දේශ අනුව අලාභය අයකරගෙන නොතිබුණි. | 2023 | මූල්‍ය රීති අනුව කටයුතු කල යුතු අතර විමර්ශන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කල යුතුය. | ගිලන් රථය 2015 මැයි 21 අනතුරට පත්වීම සම්බන්ධයෙන් ගොනු පරීක්ෂා කිරීමේදී යොමු කරන ලද මූලික විමර්ශන වාර්තා සහ මු.රෙ වාර්තා අතර පරස්පරතාවයක් නිරීක්ෂණය වූ බැවින් මේ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රථම ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් සමඟ සාකච්ඡාවක් ලබා දෙන ලෙස 2024 මාර්තු 13 දිනැතිව යොමු කර ඇත. | මූලික විමර්ශන කටයුතු සිදුකර අදාළ අලාභයන් අයකර ගැනීමට මේ දක්වාම කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ග) | කාර්යාලයේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම මත මාතර පළාත් පාලන සහකාර කොමසාරිස් නිල කාමරය කාර්යාලයේ ඉදිරිපසට ගෙන ඒම ඇතුළු නවීකරණ කටයුතු සඳහා රු.2,711,538 ක මුදලකට ඇස්තමේන්තු ගත කර 2023 ඔක්තෝබර් මස 27 දින ගිවිසුම්ගතව තිබුණි. 2018 වර්ෂයේදී පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ නවීකරණය වෙනුවෙන් රු.5,249,116 ක මුදලක් දරා තිබියදී, 2022 අප්‍රේල් 26 දිනැති අංක BD/CBP/01/01/04 - 2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයට අනුකූල නොවී වසර 04 කට පෙර රු.5,249,116 ක් වැයකර නවීකරණය කර තිබූ කාර්යාල පරිශ්‍රය ඉඩපහසුකම් ප්‍රමාණවත් නොමැති බව සඳහන් කරමින් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව 2023 වර්ෂයේදීද නැවත රු.2,711,538 කට ගිවිසුම්ගත වී නවීකරණය කිරීමට කටයුතු කර තිබුණි. | 2023 | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව සැලසුම් සහගත ලෙස රාජ්‍ය වියදම් කළමනාකරණය කල යුතුය. | ආයතනයට පැමිණෙන සේවාලාභීන්ගේ පහසුව උදෙසා පෙරටු කාර්යාලයක් පිහිටුවීම මෙකී නවීකරණයේ මූලික අරමුණු වූ බව සහ පෙර පැවති සහකාර කොමසාරිස් නිල කාමරයට විදුලිය විසන්ධි වූ අවස්ථාවල දී ආලෝකය හෝ වාතාශ්‍රය නොලැබීම තුළ එහි රැඳී සිටීමට අපහසු තත්ත්වයක් ඇති බැවින්, වෙනත් ස්ථානයක නිල කාමරය ස්ථානගත කිරීමට සිදු වූ බව හා තවද, මෙම නවීකරණ කටයුතු සිදු කිරීමේ දී ගලවා ඉවත් කරන ලද සවි කිරීම් කොටස් සියල්ල නැවත සවි කරන ලද බව බිල්පත් පරීක්ෂාවේ දී තහවුරු කර ගත හැකිය. | පළාත් සභා අරමුදල් ඵලදායී නොවන ලෙස වැය කිරීම සම්බන්ධව විමර්ශනයක් සිදු කිරීමට කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ච) | දකුණු පළාත් සභාව විසින් පුනර්ජනනීය සූර්ය බලශක්ති උත්පාදනය කර ජාතික විදුලි බල පද්ධතියට 50 MW විදුලි ධාරිතාවයක් එක් කිරීමේ අරමුණ හා පළාත් සභාව තුළ නව ආදායම් මාර්ගයක් හඳුනා ගැනීමේ අරමුණ ඇතිව පළාත් සභාව තුළ පිහිටි පාසල්, රෝහල් හා රජයේ ගොඩනැගිලිවල වහලවල් වසර 20 ක කාලයකට දිගුකාලීන බදු පදනමට ලබාදෙමින් සූර්ය බලශක්ති උත්පාදනය කර විදුලිය ජනනය කිරීමේ කාර්යය සඳහා පෞද්ගලික ආයතනය තෝරාගෙන 2022 අප්‍රේල් 22 දින ගිවිසුම් ගතවී තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය. | | | | |
| (i) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.7.4 වගන්තිය සහ 2.8.1 (ආ) වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2023 | රාජ්‍ය හා පෞද්ගලික හවුල් කාර්යයක් යටතේ වන සේවා සැපයීමක් බැවින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතුය. | 2.8.1 වගන්ති ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවට අදාළ ආයතනය තෝරාගැනීම පිළිබඳ ප්‍රසම්පාදන තීරණය ගැනීම සඳහා නිර්දේශ ලබා දෙනුයේ තාක්ෂණික ඇගයීම් කමිටුව වන බැවින් ඒ සඳහා දකුණු පළාත් ඉංජිනේරු සේවා ආයතනයේ පළපුරුදු විදුලි ඉංජිනේරු මහතෙකු වන ජේ.ජී ජනත් මහතා විදුලි | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ඉංජිනේරු ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවකු වන බැවින් ඒ මහතා කමිටු සාමාජිකයෙකු ලෙස පත්කරගෙන ඇති බව දන්වා ඇත. | |
| (ii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9.1 වගන්තියට අනුව අදාළ කමිටු සඳහා දීමනා ගෙවීම් සිදුකල යුතු වුවද, ප්‍රසම්පාදනයේ විශාලත්වය හා දක්වන ලද දායකත්වය පදනම් කරගෙන ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික කමිටු වෙත එකතුව රු.640,000 ක් ආණ්ඩුකාරවර අනුමැතිය මත ගෙවීම් කර තිබුණි. | 2023 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කල යුතුය. | ගෙවීම් සඳහා ආණ්ඩුකාරවරගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද ලිපියෙහි ප්‍රසම්පාදනයේ විශාලත්වය හෝ දක්වන ලද දායකත්වය සහ එහි මූල්‍යමය අගය පිළිබඳ සඳහන් නොකිරීම පිළිබඳව ප්‍රමාදදෝෂයක් සිදු වී ඇති අතර ඉදිරියේදී එවැනි ගෙවීම් සඳහා අනුමැතිය ලබාගැනීමේදී එවැනි ප්‍රමාද දෝෂයන් සිදු නොවීමට වග බලා ගන්නා බව දන්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| **04.** | **මෙහෙයුම් අකාර්යක්ෂමතා** | | | | |
| (අ) | රුහුණු සංචාරක කාර්යාංශය විසින් රු.31,609,408 ක් වැය කර ඉදිකර තිබුණු හික්කඩුව අභිමංසල ගොඩනැගිල්ල 2016 අප්‍රේල් 15 දින ගිවිසුමක් මත බාහිර පාර්ශවයකට බදු දී තිබුණද, නියමිත පරිදි | 2021 | හිඟ බදු සහ දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ආණ්ඩුකාරවර තීරණය අනුව 2022 මාර්තු 31 දිනට හිඟ මුදල් සම්පූර්ණයෙන්ම ගෙවන්නේ නම් දඩ මුදල් නිදහස් කරනු ලබන බව හා පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත. | අදාළ හිඟ බදු මුදල් හා දඩ මුදල් ප්‍රමාණය වන එකතුව රු.11,450,000 ක් වූ ප්‍රමාණය 2024 සැප්තැම්බර් 30 දක්වාම අයකර ගැනීමට කටයුතු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මාසිකව බදු අයනොකිරීම නිසා රු.10,100,000 ක හිඟ බදු මුදලක් හා ඊට අදාළ දඩ මුදල් රු.1,350,000 ක් වශයෙන් එකතුව රු.11,450,000 ක් හිඟව පැවතුණි. | | | | කර නොතිබුණි. |
| (ආ) | දකුණු පළාත් සමුපකාර දෙපාර්තමේන්තුව විසින් 2005 වර්ෂයටත් පෙර සිට සමුපකාර භාරකාර අරමුදල නමින් පවත්වාගෙන ගොස් තිබුණු අතිරික්ත අරමුදල මගින් සමුපකාර සමිති 07 ක් වෙත ලබාදී තිබුණු එකතුව රු.6,383,765 ක ණය ශේෂ අයකර ගැනීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි. ඉන් එක් සමිතියක් හැර අනිකුත් සමිති 06 හි ණය ශේෂ 2005 වර්ෂයේ සිට හිඟව පැවතියද එකී ණය ශේෂ අයකර ගැනීමට හෝ ඊට අදාළ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 | හිඟ ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. | ගිවිසුම්ගත කාලය තුළ අයකර නොමැති සහ ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග එම කාල වකවානුව තුළ ගෙන නොමැති බැවින් අයකර ගැනීම අසිරු තත්ත්වයකි. නැවත ගිවිසුම්ගත වෙමින් ණය අයකර ගැනීමට කටයුතු කරමින් ඇත. | තවදුරටත් රු.4,482,680 ක මුදලක් අයකර ගැනීමට පවතී. |
| (ඇ) | 2022 දෙසැම්බර් මස 05 වන දින සියයට 15 ක පොලී අනුපාතයක් යටතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ආයෝජනය කර තිබුණු ස්ථාවර තැන්පතුවක්, කල් | 2023 | මුල්‍ය කළමනාකරණය ප්‍රශස්ථ ලෙස සිදුකල යුතුය. | අදාල මුදල මාස 11 ක කාලයක් ආයෝජනය කර දින 25 ක් සඳහා ආයෝජනය නොකරන ලද්දේ අදාල පියවිම් 2022 දෙසැම්බර් 31 සිදු කිරීම සඳහා වේ. | මේ සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඉකුත් වීමට දින 66 කට ප්‍රථම නිදහස් කරගැනීම හේතුවෙන් රු1,125,000 ක අලාභයක් සිදු වී තිබුණි. | | | එබැවින් අදාල ස්වංක්‍රියව කල්පිරෙන තෙක් එය තබා නොමැති බව දන්වා ඇත. | කර නොමැත. |
| (ඇ) | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් රුහුණු රන්සළු අලෙවිසැල් මගින් විකුණුම් සිදුකිරීමේදී මාස 06 කින් ගෙවා අවසන් කිරීමේ පදනම මත ණයට විකුණුම් කරනු ලැබුවද, මාතර, ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්ක වලින් 2017 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා සිදුකල ණයට විකුණුම් වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.25,822,756 ක ණය ශේෂයක් අයවීමට පැවතුණි. | 2023 | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. | 2024 ජනවාරි 01 සිට 2024 මාර්තු 31 දක්වා කාලය තුල රු.1,969,264 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | 2024 ජූලි 31 දින වන විට තවදුරටත් රු.18,401,852 ක ණය ශේෂයක් අයකර ගැනීමට පවතී. |
| (ඉ) | පළාත් මුල්‍ය රීති 116.1 අනුව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කලයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට දකුණු පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් සංකේත 04 කට අදාළව අයකර ගැනීමට ඇති සමස්ථ හිඟ මුදල රු.මිලියන 375.6 ක් වූ අතර එම මුදල තුල අවුරුදු 03 ඉක්මවූ රු. මිලියන 203.96 ක හිඟ | 2023 | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතු අතර අයකල නොහැකි ආදායම් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. | හිඟ ආදායම් අය කර ගැනීම සඳහා 1990 අංක 07 දරන දකුණු පළාත් මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව නීතිමය ක්‍රියා මාර්ග ගැනීම හා අනෙකුත් අය ක්‍රියා මාර්ග ගැනීම සිදු කරමින් පවතින බව දන්වා ඇත. | 2024 සැප්තැම්බර් 30 දින වන විට තවදුරටත් රු.මි 267.90 ක හිඟ බදු ශේෂයක් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ආදායමක් විය. | | | | |
| (ඊ) | **දේපල පැවරීම මත, මත සහතික නිකුත් කිරීම.**<br>පෞද්ගලික ආයතනය සතු දේපල තවත් පෞද්ගලික ආයතනයක් වෙත පැවරීමේදී නිශ්චල දේපල ලෙස රු.104,000,000 ක් වූ තේ කර්මාන්ත ශාලාව (ගොඩනැඟිලි සහ වගාවන් සහිත ඉඩම ඇතුළුව) සහ චංචල දේපල ලෙස රු.232,000,000 ක් වූ යන්ත්‍ර සූත්‍ර හා සවිකිරීම්ද රු.16,000,000 ක් වූ වාහන සහ රු.12,000,000 ක් වූ වෙළඳ ලාභය ලෙසද වර්ගීකරණය කර කෙටුම්පත් ගිවිසුමක්ද ඉදිරිපත් කර මත සහතික ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රයක් 2023 ජනවාරි 09 දින පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි.<br>ඒ අනුව මත ප්‍රකාශයක් ලබා දීම සඳහා පළාත් ආදායම් කොමසාරිස් විසින් පත් කරන ලද කමිටුව විසින් 2023 ජනවාරි 31 දින ලබා දෙන ලද තක්සේරු වාර්තාව අනුව සියළු දේපල වල වටිනාකම රු.243,000,000 ක්ද | 2023 | 1990 අංක 07 දරන මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. | අයදුම්කරු විසින් මත අයදුම්පත හා ඉදිරිපත් කර ඇති කෙටුම්පත් ඔප්පුව මගින් පවරනු ලබන දේපල ලෙස උපලේඛනයේ දක්වා ඇති පරිදි තේ කර්මාන්ත ශාලාව, අනෙකුත් ගොඩනැගිලි, ගස් හා වැවිලි සහ ඒ සම්බන්ධිත අනෙකුත් සියල්ල ලෙස දක්වා ඇත. ඒ අනුව අප විසින් මත සහතික ලබා දීමේ දී එම උපලේඛනයේ සඳහන් කර ඇති දේපල සම්බන්ධව සලකා බලනු ලබන අතර අප විසින් මත සහතිකය ලබා දෙනු ලබන්නේ අයදුම්පත සමඟ ඉදිරිපත්කල කෙටුම්පතෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපල සඳහා වේ. නමුත් විකිණීම හා මිලදී ගැනීම සඳහා සකස් කරන ලද කෙටුම්පත් ඔප්පුවේ ගිවිසුම තුළ උපලේඛනයේ සඳහන් දේපලද ඇතුළත් කර ඇති බව සඳහන් කර ඇත. | මෙම කරුණ දකුණු පළාත් මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව සමාලෝචන මණ්ඩලය වෙත යොමු කර ඇත. |

ගෙවිය යුතු මුද්දර ගාස්තුව රු.9,719,000 ක්ද ලෙස දක්වමින් මත සහතිකයක් ලබා දී තිබුණද ඊට එකඟ නොවී මත අයදුම්කරු විසින් 2023 පෙබරවාරි 09 දින අභියාචනාවක් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව අභියාචනා විභාගයක් පවත්වා තිබුණද, එයට එකඟතාවය පල කර නොතිබුණු බැවින් ඉහත ප්‍රඥප්තියේ 79 (11) වගන්තිය ප්‍රකාරව ගෙවිය යුතු මුද්දර ගාස්තුව දින 07 ක් තුළ සම්පූර්ණ කිරීමට දැනුම් දී තිබුණි. අයදුම්කරු විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. ඒ අනුව එසේ නොගෙවන ලද රු.9,719,000 ක් වූ මුද්දර ගාස්තුව මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව පැහැර හැර ඇති මුද්දර ගාස්තුවක් ලෙස නිරීක්ෂණය විය.

**05. මතභේදයට තුඩු දුන් ගනුදෙනු**

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අංක L/2940 දරන දීර්ඝ කාලීන බදුකරය යටතේ 1965 වර්ෂයේ සිට 1995 ජනවාරි 11 දින දක්වා අකුරැස්ස විවිධ සේවා සමුපකාර සමිතිය වෙත | 2021 | දීර්ඝ කාලීන බදුකරය අනුව සහ රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහයෙහි විධි විධාන අනුව කටයුතු කළ යුතුය. | බදු කාර්යය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවත් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බව | ඉදිරි කටයුතු සඳහා උපදෙස් ඉල්ලා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ඇත. |

| | |
|---|---|
| රජයේ ඉඩමක් ලබා දී තිබුණු අතර, 1995 වර්ෂයෙන් පසු විගණිත දිනය වූ 2022 මාර්තු 09 දින දක්වා එනම් වසර 26 ක් දක්වා දීර්ඝ කාලීන බදු ගිවිසුමක් නොමැතිව හා බදුකුලී ගෙවීමෙන් තොරව තවදුරටත් අනවසරයෙන් ඉඩම භුක්තිවිඳින බවත්, 1995 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අය කළ යුතු දීර්ඝ කාලීන බදුකුලී එකතුව රු.5,230,000 ක් සහ 2010 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා නව තක්සේරු වාර්තා මත පදනම්වූ බදු කුලියත් අයකරගෙන නොතිබුණි. එමෙන්ම රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහයේ ඉඩම් ආඥා පනතේ 454 වන අධිකාරියෙහි 229 නියෝගයෙහි 4 වන වගන්තිය ප්‍රකාරව රක්ෂිත ඉඩම්වල කවුරුන් වුවද පදිංචිවීම වලක්වාලිය යුතු අතර, සමුපකාර සමිතිය විසින් නිල්වලා ගඟ රක්ෂිතය තුළ පළමු මහලේ කොන්ක්‍රීට් තට්ටුව (Slab) දැමීම දක්වා වැඩ අවසන් කර ඇති ගොඩනැගිල්ලක් අනවසරයෙන් ඉදිකරමින් පැවතීම සම්බන්ධයෙන් 1979 අංක 07 දරන | දැනුම් දී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සන්තකය ආපසු ලබා ගැනීමේ පනත ප්‍රකාරව අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් විසින් කටයුතු කර නොතිබුණි. | | | | |
| (ආ) | තල්ගස්යාය තේ කර්මාන්ත ශාලාව පිහිටි ඉඩම වෙනත් පාර්ශවයකට පැවරීමට අදාළව පළමු තක්සේරු වටිනාකම රු.354,150,000 ක් වූ අතර, ඒ සඳහා අභියාචනා කළ පසු දෙන ලද තක්සේරු වටිනාකම රු.276,000,000 ක් වීමෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සමාන ශ්‍රේණියක නිලධාරීන් දෙදෙනෙකු අවස්ථා දෙකකදී දෙන ලද තක්සේරු වටිනාකම් අතර රු.78,150,000 ක පරස්පරතාවයක් පැවතුණි. මේ සම්බන්ධ විගණන විමසුමෙන් අනතුරුව පළාත් ආදායම් කොමසාරිස් විසින් පත්කරන ලද විශේෂ කමිටුව විසින් එම දේපල වටිනාකම රු.248,000,000 ක් ලෙස නැවත තක්සේරු කර තිබීමෙන් දේපල තක්සේරු කිරීමේ කාර්යය සඳහා විධිමත් නිර්ණායක සකස් කිරීමකින් තොරව එක් එක් නිලධාරීයාගේ අභිමතය පරිදි | 2022 | වත්කම් තක්සේරුව නිශ්චිත නිර්ණායක පදනම් කරගෙන සංගතභාවයකින් යුතුව ඉටුකළ යුතුය. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි මත ප්‍රකාශනය මගින් ලබා දෙන ලද තක්සේරු වටිනාකම් දෙකෙහි වෙනසක් පවතින බව පිළිගනු ලබන බවත්, දෙපාර්තමේන්තුව තුළ එතෙක් පැවති ක්‍රමවේදයන්, සමාලෝචනය කර විධිමත් නිර්ණායකයන් සකස් කිරීමට 2022 දෙසැම්බර් 16 දින කමිටුවක් පත් කරන ලදී. එම කමිටුවේ නිර්ණායක හා කාර්ය පටිපාටි 2023 ජනවාරි සිට දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක කර ඇත.මේ අනුව ඉදිරියට තක්සේරු කිරීම්වල විචලතාවයන් අවම වනු ඇති බව සඳහන් කර ඇත. | අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් සිදුකරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තක්සේරු වටිනාකම් ලබා දී තිබුණි. | | | | |
| (ඇ) | 2008 අගෝස්තු මස 28 දින ධාවනයට නුසුදුසු බැවින් දකුණු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ යකඩ සඳහා විකුණන ලද මිට්සුබිෂි ජීප් රථය සහ ටොයෝටා ලෑන්ඩ් කෲෂර් රථය 2009 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වාම පුද්ගලික නම්වලින් ආදායම් බලපත්‍ර ලබාගෙන තිබුණි. | 2022 | සිද්ධියට අදාළව වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන රජයට වූ හානිය අයකර ගත යුතුය. | මේ සම්බන්ධව තවදුරටත් කරුණු සොයා බලා විගණනයට වාර්තා කරන බව දැනුම් දී ඇත. | 2024 ජුනි 27 දින විමර්ශන කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදුකරනු ලබන බව වාර්තා කර ඇත. |
| (ඈ) | දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමින් ලියාපදිංචි කර තිබූ වාහන 02 ක් ආයතනය මඟින් වාහන අපහරණය කිරීම් යටතේ දක්වා නොමැති වුවද එම වාහන දෙක පිළිවෙලින් 2018 වර්ෂයේදී පෞද්ගලික නම් යටතේ ලියාපදිංචි කර තිබුණු අතර 2023 වර්ෂය දක්වාම ආදායම් බලපත්‍ර ලබාගෙන තිබුණි. | 2022 | සිද්ධියට අදාළව වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන රජයට වූ හානිය අයකර ගත යුතුය. | මේ සම්බන්ධව තවදුරටත් කරුණු සොයා බලා විගණනයට වාර්තා කරන බව දන්වා ඇත. | 2024 ජුනි 27 දින විමර්ශන කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදුකරනු ලබන බව වාර්තා කර ඇත. |

**06. දූෂණ අක්‍රමිකතා**

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | හම්බන්තොට දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ගිලන් රථ 03 ක එන්ජින් අංක වෙනස්වීම | 2021 | කඩිනමින් විමර්ශන කමිටු නිර්දේශයන් ක්‍රියාත්මක කල යුතුය. | විමර්ශන කමිටුවේ නිර්දේශයන් අනුව ඉදිරි කටයුතු සිදුකරන බව දැනුම් දී ඇත. | මේ සම්බන්ධව පත්කරන ලද විමර්ශන කමිටුවේ නිර්දේශ ලැබීමෙන් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සම්බන්ධයෙන් 2023 නොවැම්බර් 16 දින විමර්ශන කමිටුවක් පත්කර තිබුණද, විගණිත දිනය දක්වාම වගකිව යුත්තන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | | | | අනතුරුව ඉදිරි කටයුතු සිදුකරනු ලබන බව වාර්තා කර ඇත. |
| (ආ) | 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ වෛද්‍ය සැපයුම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (MSMIS) මඟින් කල් ඉකුත් වූ ඖෂධ වසරක් තුළ හඳුනාගෙන අපහරණය සඳහා කටයුතු කර, මුදල් රෙගුලාසි 102 සිට 109 ප්‍රකාරව පොතෙන් කපාහැරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කල යුතු බව 2021 දෙසැම්බර් 08 දිනැති අංක 01/2021 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛයේ දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම කමිටු වාර්තා මඟින් අනාවරණය වූ රු.මිලියන 23.6 කට ආසන්න කල් ඉකුත් වූ ඖෂධ PRONTO පද්ධතිය මඟින් විධිමත් අවසරයකින් තොරව භාණ්ඩ සමීක්ෂණය සඳහා ලබාදී තිබූ මුරපද | 2021 | පද්ධතිය මඟින් ඖෂධ ඉවත් කිරීම සම්බන්ධ මූලික විමර්ශනයේ නිර්දේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. | මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් 2023 සැප්තැම්බර් 27 දිනැති ලිපිය මඟින් ඉල්ලීම සිදුකලද මේ දක්වාම ඒ සඳහා උපදෙස් ලබාදී නොමැති බව සඳහන් කර ඇත. | PRONTO පද්ධතිය මගින් අනවසරයෙන් ඖෂධ ඉවත් කිරිම සම්බන්ධව තොරතුරු සොයා බැලීමට පත්කල විමර්ශන කමිටුවේ නිර්දේශ පරිදි මේ සම්බන්ධව විධිමත් විමර්ශනයක් පැවැත්වීම සඳහා රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත තොරතුරු යොමුකර ඇති බව වාර්තා කර ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | භාවිතා කර මකා දමා තිබුණි. | | | | |
| **07.** | **ආර්ථික නොවූ ගණුදෙනු** | | | | |
| (අ) | 2023 ජුනි 30 දිනට හික්කඩුව අභිමංසල ගොඩනැගිල්ල බදු ලබාගත් ආයතනයෙන් රුහුණු සංචාරක කාර්යාංශය වෙත රු.5,703,750 ක මුදලක් අයවීමට පැවතුණි. එමෙන්ම, ගොඩනැගිල්ල සඳහා රු.47,722,156 ක වියදමක් දරා තිබුණද අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හා සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සඳහා දායකත්වයක් ලබාදීමට නොහැකි වීම මත හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නැවත පවරා ගෙන තිබුණි. | 2023 | අයකර ගැනීමට ඇති හිඟ මුදල් අයකර ගැනීමට හා අදාළ වත්කම් ඵලදායී කටයුතු සඳහා යෙදවීමට අවශ්‍ය කටයුතු කල යුතුය. | හිඟ බදු මුදල් අය කර ගැනීමට ලිඛිතව දන්වා ඇත. මේ සඳහා නිතීමය කටයුතු සිදු වෙමින් පවතී. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට මේ දක්වාම කටයුතු කර නොමැත. |
| (ආ) | කඹුරුපිටිය මූලික රෝහලට මධ්‍ය වායු සමීකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා රු.14,416,500 ක බදු රහිත වටිනාකමට 2015 සැප්තැම්බර් 28 දින පුද්ගලික සමාගමක් සමඟ ප්‍රධාන අමාත්‍යාංශය ගිවිසුම් ගත වී තිබූ අතර, 2015 දෙසැම්බර් 28 දින වන විට වැඩ අවසන් කල යුතුව පැවතුණි. එසේ | 2023 | රජයට සිදුවූ හානිය සම්බන්ධයෙන් වගකිව යුත්තන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ප්‍රධාන අමාත්‍යාංශය මඟින් පත්කර ඇති කමිටුවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු වාර්තා කරන බව සඳහන් කර ඇත. | මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කිරීම සඳහා පත් කරන ලද කමිටුව විසින් අදාළ වාර්තාව 2024 අගෝස්තු 05 දිනැතිව අමාත්‍යාංශ ලේකම් වෙත භාර දී ඇති අතර, එම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වුවද නියමිත දිනට හෝ පසුව ව්‍යාපෘතිය නිමකර විධිමත්ව භාරදී නොතිබුණි. විගණිත දිනය වූ 2023 නොවැම්බර් 15 දින වන විට අදාළ සමාගම වෙත එකතුව රු.13,727,482 ක මුදලක් දෝෂ නිවැරදි කිරීම වෙනුවෙන්ද, විදුලිය ලබා ගැනීම සහ සේවා කිරීම සඳහා වෙනත් ආයතන වෙත රු.938,940 ක්ද වැයකර තිබුණද මධ්‍ය වායු සමීකරණ පද්ධතිය සවි කරන ලද අවස්ථාවේ සිටම ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ සිට ව්‍යාපෘතිය අවසන් කිරීම දක්වාම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කර නොතිබුණි. | | | | වාර්තාව මඟින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ප්‍රකාරව ඉදිරියේදී කටයුතු සිදු කරනු ලබන බව දන්වා ඇත. |
| (ඇ) | බලපිටිය මූලික රෝහල සඳහා මධ්‍ය වායු සමීකරණ පද්ධතියක් රු.7,678,179 ක් වැයකර 2016 ජුනි 20 දින ස්ථාපනය කර තිබුණද එදින සිටම දෝෂ සහගත තත්ත්වයේ පැවති අතර, එය 2017 දෙසැම්බර් 03 දින වන විට සම්පූර්ණයෙන්ම අක්‍රියව පැවතුණි. ඒ | 2023 | රජයට සිදුවූ හානිය සම්බන්ධයෙන් වගකිව යුත්තන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ප්‍රධාන අමාත්‍යාංශය මඟින් පත්කර ඇති කමිටුවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව සඳහන් කර ඇත. | පරීක්ෂණ කමිටු වාර්තාව ලද පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදුකරනු ලබන බව දන්වා ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අනුව රෝහල් දෙකෙහි ශලාගාර පවත්වා ගැනීම සඳහා රු.4,365,980 ක මුදලක් වැයකර Split AC යන්ත්‍ර 22 ක් සවිකර තිබූ අතර විගණිත දින දක්වාම මෙම ව්‍යාපෘති අසාර්ථක වීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන රජයට සිදුවූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | | |
| (ඇ) | 2016 වර්ෂයේ සිට 2022 ඔක්තෝබර් මස දක්වා රු.14,955,094 ක වියදමක් දරමින් දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කර තිබුණද දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශකවරුන් එම කාර්යයෙන් ඉවත්වීම තුළ අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට නොහැකි වී තිබුණි. තොරතුරු කළමනාකරණ පද්ධතියේ කටයුතු සඳහා අන්තර්ජාල පහසුකම් ලබා ගැනිමට ලබාගත් දුරකථන සිම්පත් වෙනුවෙන් 2017 සිට 2023 | 2023 | වියදම් දරන ලද අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | 2019 වර්ෂයේ මැයි මස සිට මාණ්ඩලික නිලධාරීන්ට පමණක් සිම්පත් සඳහා ගෙවීම් කරනු ලැබුවද 2024 අප්‍රේල් 01 දින සිට සියලු සිම්පත් විසන්ධි කරන ලෙසට අදාළ ආයතන වෙත දැනුම් දී ඇත. ඒ අනුව මේ වන විට අන්තර්ජාල පහසුකම් සඳහා කිසිඳු ගෙවීමක් සිදු නොකරන බව සඳහන් කර ඇත. | මෙම පද්ධතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට මේ දක්වාම කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| ඔක්තෝබර් දක්වා රු.2,614,541 ක් ගෙවා තිබුණි. මෙම සියළු සිම්පත් 2018 ජූලි 29 දින විසන්ධි කොට 2019 මැයි සිට මාණ්ඩලික නිලධාරින්ට පමණක් සිම්පත් ලබාදී ඒ වෙනුවෙන් රු.842,326 ක් ගෙවීම් කර තිබුණද මෙම සිම්පත් අදාළ රාජකාරි කටයුතු සඳහා යොදා ගන්නා බව නිරීක්ෂණය නොවීය. එමෙන්ම,තොරතුරු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.8,780,450 ක් වැයකර ලබාදුන් ටැබ් පරිගණක 225 හි වර්තමාන හිමිකාරීත්වය හා ක්‍රියාකාරිත්වය පිළිබඳව ප්‍රමාණවත් තොරතුරු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි. | | | | |

**08.** **හඳුනා ගන්නා ලද පාඩු**

| | | | | |
|---|---|---|---|---|
| දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, 2001 වර්ෂයේදී, විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම සඳහා, පෞද්ගලික ආයතනයක් සමඟ, එළඹ තිබුණු ගිවිසුම ප්‍රකාරව ගෙවීම් සිදු නොකළ බව දක්වමින් සැපයුම්කරු 2002 | 2022 | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කරන බව සඳහන් කර ඇත. | ඉදිරිපත් කර ඇති වාර්තාව තුළින් පිළිගත හැකි නිර්දේශයන් සහිතව විමර්ශනයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කර නොමැත. ඒ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වර්ෂයේ නොවැම්බර් මස 15 වන දින දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට එරෙහිව නඩුවක් පවරා තිබුණි. 2019 මැයි 23 දිනැති අභියාචනාධිකරණ නඩු තීන්දුව ප්‍රකාරව සැපයුම්කරුට රු.2,448,734 ක මුදලක් සහ 2021 දෙසැම්බර් 21 දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා ඉහත මුදල මත වසරකට සියයට 34 ක් බැගින් වූ පොලී මුදලක් ගෙවිය යුතු බවට තීන්දු කර තිබුණද නියමිත දිනයේදී අධිකරණ තීන්දුව ප්‍රකාරව ගෙවීම් නොකිරීම හේතුවෙන් 2022 වර්ෂයේ දෙසැම්බර් මස 14 වන දින අදාළ මුදල ලෙස රු.2,448,734 ක් සහ පොළිය ලෙස රු.2,228,327 ක් වශයෙන් එකතුව රු.4,677,061 ක් ගෙවා තිබුණි. | | | | අනුව අධ්‍යාපන අමාත්‍යාංශය ලේකම් වෙත 2024 ජුනි 12 දින උපදෙස් සඳහා යොමු කර තිබුණද, මේ දක්වාම අවශ්‍ය ක්‍රියමාර්ග ගෙන නොමැත. |

**09. කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | දොඩන්දූව ගා/රෝහණ මහා විද්‍යාලයේ ඉදිකරන ලද තාක්ෂණ විද්‍යාගාරය 2016 වර්ෂයේ විවෘත කර තිබුණද, විද්‍යාගාර ගොඩනැගිල්ලට අවශ්‍ය විද්‍යාගාර උපකරණ ලබා නොදීමෙන් | 2021 | සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. | අවශ්‍ය ලී බඩු හා උපකරණ, ලබාදෙන ලෙස රේඛීය අමාත්‍යාංශයට ලිඛිතව අවස්ථා 02 කදී දැනුම් දුන්නද, භාණ්ඩ මෙතෙක් ලැබී නොමැත. එබැවින් එම පරිශ්‍රය වෙනත් | තාක්ෂණ විද්‍යාගාර ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු මේ දක්වාම ඉටු කර ගැනීමට නොහැකි වී ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | විද්‍යාගාර ගොඩනැගිල්ල නිෂ්ක්‍රීයව පැවතුණි. | | | කාර්යයන් සඳහා භාවිතා කරන බව සඳහන් කර ඇත. | |
| (ආ) | **ප්‍රධාන ලේකම් කාර්යාලයේ පැති බැම්ම ඉදිකිරීම** | | | | |
| (i) | ප්‍රධාන ලේකම් කාර්යාලයේ ඉදිරිපස පැති බැම්ම ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පෞද්ගලික ආයතනයට රු.37,362,532 ක බදු රහිත මිලකට පවරා තිබුණු අතර එය බදු රු.2,989,002 හා රු.3,735,465 ක හදිසි අවිනිශ්චිත ප්‍රතිපාදන සමඟ රු.44,087,000 ක මුදලකින් සමන්විත විය. කර්මාන්තයේ පළමු අදියර 2021 අගෝස්තු 03 දින ආරම්භ වී 2022 මාර්තු 31 එනම් දින 240 ක කාලයකින් නිම කල යුතු වුවත් අවස්ථා 02 කදී දින දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, කර්මාන්තය කරගෙන යන අතරතුර 2022 අගෝස්තු 02 දින සිට ඉදිකිරීම් නතර කර කර්මාන්තයේ ඉතිරි වැඩ කොටස් දෙවන අදියර වශයෙන් සලකා නව කොන්ත්‍රාත්තුවක් ලෙස එම පෞද්ගලික ආයතනයටම රු.34,368,110 ක බදු රහිත මිලකට පවරා | 2023 | විශේෂ විමර්ශනයක් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මුළු පිරිවැය ඇස්තමේන්තුව මත පැති බැම්ම සම්පූර්ණයෙන් ඉදිකිරීම සඳහා රු.37,362,532ක වැට් රහිත මුදලකට කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කල ද රටේ පැවැති අධි උද්ධමනකාරී තත්ත්වය, වෙළඳපොළ තුළ භාණ්ඩ හිඟ වීම තෙල් අර්බුදය හා රටේ ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් කොන්ත්‍රාත් කටයුතු සිදු කිරීම ප්‍රසම්පාදන තීරණය මත අවසන් කල අතර 2022 මැයි 24 දිනැතිව නිකුත්කර ඇති 03/2022 අංක සහිත ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පරිදි කටයුතු කර කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීම සහ නැවත ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා නිසි බලය ලබා දී ඇත. ඒ අනුව, පැති බැම්ම ඉදිකිරීම (ඉතිරි වැඩ) සඳහා ප්‍රසම්පාදනය සිදුකර | මේ සම්බන්ධව විශේෂ විමර්ශන කමිටුවක් පත් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | තිබුණි. එය බදු සඳහා රු.4,124,173 ක්, අවිනිශ්චිත ප්‍රතිපාදන (සියයට 10) රු.3,436,811 ක් හා මිල වැඩිවීම (සියයට 10) සඳහා රු.3,436,405 ක් ලෙස මුළු පිරිවැය රු.45,365,499 ක් විය. 2022 සැප්තැම්බර් 10 දින ආරම්භ වී 2022 දෙසැම්බර් 20 දින නිම කල යුතුව තිබුණද අවස්ථා 03 කදී දින දීර්ඝ කිරීම් සමඟ 2023 මාර්තු 31 දින කර්මාන්තයේ වැඩ අවසන් කර තිබුණි. | | | දෙවන කොන්ත්‍රාත්තුවේ කටයුතු ආරම්භ කර 2023 මාර්තු 31 දින කර්මාන්තය නිම කර ඇති බව දැනුම් දී ඇත. | |
| (ii) | කර්මාන්තයේ පළමු අදියර වෙනුවෙන් අත්තිකාරම් මුදල්ද ඇතුළුව බිල්පත් 08 කින් රු.30,060,799 ක් ද දෙවන අදියර වෙනුවෙන් අත්තිකාරම් මුදල් ද ඇතුළත්ව බිල්පත් 04 කින් රු.29,755,738 ක් ද වශයෙන් රු.59,816,537 ක් මුළු ගෙවීම් ලෙස කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. (දෙවන අදියරේ අවසන් බිල්පත හැර) පළමු හා දෙවන කොන්ත්‍රාත්තුවට අදාළව රු.16,326,201 ක (රු.7,135,820 ක් දෙවන කොන්ත්‍රාත්තුවේදී රු.9,190,319 ක්) | 2023 | විශේෂ විමර්ශනයක් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | දෙවන ඡේදයේ සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුට පළමු කොන්ත්‍රාත්තුව වෙනුවෙන් බිල්පත් 08කින් රු.30,060,798ක් හා දෙවන කොන්ත්‍රාත්තුව වෙනුවෙන් බිල්පත් 04කින් රු.29,755,737ක් ගෙවා ඇත. නමුත් 01 හා 02 කොන්ත්‍රාත්වලට අදාළව රු.16,326,201 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා නොමැති බව පැතිබැම්ම සඳහා සකස් කරන ලද මුල් ඇස්තමේන්තුව හා ජාතික ගොඩනැගිලි | මේ සම්බන්ධව විශේෂ විමර්ශන කමිටුවක් පත් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා ඇති බව නිරීක්ෂණය කරන අතර එය බදු සමඟ රු.18,775,131 ක් (16,326,201*1.15) බව නිරීක්ෂණය කෙරේ. තවද, කොන්ත්‍රාත්කරුට රු.11,398,346 ක ගෙවිය යුතු අත්තිකාරම් මුදල් නියමිත දිනට කලින් ගෙවා තිබුණු අතර එයින් රු.10,507,510 ක් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල නොකිරීම නිසා මුදල් ගලා ගොස් තිබූ බව නිරීක්ෂණය විය. | | | පර්යේෂණ සංවිධානයේ නිරීක්ෂණයන්ට අනුකූලව සකස් කරන ලද අවසාන සැලැස්ම අනුව සකස් කරන ලද ඇස්තමේන්තුව පිළිබඳව විධිමත්ව පරීක්ෂා කර සංසන්දනාත්මක වාර්තාවක් ඉංජිනේරුවරු දෙදෙනකුගේ හා තාක්ෂණික නිළධාරීන් තිදෙනකුගෙන් යුත් කමිටුවක් මඟින් ලබා ගෙන ඇත. ඒ අනුව මෙම කර්මාන්තය සම්පූර්ණ කිරිම සඳහා සංශෝධන සැලැස්ම අනුව වැයවන මුදල රු.56,195,179ක් බව අනාවරණය වී ඇත. එම අගය පළමු හා දෙවන කොන්ත්‍රාත් දෙකෙහිම ගෙවා ඇති සමස්ථ මුදල වන රු. 55,584,432 ට වඩා වැඩි බැවින් රජයට පාඩුවක් සිදු වී නොමැති බව සඳහන් කර ඇත. | |
| (iii) | එමෙන්ම ඉදිරිපස පැති බැම්ම ඉදිකිරිම සඳහා බැරකම් ලෙස රු.5,264,418 ක් තිබුණද, පිළිතුරට අනුව බැරකම් ලෙස රු.25,581,761 ක් හඳුනා ගෙන තිබුණි. එහෙත් අවසාන බිල්පතට අනුව | 2023 | විශේෂ විමර්ශනයක් සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | බැරකම් හඳුනා ගැනීමේදී වැඩිපුර රු.5,264,418 ක් බැරකම් වල ඇතුළත් වීම පිළිගෙන ඇත. බැරකම් හඳුනා ගන්නා අවස්ථාව වන විට කොන්ත්‍රාත්තුවේ අවසාන බිල්පත ඉදිරිපත් කර නොමැති | මේ සම්බන්ධව විශේෂ විමර්ශන කමිටුවක් පත් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| කොන්ත්‍රාත්කරුට ගෙවීම වෙනුවට කොන්ත්‍රාත්කරුගෙන් රු.1,811,259 ක් අයවිය යුතු ලෙස දක්වා තිබුණු බැවින් වැරදි ඇස්තමේන්තු මත පදනම්ව ඇති කර තිබූ රු.25,587,761 ක් ඇති කල නොහැකි බැරකමක් විය. | | බැවින් කොන්ත්‍රාත්කරුගේ අයවීමක් තිබුණු බවට තහවුරුවක් නොවීය. මෙහි ඇස්තමේන්තුව වැරදි ඇස්තමේන්තුවක් නොව ඇස්තමේන්තුවේ ඇති වැඩ කොටස් යාබද පෞද්ගලික ඉඩම් හිමියකු විසින් පැති බැම්මේ කොටසක් එම ඉඩමේ පිවිසුම් මාර්ගය සමඟ ඉදිකිරීම නිසා ඉටු කිරීමට නොහැකි වීම නිසා ඇස්තමේන්තු වැඩ කොටස් ඉතිරි වීම මත අවසාන බිල්පතෙහි අයකිරීමක් පැවතීම වැරදි ඇස්තමේන්තුවක් මත පදනම්ව සිදුවූවක් නොවන බව අවසාන බිල්පතෙහි අය කිරීමක් සිදු වුයේ අවසාන බිල්පත මඟින් මිල විචලන ගැලපීම සිදු කිරීමත් පෞද්ගලික ඉඩම් හිමියකු විසින් පැති බැම්මේ යාබද කොටසක් ඉදිකිරීමත් නිසා බව සඳහන්කර ඇත. | |

**10. නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දින වන විට රු.1,391,298 ක | 2022 | මෙම ඉඩම කාර්යාංශයට පවරා ගැනීමට කටයුතු | අධ්‍යක්ෂක මණ්ඩලය සමඟ සාකච්ඡා කර කඩිනමින් මේ සඳහා | ඉඩම පවරා ගැනීමට අදාළ කටයුතු මේ |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වටිනාකමක් වූ රුහුණු සංචාරක කාර්යාංශයට අයත් අම්බලන්ගොඩ තොරතුරු මධ්‍යස්ථානය 2018 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පැවතුණි. | | කළ යුතුය. | ක්‍රියා කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. | දක්වාම සිදුකර නොමැත. |
| (ආ) | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව සතු තක්සේරු වටිනාකම රු.7,945,730 ක් වූ ජීප් රථයක ටයර් ගෙවී යාම හේතුවෙන් සහ ඒ සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් 2022 වර්ෂයේ මැයි මස සිට එනම්, වසරකට අධික කාලයක් ධාවනය කිරීමකින් තොරව දක්ෂිණපාය පරිශ්‍රය තුළ ගාල්කර තිබූ අතර ජීප් රථය දිරාපත් වෙමින් පැවතුණි. | 2023 | මෙම ජීප් රථය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ නොමැති නම් භාවිතා කල හැකි ආයතනයකට පවරා දීමට කටයුතු කල යුතුය. | මෙම රථය නිරන්තර අලුත්වැඩියාවන්ට ලක් වන බැවින් නඩත්තු වියදම් අධික බැවින් ද දෙපාර්තමේන්තුව සතු ප්‍රතිපාදන සීමිත බැවින් ද මෙම රථය ප්‍රධාන ලේකම් වෙත ලබා ගන්නා ලෙස ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීම් කර ඇති බව දන්වා ඇත. | මෙම ජීප් රථය නිරන්තර අලුත්වැඩියාවන්ට ලක් වන බැවින් නඩත්තු වියදම් අධික බැවින්ද දෙපාර්තමේන්තුව සතු ප්‍රතිපාදන සීමිත බැවින් ද මෙම රථය ධාවනය කිරීමකින් තොරව පවතින බව දන්වා ඇත. |
| (ඇ) | දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගැසට් කර තිබූ වැව් 905 ක ආක්‍රමණශීලී ජලජ පැළෑටි ඉවත් කර ප්‍රතිසංස්කරණය සඳහා රු.මිලියන 84 ක් වටිනා යන්ත්‍රයක් මිලදී ගෙන 2023 සැප්තැම්බර් 14 දිනට දින 587 ක් ගත වී තිබුණද, යන්ත්‍රය 2022 පෙබරවාරි 02 දින සිට 2023 සැප්තැම්බර් 14 | 2023 | යන්ත්‍රය ඵලදායිව උපයෝජනය කල යුතුය. | මෙම යන්ත්‍රය මිල දී ගන්නා ලද්දේ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් පිරිසකගේ මැදිහත් වීමෙන් මීට සර්වසම යන්ත්‍රයක ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකාවේදී ප්‍රායෝගිකව අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ය. දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ඉදිරියේ දී ලැබෙන | මෙම යන්ත්‍රය ඵලදායී ලෙස යොදවා ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දින දක්වා දින 353 කදී පැය 414 ක් පමණක් භාවිතා කර තිබුණි. එමෙන්ම වැව් 06 ක ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යන්ත්‍රය යොදා ගෙන තිබුණද ප්‍රතිසංස්කරණය කර තිබුණේ වැව් 03 ක් පමණක් වීම නිසා යන්ත්‍රය දින 234 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. ඉන් අළුත්වැඩියා කටයුතු සඳහා දින 199 ක් ගතවී තිබූ අතර ඒ අනුව ආනයනික සමාගම ප්‍රමාණවත් සේවා සැපයීමක් සහ අළුත්වැඩියාවක් සිදු නොකරන බව තහවුරු වූ බැවින් මිලදී ගැනීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් හා අවශ්‍යතා හඳුනාගත්තේ නම් මෙවැනි නිෂ්කාර්ය වැය බරක් වළක්වා ගැනිමට හැකියාව තිබුණි. | | | ප්‍රතිපාදන සැලකිල්ලට ගෙන දේශීය අවශ්‍යතාවය ද පදනම් කර ගෙන වැව් විශාල ප්‍රමාණයක ආක්‍රමණශීලී ජලජ පැළෑටි ඉවත් කිරීමට නියමිත බව සඳහන් කර ඇත. | |

**11.** **වාහන උපයෝජනය**

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | ඇල්පිටිය මූලික රෝහලෙහි ගිලන් රථය සඳහා 2022 අප්‍රේල් 11 දින රු.363,192 ක ඇස්තමේන්තුව අනුව, පෞද්ගලික ආයතනයක් වෙත අළුත්වැඩියාව සඳහා ඉදිරිපත් කර ඒ සඳහා 2022 මැයි 19 දින රු.362,753 ක බිල්පතක් ඉදිරිපත් කර තිබුණද, නැවත රථයේ | 2022 | කඩිනමින් අලුත්වැඩියා කර ඵලදායී ලෙස භාවිතයට ගත යුතු අතර මෙයට හේතු වූ කරුණු සොයා බැලීමට කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ පිළිගනු ලබන බවත් එම අළුත්වැඩියා දෙකෙන් පසු නැවතත් ඇතිවූ දෝෂයක් හේතුවෙන් තෙවන අළුත්වැඩියාවක් සඳහා ඉදිරිපත්කර ඇත. ඒ සඳහා දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු විසින් නිර්දේශ | මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ඇති වූ දෝෂයක් හේතුවෙන් රු.651,019 ක ඇස්තමේන්තුවක් මත අළුත්වැඩියාව සඳහා 2022 මැයි 25 දින රථය අදාළ ආයතනයටම භාරදී තිබුණි. එහෙත් එම අලුත්වැඩියාවෙන් පසුද රථයේ දෝෂ නිරාකරණය නොවූ බැවින් 2022 නොවැම්බර් 28 දින නැවතත් රු.1,679,877 ක ඇස්තමේන්තුවක් මත භාරදී තිබුණි. යාන්ත්‍රික ඉංජිනේරු ඒකකයේ නිර්දේශයන් වරින් වර වෙනස් වීම හා විධිමත් ලෙස නොලැබීම මත 2023 පෙබරවාරි 23 දින වන විටද ගිලන්රථය අළුත්වැඩියාවෙන් තොරව අදාළ ආයතනයේ පැවතුණි. | | | ලබාදිය නොහැකි බව ඇල්පිටිය රෝහල් වෛද්‍ය අධිකාරී වෙත දන්වා ඇති බැවින් ඇල්පිටිය රෝහල් සංවර්ධන කළමනාකරණ කමිටුවේදී ගත් තීරණයක් මත තාක්ෂණ නිලධාරී කමිටුවක් මගින් මේ සඳහා නිර්දේශයක් ලබා ගැනීමට කටයුතුකර ඇති බව සඳහන් කර ඇත. | |
| (ආ) | අගුණුකොලපැලැස්ස රෝහලට අයත් ගිලන් රථයක් 2017 ඔක්තෝබර් 14 දින සිදුවූ අනතුරට අදාළ අලුත්වැඩියා වියදම වූ රු.1,438,168 ක් මුදල රියදුරුගෙන් අයකරගත යුතු බවට නිර්දේශ ලබාදී තිබුණද, 2019 ජනවාරි 19 දින රියදුරු මියගොස් ඇති බැවින් නියමිත කාලය තුළ මූල්‍ය රීති අනුව ක්‍රියාකර රියදුරුගෙන් අදාළ හානිය අයකර | 2023 | වාහන අනතුරු සම්බන්ධයෙන් කාලීනව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. | 2023 නොවැම්බර් 25 දින පත්කල පරීක්ෂණ කමිටුවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා ඇත. | වාහන අනතුරට අදාල අලාභය විධිමත් පරිදි අය කර ගැනීමට කටයුතු නොකළ නිලධාරින් සිටි නම් ඒ සම්බන්ධව විමර්ශනයක් සිදු කිරීම සඳහා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අංක SPH/ADM/GC |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ගැනීමේ අවස්ථාව නිලධාරීන්ගේ ප්‍රමාදය හේතුවෙන් මඟහැරී තිබුණි. | | | | /අ/H/49 හා 2023 නොවැම්බර් 25 දිනැති ලිපිය මගින් මූලික විමර්ශන කමිටුවක් පත් කර තිබුණද, 2024 සැප්තැම්බර් 30 දින දක්වාම අදාළ කමිටු වාර්තාව ලබා දීමට කටයුතු කර නොමැත. |
| (ඇ) | වලස්මුල්ල මූලික රෝහලට අයත් රථයක් 2021 ජුනි 25 දින අනතුරට ලක්ව තිබූ අතර 2022 පෙබරවාරි 10 දිනැති මූලික විමර්ශන වාර්තාව අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර ජාතික රක්ෂණ භාරකාර අරමුදල විසින් රු.9,000,000 ක උපරිමයකට යටත්ව ගෙවීම් කල හැකි බව දන්වා තිබුණද පෞද්ගලික ආයතනයකින් සිදුකර තිබූ රු.8,890,620 ක් වූ අළුත්වැඩියා වියදමින් රු.6,312,568 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වෙනස වූ රු.2,578,052 ක මුදල රජය විසින් දැරීමට සිදුවී තිබුණද ඒ සම්බන්ධව වැඩිදුර ක්‍රියාමාර්ග ගෙන | 2023 | වාහන අනතුරු සම්බන්ධයෙන් කාලීනව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. | 2023 අගෝස්තු 10 දිනැති මූලික විමර්ශන කමිටුවේ නිර්දේශ පරිදි කටයුතු කරන බව දන්වා ඇත. | 2023 දෙසැම්බර් 06 දින ත්‍රි පුද්ගල විමර්ශන මණ්ඩලයක් පත්කර තිබුණද, 2024 සැප්තැම්බර් 30 දින දක්වාම අදාළ වාර්තාව ලබා දීමට කටයුතු කර නොමැත. |

නොතිබුණි.

## 12. අවිධිමත් ගණුදෙනු

| | | | | | |
|---|---|---|---|---|---|
| (අ) | උපමාන පාදක සංවර්ධන සැලැස්ම යටතේ, 2018 වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ රු.700,000 ක් සහ 2019 වර්ෂයේ දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රු.1,767,718 ක් ලෙස එකතුව රු.2,467,718 ක් යොදවා ලබුදූව ගොවිපල තුල ඉදිකර තිබූ ජීව වායු ඒකකය 2019 ජුනි 12 දින වැඩ අවසන් කර භාරදී තිබුණද, 2019 ජුනි මස සිටම මෙම ජීව වායු ඒකකයේ ක්‍රියාකාරීත්වයේ ගැටළු පිළිබඳව ගොවිපල කළමනාකරු විසින් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාපෘති) දැනුවත් කර තිබුණද 2022 දෙසැම්බර් මස දක්වාම ක්‍රියාකාරීත්වය යථා තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 | ආරම්භ කරන ලද ව්‍යාපෘති මනාව පාලනය කර පවත්වා ගත යුතු අතර අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. | දැනට මෙම ඒකකය ක්‍රියාත්මක තත්වයේ නොමැති බැව් පිළිගන්නා බවත්, 2019 ජුනි මස සිට වසරක පමණ කාලයක් මෙම ඒකකය ක්‍රියාත්මක වූ බවත්, ඒ අනුව එහි ඇති සණ අපද්‍රව්‍ය ඉවත් කිරීමෙන් අනතුරුව භෞතික පරීක්ෂාවක් සිදුකළ යුතු බවත්, නර්ඩ් ආයතනය වෙත මුදල් ගෙවීමෙන් අනතුරුව පිරිසිදු කර වාර්තාවක් ලබාදිය හැකි බවත්, ඒ අනුව තෝරාගන්නා ලද ආයතනය විසින් දිරා ගිය මල අපද්‍රව්‍ය ඉවත් කිරීමට රු.392,000 ක මුදලකට ගිවිසුම් ගතවීමට කටයුතු කර ඇති බව දැනුම් දී ඇත. | මෙම ජීව වායු ඒකකය ඵලදායී ලෙස යොදවා ගැනීමට 2024 සැප්තැම්බර් මාසය දක්වාම කටයුතු කර නොමැත. |
| (ආ) | දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ දකුණු පළාත් ව්‍යවසායකත්ව දිවිබල සංවර්ධන ණය ව්‍යාපෘතිය යටතේ 2022 ඔක්තෝබර් 31 දිනට මුදල් පොත අනුව | 2022 | මුදල් පොත හා පරිගණක වැඩසටහන අනුව ලැබීම් සසඳා වෙනස හඳුනා ගත යුතු අතර මූල්‍ය අක්‍රමිකතා | විෂය නිලධාරිනියට අදාළව මූලික විමර්ශනයන් සිදුකර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ලබා දෙන බව දැනුම් දී | 2023 ජුනි 09 දින මූලික විමර්ශන කමිටුවක් පත්කර තිබුණද, 2024 සැප්තැම්බර් මස |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලැබීම් සහ පරිගණක වැඩසටහන අනුව රු.2,347,414 ක වෙනසක් පැවතුණි. කුවිතාන්සි 13 ක අනුක්‍රමික අංක පිළිවෙල වංචනික ලෙස වෙනස් කරමින් ණය ලැබීම්වල එකතුව රු.149,000 ක මුදල් අවභාවිතා කිරීමට අදාළව ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ පළමු උපලේඛනය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | ඇත. | දක්වාම අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොමැත. |
| (ඇ) | 2022 ජනවාරි 03 දින දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් ඉතිරි කිරීම් ගිණුමක අතිරික්ත මුදල් වසරකට සියයට 7.5 පොලියකට 2023 ජනවාරි 03 දිනට කල්පිරෙන අයුරින් රු.59,080,000 ක් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණද, දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ පාලන සංවර්ධන මූල්‍ය අධ්‍යක්ෂකගේ අංක SPRTA/ACC/ F1/01 හා 2022 දෙසැම්බර් 30 දිනැති ලිපිය අනුව කල්පිරිමට දින 04 ක් තිබියදී රු.846,398 ක පොලී ආදායමක් යටතේ නිදහස් කර ගෙන තිබුණි. | 2023 | මේ සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම පොලී අනුපාතිකයට වඩා වැඩි ප්‍රමාණයක් මුදල් පසුව ආයෝජනය කිරීමෙන් අධිකාරිය උපයා ගෙන ඇති බව දැනුම් දී ඇත. | මේ සම්බන්ධව පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර තිබුණද, අදාළ වාර්තාව 2024 සැප්තැම්බර් මස දක්වාම ලබා දී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් අනුමැතිය ලබා නොතිබියදී හා පාසල් සංවර්ධන කමිටුවේ යෝජනා අනුමැතියක් නොතිබියදී, 2022 මාර්තු, අප්‍රේල්, මැයි යන මාස 03 තුළදී ගා/ජනාධිපති බාලිකා විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කරගත් ශිෂ්‍යාවන් ගෙන් නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.1,330,000 ක මුදලක් ලබා ගෙන තිබුණි. | 2023 | විධිමත් අනුමැතියක් මත මුදල් එකතු කිරීම් සිදුකල යුතුය. | 2022 වර්ෂයේ කොවිඩ් වසංගතය හා ඉන්ධන අර්බුදය මත පාසල අඛණ්ඩව නොපැවැත්වූ අතර zoom තාක්ෂණය ඔස්සේ පාසල් සංවර්ධන සමිතියේ අනුමැතිය ලබා ගෙන ඇත. ගා/ ජනාධිපති විද්‍යාලයේ විදුහල්පති දැනුවත්ව ගාල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ ලිපිය මඟින් නව ඉදිකිරීම් හා අවශ්‍යතා යටතේ දැනුම් දී ඇති බව දැනුම් දී ඇත. | චක්‍රලේඛ වලට පටහැනිව විධිමත් අනුමැතියකින් තොරව කටයුතු කිරීම සම්බන්ධව විමර්ශනයක් සිදු කිරීමට 2024 සැප්තැම්බර් මස දක්වාම කටයුතු කර නොමැත. |
| (ඉ) | 2023 වසරේදී ගා/ ජනාධිපති බාලිකා විද්‍යාලයේ 12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමේදී ශිෂ්‍යාවන් 62 දෙනෙකු ඇතුළත් කර ගෙන තිබූ අතර, එක් ශිෂ්‍යාවකගෙන් රු.25,000 ත් රු.30,000 ත් අතර මුදල් ලබාගෙන තිබුණු අතර, එම මුදල් පාසල් සංවර්ධන ගිණුමට බැරකර නොතිබූ අතර, විදුහල්පතිතුමියගේ උපදෙස් පරිදි එම මුදල් වෙනත් ගිණුමකට බැර කරවා ගෙන තිබුණි. | 2023 | විධිමත් අනුමැතියක් සහිතව රැස්කරන ලද සියළුම මුදල් පාසල් සංවර්ධන අරමුදලට බැරකල යුතුය. | 2022 වර්ෂයේ 12 ශ්‍රේණියට වෙනත් පාසල්වලින් ඇතුළත් කරගත් සිසුවියන්ගේ දෙමාපියන් රු.1,710,000 ක් ආදි ශිෂ්‍ය සංගමයේ ගිණුමට බැර කර තිබූ අතර ඒ අනුව ආදි ශිෂ්‍ය ගිණුමේ තැන්පත් කර ඇති මුදල් වලින් රු.200,000 ක් පාසල් සංවර්ධන සමිති ගිණුමටද, වර්ෂ 2ක පහසුකම් හා සේවා ගාස්තු විද්‍යාලයේ පහසුකම් හා සේවා ගාස්තු ගිණුමටද අයකර ගෙන රිසිට්පත් දියණියන්ට ලබා දී ඇති බව දැනුම් දී ඇත. | ඉදිරි විමර්ශන කටයුතු සඳහා ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත අදාළ තොරතුරු 2024 අප්‍රේල් දින රහිත ලිපිය මඟින් දැනුම් දී තිබුණද මේ දක්වාම ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඊ) | දකුණු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මාතර දිස්ත්‍රික් කාර්යාල බල ප්‍රදේශයේ මුලටියන ගමගෙවත්ත අමුණෙහි ගේබියන් බැම්ම ඉදිකිරිම සඳහා රු.8,188,000 ක් හා රත්මලාව අමුණ ඉදිකිරිම සඳහා රු.11,016,000 ක ඇස්තමේන්තු සකස්කර 2024 මාර්තු 05 දින පුවත්පත් මඟින් ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රසිද්ධ කර තිබුණි. මේ සඳහා ලංසු ලිපිලේඛන 2024 මාර්තු 05 සිට 25 දින දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලය හා ප්‍රධාන කාර්යාලයෙන් නිකුත් කිරීම් කටයුතු සැලසුම්කර තිබුණද, ප්‍රසම්පාදන දැන්වීම ප්‍රසිද්ධ කිරිමට පෙර සිටම ඉදිකිරීම් සිදුකිරීමට අපේක්ෂිත වැඩ බිම වෙත ඉදිකිරීම් ද්‍රව්‍ය බඹගල් ඝනමීටර් 355 ක් හා ABC ඝන මීටර් 34 ක් පමණ ප්‍රවාහනය කර ගොඩගසා තිබුණි. දෙපාර්තමේන්තු කළමනාකරණය මේ පිළිබඳව දැනුවත් වී තිබුණද සිද්ධිය සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, මෙම | 2023 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතුය. | ඉදිකිරිමට අපේක්ෂිත ස්ථානයට බඹ ගල් ගෙනවිත් ගොඩගසා තිබූ බවට අප දැනුවත් වූයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් වීමට ප්‍රථම 2024 මාර්තු 17 දින දුරකථන මාර්ගයෙනි. මේ සම්බන්ධයෙන් මීට පෙර දැනුවත්වී නොතිබූ බව හා වැඩ බිම් ආසන්නයේ ප්‍රදේශයේ ගොවීන්ට අයත් පෞද්ගලික අයිතින් සතු කුඹුරු ඉඩම්වල අමුද්‍රව්‍ය ගොඩගසා ඇති බවත් එය වාරිමාර්ග රක්ෂිතයට අයත් නොවන ප්‍රදේශ වන බැවින් නීත්‍යානුකූලව ක්‍රියාමාර්ග ගැනීමට හැකියාවක් නොවූ බව දැනුම් දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | හේතුව මත ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රසම්පාදනයේ විනිවිදභාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය. | | | | |
| (උ) | මිද්දෙණිය ප්‍රාදේශීය රෝහලේ, ඉසින යන්ත්‍ර ක්‍රියාකරු 2018 අප්‍රේල් 07 දින සිට නොදන්වා සේවයට වාර්තා නොකිරීම මත 2023 පෙබරවාරි 13 දින තනතුර හැර යාමේ නිවේදනය නිකුත් කර තිබුණි. එහෙත් 2018 අප්‍රේල් 24 දින සිට 2022 සැප්තැම්බර් මස දක්වා සේවය හැර ගිය පසුවද රු.2,131,001 ක වැටුප් ගෙවා තිබුණි. | 2023 | රජයට වූ හානිය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | මූලික විමර්ශනයේ නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. | ප්‍රධාන අමාත්‍යාංශය මඟින් 2023 මාර්තු 28 දින මූලික විමර්ශන කමිටුවක් පත්කර ඇත. එම වාර්තාවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදුකරනු ලබන බව වාර්තා කර ඇත. |
| **13.** | **ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු** | | | | |
| (අ) | කලේගාන නොවිධිමත් අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 02 ක වැඩසටහන් පැවැත්වීමෙන් රු.5,154,700 ක ආදායමක් උපයාගෙන තිබුණු අතර, දකුණු පළාත් සභා මූල්‍ය රීති 39 ප්‍රකාරව පළාත් සභා ආදායම් ලෙස ගිණුම්ගත නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තබා ගෙන ඉන් රු.2,197,214 ක් | 2021 | දකුණු පළාත් මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2019 ජූලි 15 දින සිට මුදල් අයකිරීමේ ක්‍රියාවලිය සඳහා විධිමත් රාමුවක් සැකසූ බවත් ඊට පෙර මුදල් අයකිරීමේ විධිමත් රාමුවක් සකස් කර නොමැති බව දැනුම් දී ඇත. | මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට 2024 සැප්තැම්බර් මස දක්වාම කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නීත්‍යානුකූල නොවන ලෙස වියදම් කර තිබුණි. 2019 වර්ෂයට පෙර ඉපයූ ආදායම් පිළිබඳ විස්තර මධ්‍යස්ථානය සතුව නොතිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ රු.2,957,486 න් පැවතුණි. | | | | |
| **14.** | **නොවිසඳී ඇති විගණන ඡේද** | | | | |
| (අ) | දකුණු පළාත් සංවර්ධන අධිකාරියේ තේපැල ලක්ෂ 25 ක් සැපයීම සම්බන්ධයෙන් රජයට සෘජුවම සිදුවී ඇති රු.18,034,507 ක අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද කටයුතු කර නොතිබුණි. | 2023 | විසඳි නොමැති විගණන ඡේද පිළිබඳ අවධානය යොමු කර නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | තේ පැල සම්බන්ධයෙන් වූ අලාභය අය කර ගැනිම සඳහා ගාල්ල දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවති. මේ වන විට 19 වාරයක් නඩුව රැස් වී ඇති බව දන්වා ඇත. | 2023 මාර්තු මස 21 දින පැවති ගිණුම්කාරක සභා නිර්දේශ දුන් තීරණ පරිදි කටයුතු කර නොමැත. |
| (ආ) | ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක දපස/ප්‍රඅ/මු10/50 හා 2021 අප්‍රේල් 06 දිනැති ලිපිය මඟින් අංක 13 ශ්‍රී 9506 රථය සම්බන්ධව පත්කරන ලද ත්‍රිපුද්ගල කමිටු වාර්තාව 2022 ජූලි 18 දින ලබාදී තිබුණද එම වාර්තාවේ දක්වා තිබූ නිර්දේශයන් 04, විගණිත අවස්ථාව වන විටද ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023 | කමිටු වාර්තාවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදුකර අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ත්‍රිපුද්ගල කමිටු වාර්තාවේ නිර්දේශ 4 ප්‍රකාරව, රථයේ ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත දැනුම් දී ඇති බව දන්වා ඇත. | 2022 වර්ෂයේදී ලබා දී තිබූ ත්‍රි පුද්ගල කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට 2024 සැප්තැම්බර් මස දක්වාම කටයුතු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ගලගොඩ වැඩ අංගනයේ සවිකර තිබූ ඇස්පෝල්ට් යන්ත්‍රය වෙන්දේසි කිරීමේදී තක්සේරු කාර්යය සඳහා පත්කල කමිටුව මඟින් වත්කම සඳහා ලබා දුන් තක්සේරුව රු.10,400,000 ක් වූ අතර යන්ත්‍රය වෙන්දේසියේදී රු.21,100,000 කට අලෙවි වී තිබුණි. මේ අනුව තක්සේරු වටිනාකම නිවැරදි නොවන බව නිරීක්ෂණය වූ අතර තක්සේරු කිරීමේදී යන්ත්‍රය තුළ වූ තාර ලීටර් 21,782 ක් හා ඩීසල් ලීටර් 4028 පිළිබඳව සැලකිල්ලට නොගෙන තක්සේරු කර තිබීමෙන් අධිකාරියට රු.3,274,784 ක පාඩුවක් සිදු වී තිබුණි. | 2023 | වත්කම් නිවැරදිව තක්සේරු කර රජයට අලාභයක් නොවන පරිදි වත්කම් අපහරණය සිදුකල යුතුය. | මෙම යන්ත්‍රය වෙන්දේසි කිරීමේ දී රජයට අලාභයක් සිදු වී නොමැති බවත්, යන්ත්‍රයේ තක්සේරු වටිනාකම රු.මි.10.5 ක් වන බව දන්වා ඇත. | 2023 මාර්තු 21 දින පැවැති ගිණුම්කාරක සභාවේදී දුන් තීරණ පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට 2024 සැප්තැම්බර් මස දක්වාම කටයුතු කර නොමැත. |
| (ඈ) | ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමකින් තොරව ආණ්ඩුකාරවරගේ යෝජනාවක් මත දකුණු පළාතේ සියලුම රාජ්‍ය ආයතන ඒකාබද්ධ කර තැපැල කළමනාකරණ පරිගණක වැඩසටහනක් නිර්මාණය කිරීම සඳහා 2020 ඔක්තෝබර් මස | 2022 | ව්‍යාපෘති සිදුකිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ඒ අනුව කටයුතු කල යුතුය. එමෙන්ම කළමනාකරණ තොරතුරු පද්ධති ඵලදායී ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත | පළාත් සභාවට සුදුසු ලෙස එම පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා අදාල ආයතනය වෙතින් එම පද්ධතියට අදාළ ක්ෂේත්‍ර ලිඛිතව ඉල්ලා ඇති අතර, එම ක්ෂේත්‍ර ලැබුණු පසු පද්ධතිය වැඩිදියුණු කිරීමට කටයුතු කරනු ඇති බව දන්වා ඇත. | 2023 මාර්තු 21 දින පැවැති ගිණුම්කාරක සභාවේ නිර්දේශ පරිදි කටයුතු කර මෙම පද්ධතිය ඵලදායී ලෙස වැඩිදියුණු කර පළාත් සභාවේ තැපැල කළමනාකරණ කටයුතු සඳහා |

| | | |
|---|---|---|
| 07 වන දින රු.14,008,176 ක මුදලකට කොන්ත්‍රාත් සමාගමක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂය තුළදී රු.27,984,663 ක මුදලක් වැයකර තිබුණද, ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුළ වැඩ අවසන් කර නොතිබුණි. එමෙන්ම මේ සඳහා රු.21,140,000 කට ස්කැනර් යන්ත්‍ර 86 ක් මිලට ගෙන තිබූ අතර ඉන් 70 ක් 2022 දෙසැම්බර් මස 22 සහ 23 යන දිනයන්වල එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ආයතන සඳහා බෙදා හැර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම නිසා එම යන්ත්‍ර ඵලදායී ලෙස ව්‍යාපෘතිය සඳහා යොදවා ගැනීමටත් ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු කර ගැනීමටත් නොහැකි වී තිබුණි. | යුතුය. | යොදවා ගැනීමට කටයුතු කර නොමැත. |

## 3.8 බස්නාහිර පළාත් සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය (ඌණතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 40,361,446,404 | 541,564,448 | 39,819,881,956 | 11,649,854,163 | තත්ත්වාගණනය කළ |
| **2022** | 64,964,923,662 | 520,070,210 | 64,444,853,453 | 15,215,880,246 | තත්ත්වාගණනය කළ |
| **2023** | 98,356,324,917 | 644,880,336 | 97,711,444,581 | 9,333,696,025 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | ඖෂධ වර්ගවල තත්ත්ව අසමත් (Quality fail) වී ඇති බැවින් රෝගීන්ට ලබා දීමට නුසුදුසු බව තහවුරු වීමෙන් එම ඖෂධ රෝගීන්ට බෙදා හැරීම නතර කරන ලෙස මධ්‍යම රජයේ වෛද්‍ය සැපයුම් අංශය මගින් 2021 වර්ෂයේ දී චක්‍රලේඛ 96 ක් මගින් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත දැනුම් දී තිබුණි. එම දැනුම් දීම් සිදුවන විටත් රු.2,395,212 ක් වටිනා තත්ත්ව අසමත් වූ ඖෂධ වර්ග 27 ක, ඒකක 473,341 ක ඖෂධ කළුතර දිස්ත්‍රික්කයේ රෝහල් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල වෙත බෙදා හැර තිබුණි. චක්‍රලේඛ නිකුත් | 2021 | තත්ත්වයෙන් අසමත් ඖෂධ රෝගීන්ට ලබාදීම නැවැත්වීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් හඳුන්වා දිය යුතුය | ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශය වෙත ලැබෙන ඖෂධ ලැබුණු වහාම රෝහල් හා අනෙකුත් සෞඛ්‍ය ආයතන වෙත බෙදා හරින හෙයින් තත්ත්ව අසමත් ඖෂධ චක්‍රලේඛ මඟින් දැනුම් දෙනවිට බොහෝ ප්‍රමාණයක් නිකුත් කර අවසන්ය. | විධිමත් වැඩපිළිවෙළක් හඳුන්වා දී නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කිරීමෙන් පසුව රු.1,451,106 ක් වටිනා ඒකක 282,088 ක ඖෂධ රෝහල් වෙතින් ඉවත් කරගෙන තිබුණද, ඒ වනවිටත් රු.944,106 ක් වටිනා තත්ත්ව අසමත් වූ ඒකක 189,155 ක ඖෂධ රෝගීන් වෙත නිකුත් කර තිබුණි. | | | | |
| (ආ) | වතුපිටිවල රෝහලේ රු.1,955,745ක් වටිනා ඖෂධ වර්ග 46 ක්ද මීරිගම රෝහලේ රු.69,945 ක් වටිනා ඖෂධ 06 ක්ද, හොරණ මූලික රෝහලේ රු.130,021 ක් වටිනා ඖෂධ 14 ක්ද වශයෙන් රෝහල් 03 ක එකතුව රු.2,155,711 ක්වූ ඖෂධ වර්ග 66 ක් සමාලෝචිත වර්ෂයේදී කල් ඉකුත්වී තිබුණි. කල් ඉකුත්වීමට පෙර මෙම ඖෂධ ප්‍රයෝජනයට ගැනීම හෝ ප්‍රයෝජනයට ගතහැකි රෝහල් වෙත මාරු කිරීමේ ක්‍රමවේදයක් සැකසීමට කටයුතු කර නොතිබුණි. | 2021 | කල් ඉකුත්වීමට පෙර මෙම ඖෂධ ප්‍රයෝජනයට ගත හැකි රෝහල් වෙත මාරු කිරීමට කටයුතු කළ යුතුය. | කොවිඩ් 19 වසංගත තත්ත්වය මත ප්‍රතිකාර සඳහා රෝහල් වෙත පැමිණි රෝගීන් සංඛ්‍යාව අඩුවිය. තවද මෙම තත්ත්වය දිවයින පුරා සියළුම රෝහල්වල පැවතීම හේතුවෙන් බොහෝමයක් ඖෂධ වෙනත් රෝහල්වලට මාරු කිරීමට අපහසු විය. | කල් ඉකුත් වීමට පෙර ප්‍රයෝජනයට ගැනීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. |
| (ඇ) | රජයේ නිලධාරීන්ට රජයේ නිවසක් ලබාදීම කළ හැකි වුවද ආයතන සංග්‍රහය අනුව මාසික නිවාස කුලී ලෙස | 2022<br>2023 | ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අංක Vi/100/11-2017-01(iii) දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා ඒ සඳහා 1987 අංක 42 දරන | 2024 වර්ෂය වනවිටත් ගෙවමින් පැවතුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දීමනාවක් ගෙවීමට කිසිදු හැකියාවක් නොමැති වුවද ඒ පිළිබඳ අවධානය යොමු කිරීමකින් තොරව නිල නිවාස ඉදිකරන තෙක් තාවකාලික ගෙවීමක් ලෙස දක්වමින් බස්නාහිර පළාත් සභාවේ ඉහළම තනතුරු දරන නිලධාරීන් 11 දෙනෙකුට වසර 05 කට වැඩි කාලයක සිට රු.20,054,032 ක මාසික නිල නිවාස කුලී දීමනාවක් ගෙවා තිබුණද නිල නිවාස ඉදිකිරීමට එකී වසර 05 තුළ සැලසුමක් හෝ අනුමත කරගෙන නොතිබුණි. | | | පළාත් සභා පනතේ 19(5) යටතේ ගරු ආණ්ඩුකාරතුමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දීමනා ගෙවනු ලැබේ. | |
| (ඇ) | 2014 ජනවාරි 01 දිනැති අංක 01/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.3(II) ඡේදය අනුව රජයේ නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව ගෙවීමේදී අදාළ මාසයේ පළමු දින ශ්‍රී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ප්‍රකාශිතව පැවැති සාමාන්‍ය පෙට්‍රල් හා ඩීසල් මිල ගණන් මත පදනම්ව ගණනය කළයුතු වේ. එකී උපදෙස් සැලකිල්ලට නොගෙන 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(IV) | 2022 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ප්‍රධාන ලේකම් කාර්යාලයේ නිල වාහන හිමි නිලධාරීන් සඳහා ඉන්ධන දීමනා ලබා දීමේදී ඒ පිළිබඳව උපදෙස් ලබා දී ඇති 2011 පෙබරවාරි 09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008 (IV) ප්‍රකාරව ඉන්ධන දීමනා ගෙවීමේ කටයුතු සිදු කර ඇත. එම චක්‍රලේඛයේ ඉන්ධන සම්බන්ධව දක්වා ඇති කරුණු වල කිසිදු ආකාරයක ඉන්ධන වර්ගයක් පිළිබඳව දක්වා නොමැති බව කාරුණිකව දන්වමි. | නිලධාරීන් දෙදෙනෙකු තවදුරටත් සුපිරි ඩීසල් හා සුපිරි පෙට්‍රල්වල මිල පදනම් කර ගනිමින් දීමනාව ලබා ගනියි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2019 මැයි 31 දිනැති අංක 13/2008(V) දරන සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව නිල වාහන හිමිකම් ලබන නිලධාරීන් 52 දෙනෙකුට මාසයේ පළමු දිනට පවතින ඉන්ධන ලීටරයක මිල ලෙස සුපිරි පෙට්‍රල්වල සහ සුපිරි ඩීසල්වල මිල පදනම් කරගෙන මාසික ඉන්ධන දීමනාව ගණනය කර 2011 වර්ෂයේ සිට 2022 ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළ රු.6,183,569 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | | | |
| (ඉ) | මාකොළ සහතික කළ පාසලේ පරිගණක ඒකකය, සුළු සේවක නිවාසය සහ 2021 වර්ෂයේ රු.11,222,740 ක වියදමක් දරා ඉදිකළ ක්‍රීඩාගාරය 2023 ජූනි මාසය වනවිටත් නිෂ්කාර්යව පැවතුණි. | 2022 2023 | කඩිනමින් භාවිතා තත්ත්වයට පත්කළ යුතුය. | ක්‍රීඩාගාරය භාවිතා කිරීමට කටයුතු කරන බවත් තිස්ස නේවාසිකාගාරය භාවිතා තත්ත්වයේ තිබෙන බවත් සුළු සේවක නිවාසය භාවිතා කළ නොහැකි මට්ටමේ පවතින බව. | 2024 සැප්තැම්බර් දක්වා පරිගණක ඒකකය හා සුළු සේවක නිවාසය භාවිතා කර නොතිබුණි. |
| (ඊ) | 1992 අංක 01 දරන බස්නාහිර පළාතේ පළාත් සභාවේ මාර්ගස්ථ මගී සේවා ප්‍රඥප්තිය යටතේ 2007 මාර්තු 16 දිනැති අංක 1488/32 දරන ගැසට් පත්‍රයේ සඳහන් 3.1 නියෝගය ප්‍රකාරව, | 2022 2023 | ප්‍රඥප්තියට හා ටෙන්ඩර් පටිපාටියට අනුකූලව කටයුතු කළ යුතුය. | අවසරපත්‍ර නියමයන් හා කොන්දේසි කඩ කිරීමේ විශේෂ අවස්ථාවකදි හැර අධිකාරියේ ප්‍රායෝගිත භාවිතය තුළ අවසරපත්‍ර අවලංගු කිරීමකින් තොරව එම බලපත්‍ර වාර්ෂිකව දීර්ඝ | ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ධාවකයා තෝරා ගැනීමේදී බස්නාහිර පළාත තුළ පවත්නා මගී ප්‍රවාහනය සඳහා බස් රථ ධාවනය කළ හැකි මාර්ගවල පවතින හෝ ඇතිවන පුරප්පාඩු හෝ අවශ්‍යතා සඳහා බස් රථ යෙදවීම පිණිස මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම කරනු ලබන්නේ ටෙන්ඩර් ක්‍රමය මගින් තෝරා ගනු ලබන බස් හිමි ධාවකයින් වෙත පමණක් ලෙස දක්වා තිබුණද, ඊට පටහැනිව අධිකාරිය විසින් 2022 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය සේවා, සුඛෝපභෝගී සේවා, අධිවේගී සේවා යටතේ මගී සේවා බලපත්‍ර 6161 ක් නිකුත් කර තිබුණු අතර, ඉන් බලපත්‍ර 5064 ක් හෙවත් නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාවෙන් සියයට 82 ක් විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීමෙන් තොරව ලබාදී තිබුණි. | | | කරමින් වර්තමානය දක්වා පවත්වා ගෙන ගොස් ඇත. | |
| (උ) | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත පමණක් බස්නාහිර පළාත් සභාවට සහ බස්නාහිර | 2022 2023 | කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයට යෙදවීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතුය. | මේ වනවිට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පළාතේ පළාත් පාලන ආයතනවල දීපව්‍යාප්ත තනතුරු සඳහා නිලධාරීන් 50 දෙනෙකු නීත්‍යානුකූල නොවන ආකාරයට කොන්ත්‍රාත් පදනම මත, විශ්‍රාමික නිලධාරීන් නැවත සේවයට යෙදවීම සහ එකී නිලධාරීන්ගේ කොන්ත්‍රාත් කාලය එලෙසම දීර්ඝ කිරීමට කටයුතු කර තිබුණි. | | | | |
| (ඌ) | බස්නාහිර පළාත් සභාවේ ආයතන 10 කට අදාළව තනතුරු 14 කට අයත් නිලධාරීන් 39 දෙනෙකුට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් සීමාවන් ඉක්මවා පළාත් ආණ්ඩුකාර අනුමැතිය මත මාසික ඉන්ධන සීමාව වැඩි කර ගෙන 2012 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව රු. මිලියන 16 ක වැඩිපුර ඉන්ධන දීමනා ගෙවා තිබුණි. තවද, අදාළ චක්‍රලේඛයේ නිලධාරීන් විසින් මාසිකව අතිරේක රාජකාරී ගමන්වල යෙදෙන්නේ නම් පමණක් ගමන් කළ දුර ප්‍රමාණය අනුව අතිරේක ඉන්ධන ලබා ගැනීමට හැකියාවක් තිබුණද, එකී චක්‍රලේඛ | 2022<br>2023 | චක්‍රලේඛයට අනුගතව ඉන්ධන දීමනා ගෙවිය යුතුය. | ප්‍රධාන ලේකම්වරයාගේ නිර්දේශය හා ආණ්ඩුකාර අනුමැතිය ලැබී ඇති බව. | 2024 සැප්තැම්බර් වන විටත් ගෙවමින් පැවතුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන කිසිදු ආකාරයකින් සැලකිල්ලට නොගෙන අතිරේකව ගමන් කළ දුර ප්‍රමාණයන් නොසලකා වක්‍රලේඛයට පටහැනිව ගෙවීම් කර තිබුණි. | | | | |
| (එ) | අයිතිය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව සතු තක්සේරු වටිනාකම රු.7,000,000 ක්වූ කැබ් රථයක් 2017 අගෝස්තු 31 දින ආණ්ඩුකාර ලේකම්ගේ පෞද්ගලික නිවසේ නවතා තිබියදී ගින්නෙන් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි. මුදල් රෙගුලාසි 104(4) වාර්තාවට අනුව රථය භාර රියදුරා හා රථය පරිහරණය කළ නිලධාරියා වගකිව යුතු පාර්ශවයන් බවට පත්කර තිබුණු අතර රජයේ වත්කම් අවභාවිතා කිරීම හෝ අවභාවිතා කිරීමට ඉඩ සැලසීම මඟින් රජයට ඉහත සඳහන් අලාභය සිදු කිරීමට හෝ සිදුකිරීම වැළැක්වීමට කටයුතු නොකිරීම සම්බන්ධ වගකිව යුතු වාහනය පරිහරණය කළ නිලධාරියා පළාත් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගොස් සිටියද තවදුරටත් කොන්ත්‍රාත් පදනම මත සේවයේ රඳවා ගැනීමට | 2022 | මුදල් රෙගුලාසි 104 වාර්තාව අනුව කටයුතු කළ යුතුය. | 104(4) වාර්තාව සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට එරෙහිව බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම් විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත. | මු.රෙ. 104 පරීක්ෂණය අවසන් කර ඉදිරි කටයුතු සිදු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කටයුතු කර තිබුණි. | | | | |
| (ඒ) | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපතිවරයාගේ නිල රාජකාරී කටයුතු සඳහා වෙන් කර තිබූ වර්තමාන තක්සේරු වටිනාකම රු.18,500,000 ක්වූ කැබ් රථයක් 2021 මැයි 09 වන දින රටෙහි පැවති නොසන්සුන් වාතාවරණය යටතේ අරගලකරුවන් විසින් මොරටුව ප්‍රදේශයේදී ගිනි තබා තිබූ අතර එම ගින්නෙන් කැබ් රථය මුළුමනින්ම විනාශ වී තිබුණි. සභාපතිවරයා විසින් විගණනයේදී ලබා දී තිබූ ප්‍රකාශය අනුව කැබ් රථයට පහර දී ගිනි තබන අවස්ථාවේදී නිල වාහනය සඳහා අනුයුක්ත රියදුරු නොවන බාහිර පුද්ගලයෙකු විසින් කැබ් රථය පදවාගෙන ගොස් තිබූ අතර නිල රාජකාරී ගමනක් නොව දේශපාලන සාකච්ඡාවක්/ රැස්වීමක් සඳහා සහභාගී වී ආපසු පැමිණීමේ දී රථය අනතුරට පත්වී තිබූ බව අනාවරණය විය. | 2022 | මූල්‍ය රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අය කර ගත යුතු මුළු වටිනාකම වන රු. 23,125,000 න් රක්ෂණ වන්දි ලෙස රු. 10,000,000 ක් ලැබී තිබුණු අතර රු. 13,125,000 ක් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඔ) | වටිනාකම රු.158,000,000 වූ කොන්ක්‍රීට් ඇතුරුම් යන්ත්‍ර 02 ක් 2012 | 2022 | වත්කම් අවශ්‍යතාවය අනුව මිලදීගත යුතු අතර උපයෝජනය | 2022 සහ 2023 වර්ෂයේ කොන්ක්‍රීට් ඇතුරුම් යන්ත්‍රය මගින් ව්‍යාපෘති | 2024 වර්ෂයේ සැප්තැම්බර් දක්වාත් නිෂ්ක්‍රීයව හා |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මිලදී ගෙන තිබුණි. ඉන් එක් යන්ත්‍රයක් මිලදී ගත් දිනයේ සිට කිසිදු කාර්යකට යොදා නොගෙන නිෂ්ක්‍රීය වත්කමක් බවට පත්කර තිබූ අතර අනෙක් යන්ත්‍රය මිලදී ගත් දිනයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ වසර 10 ක කාලය තුළ මාර්ග 15 ක යන්ත්‍ර පැය 420 ක ඉදිකිරීම් සඳහා පමණක් භාවිතා කර තිබීමෙන් ඌන උපයෝජිත යන්ත්‍රයක් බවට පත්කර තිබුණි. | | කිරීමට කටයුතු කළ යුතුය. | කිහිපයක් ඉටුකර ඇත. | ඌන උපයෝජිතව පැවතුණි. |
| (ඕ) | 2012 වර්ෂයේදී රු.6,000,000 කට මිලදී ගෙන තිබූ කර්බ් යන්ත්‍රය මිලදී ගත් දිනයේ සිට කිසිම ව්‍යාපෘතියක සේවයේ යොදවා ගැනීමකින් තොරව දිවුලපිටිය පෙරනිම් අංගනයේ ගාල්කර තිබීමෙන් එම යන්ත්‍රය නිෂ්ක්‍රීය වත්කමක් බවට පත්වී තිබුණි. | 2022 | වත්කම් අවශ්‍යතාවය අනුව මිලදීගත යුතු අතර උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | 2023 වර්ෂයේ විධායක ඉංජිනේරු කොට්ඨාශ මට්ටමින් Curb Wall ඉදිකිරීමට උපදෙස් ලබාදී දැනට ඉටුකරමින් පවතී. | 2024 වර්ෂයේ සැප්තැම්බර් මාසය වනවිටත් නිෂ්ක්‍රීය වත්කමක් ලෙස දිවුලපිටිය පෙරනිම් අංගනයේ ගාල් කර තිබුණි. |
| (ක) | ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය යටතේ ක්‍රියාත්මක වන වෙස්ප්‍රෝ මුද්‍රණාලයේ විධිමත් අභ්‍යන්තර පාලන විධිවිධානයක් ස්ථාපිත කර නොතිබීම | 2023 | විධිමත් පරීක්ෂණයකින් පසුව අලාභ අයකරගැනීමට කටයුතු කළ යුතුය. | ගබඩා භාරකරු විසින් වංචනික අදහසින් GRN නිකුත් කර ඇති බව හා සත්‍ය වශයෙන් තොග ගබඩාවට ලද බවට සනාථ කර ගැනීමකින් තොරව | 2024 වර්ෂයේ සැප්තැම්බර් මාසය දක්වාත් අලාභ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සහ මුද්‍රණාලයේ අධීක්ෂණ කටයුතු ඉතාම දුර්වල මට්ටමක තිබීම හේතුවෙන් ආයතනය විසින් 2023 අගෝස්තු 08 දිනට ගණනය කර තිබූ භෞතික තොගයට අදාළව නඩත්තු කර තිබූ ගබඩා ලෙජරය, කාර්ය පත්‍රිකා සාරාංශය (Job Card), මිලදී ගැණුම් සාරාංශය (Purchase Order Summery) පදනම් කරගෙන අයිතම 38 ක මුද්‍රණ ද්‍රව්‍ය සම්බන්ධව සිදුකරන ලද විගණනයේදී රු. මිලියන 42 ක් වටිනා මුද්‍රණ තොග ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර අදාළ තොග මිලදී ගැනීමේදී ඇතැම් මුද්‍රණ ද්‍රව්‍ය ආයතනයට ලැබී නොතිබියදී ආයතනයට ලැබුණු බවට ලියකියවිලි ඉදිරිපත් කර, සහතික කර ගෙවීම් කර තිබුණි. | | | GRN අනුමත කිරීම මගින් පැවති අභ්‍යන්තර පාලන ක්‍රම බිඳ දමා ඇති බව. | |
| (ග) | සංචාරක ආකර්ෂණය ඇති කර ගැනීමේ අරමුණ සඳහා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලද රු. මිලියන 14 ක ප්‍රතිපාදන මත පිළිකුත්තුව තිරසර සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණ අතර සංචාරක | 2023 | ගැටළු හඳුනාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ප්‍රජාව හා වගකිවයුතු රාජ්‍ය ආයතන සමඟ වැඩමුළුවක් සංචාරක සංවර්ධන අධිකාරිය හා සංචාරක අමාත්‍යාංශයේ හා ගරු විහාරාධිපති හිමියන්ගේ මූලිකත්වයෙන් | ව්‍යාපෘතියේ කටයුතු නවතා තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මණ්ඩලය විසින් ඇති විය හැකි ගැටළු හඳුනාගෙන ක්‍රියාත්මක නොකිරීමෙන් ව්‍යාපෘතියේ කටයුතු අතර මැද දී නැවතී තිබුණි. | | | පවත්වා මූලික ක්‍රියාකාරකම් හඳුනාගන්නා ලද බව. | |
| (ච) | 2012 වර්ෂයේදී පළාත් සංවර්ධන ප්‍රදාන යටතේ රු. මිලියන 156 ක ඇස්තමේන්තු වටිනාකමකට මිනුවන්ගොඩ රෙජී රණතුංග කණිෂ්ඨ විද්‍යාලයේ පිහිනුම් තටාකය ඉදිකිරීම සඳහා බස්නාහිර පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට පවරා තිබුණි. පිහිනුම් තටාකය, වාහන නැවතුම් අංගනය, ඇඳුම් මාරු කිරීමේ කාමර, වැසිකිලි, ව්‍යාපාරික ස්ථාන සමඟ මහල් 03 කින් යුතුව ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 187 ක් වැය කර තිබුණි. පිහිනුම් තටාක ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි වසරක් තුළ නිම කිරීමට අපොහොසත් වී තිබුණු අතර ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී ආරම්භකර වසර 12 ක් ගත වුවද ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට නොහැකි වී තිබුණි. එසේම අපේක්ෂිත කාලය තුළ | 2023 | නියමිත කාලය තුළ ව්‍යාපෘති අවසන් කළ යුතුය. | ප්‍රතිපාදන නියමිත පරිදි නොලැබීම නිසා ප්‍රමාද වූ බව හා ඉදිරි මාස 04 ක් ඇතුළත වැඩ අවසන් කර භාවිතය සඳහා භාර දීමට නියමිත බව. | ව්‍යාපෘතිය 2024 වර්ෂයේ සැප්තැම්බර් වන විටත් අවසන් කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ව්‍යාපෘති කටයුතු නිමකිරීමට නොහැකිවීම මත රු.මිලියන 156 කට ඇස්තමේන්තු සකස්කර තිබූ ව්‍යාපෘතිය සඳහා නැවත රු. මිලියන 277 කට ඇස්තමේන්තු සකස් කර තිබූ අතර, නියමිත කාලය තුළ ව්‍යාපෘතිය නිම නොකිරීම හේතුවෙන් පළාත් සභාවට රු. මිලියන 31 ක අතිරේක පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. | | | | |
| (ජ) | රජය විසින් නව ව්‍යාපාර ආරම්භ කිරීම, ප්‍රාග්ධන වියදම් දැරීම මුළුමනින්ම අත්හිටුවන ලෙස දන්වා තිබියදී ඒ පිළිබඳව අවධානය යොමු කිරීමෙන් තොරව හා විධිමත් ශක්‍යතා අධ්‍යයනකින්/ ව්‍යාපෘති සැලසුමකින් තොරව මීනුවන්ගොඩ වල්පිට ටින් මාළු සැකසීමේ ව්‍යාපෘතියක් 2020 වර්ෂයේදී ආරම්භ කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් පියවර ගෙන තිබුණි. ටින් මාළු සැකසීම සඳහා කර්මාන්ත ශාලාවක් හෝ ඉදි කර නොමැති විටක ටින් මාළු සැකසීමේ යන්ත්‍රාගාරය මිලදී ගෙන තිබූ අතර, අමාත්‍යාංශය විසින් | 2023 | ව්‍යාපෘති නියමිත පරිදි සැලසුම් කළ යුතු අතර අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. | චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර ආරම්භ කර තිබුණි. මේ වන විට ඇසුරුම්කරණ ගබඩාව භාවිතා වන බව හා Test Run කිහිපයක් සිදු කර තිබුණු නිසා යන්ත්‍රසූත්‍ර නිෂ්ක්‍රියව නොපැවතුණ අතර සමහර යන්ත්‍රසූත්‍ර සඳහා 2023 සැප්තැම්බර් දක්වා වගකීම් කාලයක් පැවතුණු බව. | ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 94 ක් වැය කර තිබුණි. ඉන්පසු වසර කිහිපයකට පසුව කර්මාන්ත ශාලාව ඉදි කිරීම සිදු කර 2023 වර්ෂයේදී නිෂ්පාදනය ආරම්භ කරන අවස්ථාව වන විට මිල දී ගත් යන්ත්‍රවල වගකීම් කාලය ද ඉක්මවා තිබුණි. තවදුරටත් නව කර්මාන්ත ශාලාවට සේවකයින් බඳවා ගැනීම් සහ යන්ත්‍රාගාරයේ ඇසුරුම් ගබඩාව හා අපවිත්‍ර ජලය බැහැර කිරීමේ පද්ධතිය සහ නව ඉදිකිරීම් කිරීම සඳහා රු. මිලියන 213 ක් ඇතුළු වැය වූ මුළු මුදල රු. මිලියන 307 කි. | | | | |
| (ට) | අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් මෝටර් රථයක් 2016 අප්‍රේල් 16 දින දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව පිවිසුමේදී හදිසි ගිනිගැනීමකට ලක් වී තිබූ අතර එහි සම්පූර්ණ අලාභය වන රු. මිලියන 2.7 න් මෝටර් රථය පදවාගෙන ගිය සහකාර ලේකම්ගෙන් අයවිය යුතු රු. මිලියන 2.6 ක මුදල අය කර ගෙන නොතිබුණි. | 2023 | අලාභය අදාළ පාර්ශවයන්ගෙන් කඩිනමින් අය කර ගත යුතුය. | මෙම වටිනාකම අයකර දෙන ලෙස ඉල්ලා විගණකාධිපති වෙතද පිටපත් සහිතව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපියක් යොමු කර ඇති බව. | 2024 සැප්තැම්බර් වන විටත් රු. මිලියන 2.6 ක මුදල අය කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඩ) | බස්නාහිර පළාත් සභාවේ කොළඹ, කළුතර හා ගම්පහ දිස්ත්‍රික්ක තුනෙහි පාසල්වල අඩුපාඩු හා පහසුකම් නැංවීමට ප්‍රමාණවත් අරමුදල් නොමැතිව තිබියදී අධ්‍යාපන අමාත්‍යාංශය හරහා 2023 වර්ෂයේ කඩවත, මහර වෙසක් කලාපය සඳහා ඉදි කළ තාවකාලික කුටි, ශබ්ද විකාශන යන්ත්‍ර හා සැරසිලි කටයුතු වෙනුවෙන් රු. මිලියන 10 ක මුදලක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය හරහා වැය කර තිබුණි. | 2023 | අත්‍යවශ්‍ය කටයුතු සඳහා රාජ්‍ය මුදල් භාවිතා කළ යුතුය. | බස්නාහිර පළාත් වෙසක් උත්සවය ලෙස සංවිධානය වූ අතර මහර ප්‍රාදේශීය ලේකම්, මහර ප්‍රාදේශීය සභාව මෙන්ම ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය ද සහයෝගය හා සම්බන්ධීකරණය ලබා දී ඇති බව හා ජනාධිපති ලේකම් විසින් වෙසක් කලාපය සඳහා සහාය ලබා දෙන ලෙස ආණ්ඩුකාරතුමා වෙත ලිපියක් ඉදිරිපත් කර ඇති බව. | 2024 වර්ෂයේද මහර පොසොන් කලාපය සඳහා අරමුදල් ලබා දී තිබුණි. |
| (ත) | 2022 මාර්තු 07 හා අංක NSCC/10/79/GE/AL දරන ජාතික වැටුප් කොමිෂන් සභාවේ ලිපිය, 2019 මාර්තු 29 දිනැති හා අංක PS/PCMD/SD/01/08 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය හා 2018 ජූලි 18 දිනැති අංක 03/2018 කළමනාකරණ සේවා චක්‍රලේඛ වලට පටහැනිව අයවැය අංශයේ නිලධාරීන්ගේ සාමාන්‍ය රාජකාරී වන අයවැය පිළියෙල කිරීම හා ඒ සම්බන්ධ කටයුතු කිරීම සඳහා ප්‍රධාන ලේකම්, නියෝජ්‍ය ප්‍රධාන | 2023 | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | සංකීර්ණ කාර්යයන් සමූහයක් මෙහෙයවන බව. | 2024 වර්ෂයේදීත් ගෙවමින් පැවතුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලේකම් (මුල්‍ය), අධ්‍යක්ෂ (අයවැය) ඇතුළු අයවැය අංශයේ නිලධාරීන් 06 දෙනෙකුට චක්‍රලේඛවලට පටහැනි ලෙස 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ඔවුන්ගේ වැටුපට අමතරව වැටුපෙන් 1/3 ක් ලෙස රු. මිලියන 3.6 ක දීමනාවක් වර්ෂයකට මාස 05 ක කාලයක් සඳහා ගෙවා තිබුණි. | | | | |
| (ද) | පළාත් මූල්‍ය රීති 416.1 හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහ ය ප්‍රකාර බස්නාහිර පළාත් සභාවේ හා අනුබද්ධ ආයතනවලට සනීපාරක්ෂක සේවාව හා ආරක්ෂක සේවාව අදාළ ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගවලින් තොරව ලබාගෙන 2023 වර්ෂය සඳහා රු. මිලියන 101 ක් ගෙවීම් කර තිබුණි. | 2023 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව කටයුතු කළ බව. | 2024 වර්ෂයේදීද සේවාවන් ලබා ගැනීම සඳහා ද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබුණි. |
| (න) | එකතුව රු. මිලියන 5 ක් වූ වත්කම් 17 ක ප්‍රමාණයක් අවුරුදු 03 ක සිට අවුරුදු 05 ක් දක්වා පරාසයක කාලයක් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවතුණි. | 2023 | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිගන්නා බව. | 2024 සැප්තැම්බර් වන විටත් ඌන උපයෝජිතව පැවතුණි. |
| (ප) | ප්‍රධාන ලේකම් නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ | 2023 | භෞතික පැවැත්ම තහවුරු කර ගත යුතු ය. | ඉදිරියේදී කටයුතු කරන බව. | 2024 සැප්තැම්බර් වන විටත් පැවැත්ම |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලියාපදිංචි වාහන 13 ක පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. | | | | තහවුරු කරගෙන නොතිබුණි. |
| (ඛ) | බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉඩම් හිමිකම් පැවරීම වෙනුවෙන් මුද්දර ගාස්තු අයකිරීමේදී ස්ථාපිත කර තිබෙන පාලන ක්‍රමවල දුර්වලතා හේතුවෙන් 2017 නොවැම්බර් 30 දින අංක 738 දරන ඔප්පුව පැවරීම වෙනුවෙන් ගෙවිය යුතු රු. මිලියන 4 ක මුද්දර ගාස්තුව අදාළ නොතාරිස්වරයා විසින් බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් නොකොට පෞද්ගලික පරිහරණයට ගෙන තිබුණි. මෙම මුදල හා ඒ සම්බන්ධයෙන් වූ දඩ මුදල සමඟ රු. මිලියන 8 ක් අයකර ගැනීම සඳහා කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 47142/5 දරන නඩුව ගොනුකර තිබුණි. මේ කාලවකවානුව අතරතුර අදාළ නොතාරිස්වරයා මිය යැම හේතුවෙන් බස්නාහිර පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු. මිලියන | 2023 | ආදායම් අය කර ගත යුතුය. | කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති බව. | 2024 සැප්තැම්බර් වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 4 ක මුද්දර ගාස්තු අය කර ගැනීමට නොහැකි වී තිබුණි. | | | | |
| (ම) | සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාහන සංචිතයේ 2017 – 2022 වර්ෂවල සිට භාවිතා නොකළ ඉන්ධන ලබා නොගත් වාහන 42 ක් පැවතුණි. එම වාහන අතුරින් වාහන 21 ක් 2019 වර්ෂයේ සිට දීර්ඝ කාලීනව ගරාජ්වල සහ කාර්යාල පරිශ්‍රයේ වැස්සට හා අව්වට නිරාවරණය වෙමින් දිරාපත් වෙමින් පැවතුණි. | 2023 | අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | අලුත්වැඩියා කටයුතු සඳහා යොමුකර ඇති බව හා අපහරණ කටයුතු සඳහා යොමු කර ඇති බව. | අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත හැකි වාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ය) | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වාහන හා යතුරු පැදි 87 ක පැවැත්ම තහවුරු කරගත නොහැකි විය. | 2023 | වාහනවල පැවැත්ම තහවුරු කරගත යුතුය. | පිළිතුර පසුව ඉදිරිපත් කරන බව. | 2024 සැප්තැම්බර් වන විටත් පැවැත්ම තහවුරු කර නොතිබුණි. |
| (ර) | කොටදෙනියාව සත්ත්ව පාලන මධ්‍යස්ථානය සහ තෘණ සම්පත් මධ්‍යස්ථානය සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් හෙක්ටයාර් 16 ක ඉඩමක් දෙපාර්තමේන්තුව 2003 ජනවාරි 28 දින පවරාගෙන තිබුණි. ඒ වෙනුවෙන් ගෙවිය යුතු | 2023 | රජයේ මුදල් අරපිරිමැස්මෙන් සහ කාර්යක්ෂමව වැය කළ යුතුය. | වන්දි මුදල් ගෙවීමට අදාළව ප්‍රමාදය කුමන නිලධාරියෙකුගේ අඩු පාඩුවක් නිසා සිදුවූවක්ද යන්න සොයා ගත නොහැකි බව | වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීමට හේතුව 2024 සැප්තැම්බර් වන විටත් සොයා ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වන්දි මුදල වූ රු. මිලියන 26 න් තවදුරටත් ගෙවිය යුතු රු. මිලියන 24 ක් ගෙවීම වර්ෂ 18 ක් ප්‍රමාද වීම නිසා රු. මිලියන 32 ක පොළී මුදලක් දෙපාර්තමේන්තුව විසින් නිශ්කාර්යව ගෙවා තිබුණි. | | | | |
| (ල) | ගම්පහ දිස්ත්‍රික්කය තුළ සණස සමිති 25 ක් සමූපකාර ප්‍රඥප්තියට හා රීති මාලාවට පටහැනිව සමූපකාර කොමසාරිස්වරයාගේ අනුමැතියකින් තොරව GDC සමාගමේ මුදල් ආයෝජනය කිරීම හා ණය ලබා දීම හා සමිතිවල තිබූ මූල්‍ය අක්‍රමිකතා, මූල්‍ය වංචා, දූෂණ හේතුවෙන් මූල්‍ය අර්බුදයන්ට ලක්වීම නිසා සාමාජික හා සාමාජික නොවන තැන්පත්කරුවන් 61,393 ක ගෙන් බාරගත් රු. මිලියන 6,761 ක තැන්පතු මුදල් ආපසු ගෙවීමට නොහැකියාව මත ගම්පහ දිස්ත්‍රික් සණස සමිති ව්‍යාපාරය කඩා වැටී තිබුණි. මෙම අයෝජිත මුදල් හා ලැබිය යුතු පොළී ආදායම් ලබාදීම GDC ආයතනය විසින් පැහැර හැර තිබුණ ද ඒ සම්බන්ධයෙන් | 2023 | සමූපකාර ප්‍රඥප්තියට හා රීති මාලාවට අනුව කටයුතු කළ යුතුය. | සිදු වී ඇති මූල්‍ය හානි සම්බන්ධයෙන් වගකිවයුතු අයගෙන් අයකර ගැනීම සඳහා සමිති වෙත දැනුම් දීමට කටයුතු කරමින් පවතින බව හා ආයෝජනය කළ මුදල් වහාම ලබා ගැනීමට ද අදාල සමාගමේ දේපළ තහනම් කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ද අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබා දී ඇති බව. | සිදු වී ඇති අලාභය 2024 සැප්තැම්බර් වන විටත් වගකිවයුතු අයගෙන් අය කර ගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | | | |
| (ච) | කොළඹ, ගම්පහ දිස්ත්‍රික්කයන්හි සමුපකාර සමිති 5 ක සමිතිවල නිලධාරීන් විසින් සිදුකරන ලද මුදල් වංචා හා මුදල් ඌණතා වටිනාකම රු. මිලියන 338 ක් වුවද එම දිස්ත්‍රික්කයන්හි සහකාර සමුපකාර කොමසාරිස්වරු විසින් ඒ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන මූල්‍ය අලාභ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි | 2023 | මූල්‍ය අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කිරීමට, පරීක්ෂණය සිදු කර නෛතික ක්‍රියාමාර්ග ගැනීමට හා පාර්ලිමේන්තුව විසින් ලබා දෙන උපදෙස් ක්‍රියා කරවීමට කටයුතු කරනු ලබන බව. | 2024 සැප්තැම්බර් වන විටත් මූල්‍ය අලාභය අය කර නොතිබුණි. |
| (ඡ) | කොළඹ දිස්ත්‍රික්කයේ මූල්‍ය අර්බුදයන්ට ලක් වි ඇති සමිති 18 ක් හා ගම්පහ දිස්ත්‍රික්කයේ මූල්‍ය අර්බුදයට ලක් වි ඇති සමිති 24 ක් නිකුත් කර ඇති ණය වටිනාකම පිළිවෙලින් රු. මිලියන 3,586 ක් හා රු. මිලියන 3,545 ක් වශයෙන් එකතුව රු. මිලියන 7,131 ක් වූ අතර සමාලෝචිත වර්ෂය වන විට මුළු ණය ප්‍රමාණයම අයනොවී පවතින කල්පසු ණය වීමෙන් එම සමිති උග්‍ර මූල්‍ය අර්බුදයකට ලක් වී තිබුණි. | 2023 | ප්‍රඥප්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පිළිතුර පසුව ඉදිරිපත් කරන බව. | අය නොවී පවතින ණය ශේෂය 2024 සැප්තැම්බර් වන විටත් අය කරගෙන නොතිබුණි. |

## 3.9 උතුරු පළාත් සභාව

| | මුළු වත්කම් | මුළු වගකීම් | ස්කන්ධය | අතිරික්තය (ඌණතාවය) | මතය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | |
| **2021** | 24,930,395,055 | 2,295,244,982 | 22,635,150,073 | 1,962,945,042 | තත්ත්වාගණනය කළ |
| **2022** | 25,762,571,206 | 2,605,405,884 | 23,157,165,322 | 2,179,700,169 | තත්ත්වාගණනය කළ |
| **2023** | 57,686,289,955 | 3,179,292,062 | 54,506,997,893 | 2,640,356,377 | තත්ත්වාගණනය කළ |

| | විගණන නිරීක්ෂණය | වාර්තාවේ වර්ෂය | විගණකාධිපති නිර්දේශය | විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග | වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය |
|---|---|---|---|---|---|
| (අ) | වෛද්‍ය නිලධාරී සේවයේ පළමු ශ්‍රේණියට අයත් නියෝජ්‍ය වෛද්‍ය පරිපාලන පන්තිය යටතට ගැනෙන වෛද්‍ය අධිකාරි තනතුර දරන වෛද්‍ය නිලධාරියෙකුට අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව වෙන්කරන ලද වාහනය සඳහා ලබා දෙන මාසික ගමන් වියදම් දීමනාව වෙනුවෙන් 2015 නොවැම්බර් මාසයේ සිට 2020 ජූලි මාසය දක්වා රු.3,599,640ක් ගෙවීම් කර තිබුණි. | 2021 | අවිධිමත් ගෙවීම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | මාසිකව ගෙවන ලද රු.3,599,640ක් වූ අවිධිමත් ගමන් වියදම් දීමනාව අදාළ නිලධාරියාගෙන් අයකර ගන්නා ලෙස අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා වෙත ලිපියක් යවා ඇත. එය ආපසු අය කර ගැනීමෙන් පසුව, ඒ පිළිබඳව දැනුම් දෙනු ලැබේ. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | පේදුරුතුඩුව රෝහලේ 2016 ඔක්තෝබර් මාසයේදී ස්ථාපිත කළ රු. මිලියන 8ක් වූ දාහක යන්ත්‍රය | 2021 | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම විධිමත්ව ශක්‍යතා අධ්‍යයනයන් සිදුකළ යුතුය. | මෙම දාහක යන්ත්‍රය (Incinerator) වෙනත් ස්ථානයකට ගෙන යාමට උත්සාහ කළ නමුත්, මහජන | එය භාවිතයට ගැනීමෙන් තොරවම අක්‍රිය තත්ත්වයට පත් වී තිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (Incinerator) ප්‍රමාණවත් ආරක්ෂාවක් නොතිබීම, වගකීම් කාලයෙන් පසු නිසි ලෙස නඩත්තු නොකිරීම සහ නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව ස්ථාපිත කිරීම හේතුවෙන් අක්‍රීය තත්ත්වයට පත් වී තිබුණි. | | | විරෝධතා හේතුවෙන් මෙතෙක් වෙනත් ස්ථානයක් සොයා ගැනීමට නොහැකි විය. කෙසේ වුවද, යන්ත්‍රය ආරක්ෂා කිරීමට පියවර ගෙන ඇත. | |
| (ඇ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශයට පටහැනිව ගිවිසුම් අත්සන් නොකර එකතුව රු. 43,436,553ක් වූ ප්‍රසම්පාදනයන් 08ක් ක්‍රියාත්මක කර තිබුණි. | 2021 | නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුගමනය කිරීම තහවුරු කළ යුතුය. | ප්‍රසම්පාදන අත්පොතේ සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශය අනුව, භාණ්ඩ මිලදී ගැනීම සඳහා අනාගතයේදී ගිවිසුම් අත්සන් කිරීමට උපදෙස් ලබා දී ඇත. | ගිවිසුම්ගත වීමෙන් තොරව ප්‍රසම්පාදනය සිදු කර තිබුණි. |
| (ඈ) | එකතුව රු. 80,855,814ක් වූ පළාත් පාලන ආයතනවලට අයත් මුද්දර ගාස්තු වර්ෂ 02කට අධික කාලයක සිට අදාල පළාත් පාලන ආයතන විසින් ඉල්ලීම් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී පළාත් භාණ්ඩාගාරය විසින් පළාත් සභාවේ ආදායමට මාරු කර තිබුණි. | 2021 | පළාත් පාලන ආයතනවලට හිමි මුදල හඳුනාගත හැකි අයුරින් වන ක්‍රමවේදයක් සකස් කර අදාල ආයතනවලට නිකුත් කිරිමට ක්‍රියාමාර්ග ගත යුතුය. | උතුරු පළාත හැර අනෙකුත් පළාත්වලින් ඉඩම් ලියාපදිංචි කිරීමේ විස්තර ලබාගැනීමේ දී ප්‍රමාදයන් සිදුවී තිබුණි. ප්‍රතිපූරණ ඉල්ලීම් ඉදිරිපත් කිරීමට සහ මෙම මුද්දර ගාස්තු අයකර ගැනීමට පළාත් පාලන ආයතන මගින් කටයුතු කරමින් පවතී. | ප්‍රාදේශීය බලධාරීන් විසින් ඒ සම්බන්ධයෙන් පූර්ණ වශයෙන් හිමිකම් ඉල්ලා නොතිබුණි. |
| (ඉ) | උතුරු පළාත් සභා මුල්‍යා ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් යටතේ හෙළිදරව් කර තිබුණු | 2022 | එම පාඩුව නොපමාව අයකර ගත යුතුවේ. | පළාත් සභා අරමුදලට අයකර ගැනීමට කටයුතු කර තිබේ. | එය ආපසු අයකරගෙන නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු. මිලියන 20.44ක මූල්‍ය වංචාවලට අදාළ විමර්ශන අවසන් කර එම මුදල් අයකිරීමට පියවර ගෙන නොතිබුණි. | | | | |
| (ඊ) | 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලයට අදාළව උතුරු පළාත් භාණ්ඩාගාරයට ලද මුද්දර ගාස්තු රු.මිලියන 266ක් අදාළ පළාත් පාලන ආයතන විසින් ඉල්ලුම් නොකිරීම නිසා පළාත් ආදායමට බැරකර තිබුණි. | 2022 | අදාළ වන සියලු නීතිරීතිවලට අනුකූලව කටයුතු කළ යුතු වීම. | 2014 අංක 02 දරන උතුරු පළාත් මුද්දර ගාස්තු පනතේ 02 වගන්තියේ 02 උප වගන්තියට අනුව, වසර 02කට වැඩි කාලයක් සඳහා හිමිකම් නොපෑ මුද්දර ගාස්තුව විවිධ ආදායම්වලට මාරු කරන ලදී. | එය සම්පූර්ණයෙන්ම නිදහස් කර නොමැත. |
| (උ) | 2000 වර්ෂයේ සිට මේ දක්වාම අධ්‍යාපන කලාප 06ක වූ පාසැල් 69ක යුද්ධය හා සොරකම් කිරීම හේතුවෙන් නැති වූ එකතුව රු.මිලියන 55ක පාඩු පිළිබඳව පසුගිය වර්ෂ 22ක සිට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2022 | සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වේ. | මේ සම්බන්ධයෙන් අදාළ කලාපවලට උපදෙස් ලබාදී පසු විපරම් කටයුතු ආරම්භ කර ඇත. ඉහත අලාභය හැකි ඉක්මනින් ලියා හැරීමට කටයුතු කරනු ලැබේ. | පසු විපරම් කටයුතු අවසන් කර නොතිබුණි. |
| (ඌ) | වර්ෂ 01ත් වර්ෂ 07ත් අතර කාලයක් ගත වී තිබුණ ද, විදුහල්පතිවරුන් 639 දෙනෙකුගේ පත්වීම් ස්ථිර කර නොතිබුණි. | 2022 | පරිපාලන කටයුතු කාර්යක්ෂමව ඉටු කළ යුතු වේ. | ඉදිරියේදී සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | එය සම්පූර්ණයෙන් නිරවුල් කර නොතිබුණි. |
| (එ) | කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ සමූපකාර සමිති 04ක මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා 2019 වර්ෂයේදී | 2022 | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. | සුදුසු ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | මේ වන විට ද එම යන්ත්‍රෝපකරණ උපයෝජනය කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලබාදුන් එකතුව රු.මිලියන 43.84ක් වූ යන්ත්‍රෝපකරණ අදාළ අරමුණු සඳහා භාවිතා නොකර වර්ෂ 03ක කාලයක සිට අභාවිතව පැවැතුණි. | | | | |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ පළාත් අමාත්‍යාංශ 03ක් සහ දෙපර්තමේන්තු 05 ක් විසින් වෙන්දේසියේ විකිණීම සඳහා එකතුව රු. 16,970,739 ක් වූ මෝටර් රථ 56 ක් අදාල ආයතනවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවලින් ඉවත් කර පළාත් භාණ්ඩාගාරයට මාරුකර තිබුණි. මෙම මෝටර් රථ වාර්තා කරන දිනටත් වෙන්දේසි කර නොතිබූ අතර භෞතිකව පවතින එම වත්කම්වල පිරිවැය පළාත් සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය නොවන වත්කම්වල දක්වා නොතිබුණි. | 2023 | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හෙළිදරව් කිරිමට පියවර ගත යුතුය. | වෙන්දේසියේ වත්කම් විකිණීමට අදාළ ක්‍රියාකාරකම් සිදු කරමින් පවතින බැවින්, මෙම භාවිතයට නොගත් මෝටර් රථවල වටිනාකම 2023 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කමක් ලෙස ඇතුළත් කර නොතිබුණි. | එයට විසඳුමක් ලබා දී නොමැත. |
| (ඔ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 8.9.1 (ආ) රු. 33,026,498 මුලතීව් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සහ දේශීය | 2023 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල ට අනුකූලව කටයුතු කළයුතුය. | ඉදිරියේ දී මෙවැනි ප්‍රමාද දෝෂ සිදු නොකිරීමට උපදෙස් ලබා දී තිබුණි. | එයට විසඳුමක් ලබා දී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | වෛද්‍ය දෙපාර්තමේන්තුව මගින් පිසූ ආහාර හා වියලි ආහාර සැපයීම් 18ක ගිවිසුම් අත්සන් නොකර සේවාවන් ලබාගෙන තිබුණි. | | | | |
| (ඕ) | උතුරු පළාත් සභාවේ මුල්‍ය රීති 131.3 රීතිය රු.20,168,905<br><br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතුහි ගොවිපල කළමනාකරු විසින් 2022 සහ 2023 වර්ෂවල මුදල් එක්රැස් කිරිමේදී අත්සන් නොකර සහ නිල මුද්‍රා නොතබා ලදුපත් ලබාදී තිබුණි. | 2023 | පළාත් මුල්‍ය රීතිවලට අනුකූලව කටයුතු කළයුතුය. | වර්තමානයේ, සියලුම ලදුපත් අත්සන් කර, නිල මුද්‍රාව තබා ගොනු කර ඇත. | ඒ වන විට ද, එයට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ක) | 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛයේ 2.4 ඡේදය රු. 6,725,000<br><br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රජා පාදක සංවිධාන සඳහා සෘජු කොන්ත්‍රාත් 06 ක් මාන්තායි දකුණ විවිධ සේවා සමූපකාර සංගමයට ලබාදීමේදී ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | 2023 | රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. | නියමිත කාලය තුළ, එක් සමිතියකට කොන්ත්‍රාත් ක්‍රියාකාරකම් 03 කට වඩා වැඩි ප්‍රමාණයක් ලබා දීම වැළැක්වීමට කටයුතු කරනු ඇත. | එයට විසඳුමක් ලබා දී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ග) | 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 2.4 සහ 2.5 වගන්ති රු. 2,588,463 අදාළ විධිවිධානවලට පටහැනි අයුරින් නියමිත අධිකාරි බලය නොවූ ගිවිසුම් 06 ක් යටතේ එකම කාලවකවානුවක් තුළ වවුනියා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් එකම ප්‍රජා පාදක මට්ටමේ සංවිධානයකට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි | 2023 | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී එම චක්‍රලේඛයට අනුකූලව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට උපදෙස් ලබාදී තිබුණි. | එයට විසඳුමක් ලබා දී නොමැත. |
| (ච) | 2015 ජූලි 14 දිනැති අංක PF/06/2015 දරන උතුරු පළාත් මූල්‍ය චක්‍රලේඛය රු.35,955,165<br><br>රුපියල් මිලියන 0.5කට අධික ප්‍රසම්පාදනයන් 15 ක් සඳහා තාක්ෂණික ඇගැයීම් කමිටු ස්ථාපනය නොකර කිලිනොච්චි දිස්ත්‍රික් රෝහල මගින් පර්යේෂණාගාරයට අවශ්‍ය භාණ්ඩ ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කර තිබුණි. | 2023 | පළාත් මූල්‍ය චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. | 2024 වර්ෂයේ සිට, මෙම ප්‍රසම්පාදන තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා සහ ප්‍රසම්පාදන කමිටු තීරණ අනුව සිදු කෙරේ. | එයට විසඳුමක් ලබා දී නොමැත. |
| (ජ) | අනින්ජයන්කුලම අභිජනන ගොවිපලෙහි කිරි ආශ්‍රිත නිෂ්පාදන සකස්කිරිමට 2013 වර්ෂයේ මිලදීගත් යන්ත්‍රෝපකරණ 16ක් නැවත 2018 වර්ෂයේදී | 2023 | ගොවිපල සතු සම්පත්, ප්‍රශස්ථ මට්ටමින් භාවිතා කිරීමට පියවර ගතයුතු ය. | අනින්ජයන්කුලම අභිජනන ගොවිපළේ කිරි නිෂ්පාදන සහ අනෙකුත් සම්පත් නොමැතිකම හේතුවෙන් මෙම යන්ත්‍ර නියමිත | වර්තමානයේ එය නිෂ්කාර්යව පවතී. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | රු.2,550,504කට ප්‍රත්‍යාගණනය කර ඇතත් මේ වන විට වර්ෂ 10 ක් කල් ඉකුත් වී තිබූ මෙම යන්ත්‍ර භාවිතයට ගත නොහැකි තත්ත්වයෙන් මලබැදී තිබුණි. එසේම, රු.3,000,000ක් වූ ගොඩනැගිල්ලද වර්ෂ 10ක කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවැතුණි. | | | කාලයකට සත්ත්ව අභිජනන සමුපකාර වෙත බදු දීමට කටයුතු කෙරේ. | |
| (ට) | සමාලෝචිත වර්ෂයේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් වසර 06 සිට 11 දක්වා වූ සිසුන්ට 2023 වර්ෂයේදී 2022 වර්ෂය සඳහා පවත්වනු ලැබූ අවසාන වාර විභාගය වෙනුවෙන් රු.18,950,100 ක් අයකර තිබුණි. ඉන් රු.13,926,892 ක මුදල් ඒ සඳහා වැයකර තිබූ අතර එමගින් වැඩියෙන් අයකළ රු.5,023,208ක් සිසුන් මත අනවශ්‍ය වැය බරක් පටවා තිබුණි. තවද එය පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2023 | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු ය. | ඊළඟ විභාගය සඳහා සිසුන්ගෙන් අඩු ගාස්තුවක් අය කෙරේ. | කඩිනම් පියවර ගෙන නොමැත. |
| (ඩ) | වැඩ සුපරීක්ෂක ලෙස 2014 ඔක්තෝබර් 24 දින පත්වීම් ලැබූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 39කගේ හා මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින් 04කගෙන් 2015 අප්‍රේල් මාසයේ | 2023 | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | අදාළ නිලධාරීන්ට විධිමත් ලෙස පත්වීම් ලබා දීමෙන් පසුව, ඔබ සඳහන් කරන නිලධාරීන් යටතේ W&OP අංක ලියාපදිංචි කෙරෙනු ඇත. | එයට විසඳුමක් ලබා දී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සිට 2024 පෙබරවාරි මාසය දක්වා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා රු.5,520,153ක් ඔවුන්ගේ වැටුපෙන් අයකර තිබූ නමුත්, එම නිලධාරීන්ගේ නමට විශ්‍රාම වැටුප් දායක මුදල් හඳුනාගත හැකි පරිදි විශ්‍රාම වැටුප් අංක සඳහන් කර ගෙවීම් කර නොතිබුණි. | | | | |
| (ත) | උතුරු පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අනතුරට ලක්වූ වාහන 06 ක් සඳහා රක්ෂණ ආයතනයෙන් වන්දි ගෙවිය නොහැකි බව සඳහන් කර තිබූ නමුත් ඒවා යථා තත්ත්වයට පත්කිරීමට හෝ අයකර ගැනීමට වර්ෂ 01 සිට 13ක් දක්වා කාලයක් තුළ ක්‍රියාමාර්ග නොගැනීම නිසා රු.22,573,727ක අලාභ සිදුවී තිබුණි. | 2023 | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | අනතුරුවලට ලක්වූ වාහන 06ක් සම්බන්ධයෙන් මෙම පියවර ගෙන තිබේ. | අලාභය අයකරගෙන නොමැත. |
| (ද) | වවුනියා රජයේ රෝහලේ දුරකථන සන්නිවේදන කුළුණු දෙකක් සඳහා වෙනමම උපමනු සවිකර තිබුණි. සන්නිවේදන ආයතන දෙකෙන්ම විදුලි ගාස්තු නියමිත කාලපරිච්ඡේදයේ අයකර නොතිබූ අතර වවුනියා දිස්ත්‍රික් රෝහල විසින්ම විදුලි ගාස්තු ගෙවීම සිදුකර තිබුණි. එසේම, | 2023 | ආදායම් අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉදිරියේදී ගිවිසුම් අලුත් කර ආදායම් අයකර ගැනීමට රෝහල් පරිපාලනය මගින් උපදෙස් ලබා දී ඇත. | එය රජයේ ආදායමට මාරු කර නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | දුරකථන සන්නිවේදන කුළුණු ආදායම 2016 පෙබරවාරි 01 සිට 2022 ජනවාරි 31 දක්වා කාලපරිච්ඡේදයේ වවුනියා දිස්ත්‍රික් රෝගීන්ගේ සුභසාධක සංගමයට මාරුකිරිම නිසා කුළුණු කුලී ආදායම් රු.4,538,106ක්ද අහිමි වී තිබුණි. | | | | |
| (න) | පාසැල් වර්ගීකරණ චක්‍රලේඛ අනුව දීමනා සංශෝධනය නොකර 2019 වර්ෂයේ සිට සමාලොචිත වර්ෂය දක්වා දූපත් අධ්‍යාපන කලාපයේ ගුරුවරුන්ට ගෙවනු ලැබූ රු.10,230,397ක වැඩිපුර ලබාදුන් දීමනා මේ දක්වා ආපසු අයකර නොතිබුණි. | 2023 | වැඩිපුර ගෙවනු ලැබූ දීමනා නැවත අයකර ගැනීමට පියවර ගත යුතුය. | ගුරුවරුන් සඳහා වැඩිපුර ගෙවූ දීමනා නැවත අයකර ගැනීමට පියවර ගනිමින් පවතී. | දීමනා අයකරගෙන නොතිබුණි. |
| (ප) | ආණ්ඩුකාර කාර්යාලය විසින් 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ වාහන ධාවන සටහන්, ඇමුණුම 01 ආදිය කිසිවක් නොමැතිව රියැදුරන්ගේ අතිකාල දීමනා සහ සංයුක්ත දීමනා ලෙස එකතුව රු.1,384,407ක් ලබාදී තිබුණි. | 2023 | චක්‍රලේඛය ප්‍රකාරව, සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | ගරු ආණ්ඩුකාරවරයාගේ සහ ඔහුගේ පෞද්ගලික ලේකම්වරයාගේ ආරක්ෂාව පිළිබඳව සලකා බලා, කිසිදු අවස්ථාවක වාහනවල ධාවන සටහන් ඉදිරිපත් නොකෙරේ. | එයට විසඳුමක් ලබා දී නොමැත. |
| (බ) | 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන | 2023 | -එම- | ආණ්ඩුකාරවරයාගේ නියෝගවලට අනුව, ගරු අමාත්‍යතුමා විසින් | එයට විසඳුමක් ලබා දී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ජනාධිපති ලේකම් කාර්යාල චක්‍රලේඛය ප්‍රකාරව ආණ්ඩුකාරවරයාට ආහාර සම්බන්ධ දීමනා පිළිබඳ කිසිවක් සඳහන් කර නොතිබූ නමුත් 2021 දෙසැම්බර් සිට 2023 මැයි දක්වා කාලපරිච්ඡේදයට ආහාර සඳහා එකතුව රු.4,037,299ක් ගෙවා තිබුණි. | | | අනුමත කරන ලද වැය ශීර්ෂය හරහා ඔහු සඳහන් කළ පුද්ගලයාට ආහාර සඳහා ගෙවීම සිදු කර තිබුණි. | |
| (ම) | 2021 දෙසැම්බර් සිට 2023 මැයි දක්වා කාල පරිච්ඡේදය තුළ ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ සම්බන්ධීකරණ ලේකම්, අතිරේක ලේකම්, මහජන සම්බන්ධතා නිලධාරී ආදි නිලධාරීන් විසින් ස්වකීය වාහන භාවිතා කරන බව සඳහන් කරමින් ප්‍රවාහන දීමනා ලබාගෙන තිබුණු නමුත්, මාස 33කට අධික කාලපරිච්ඡේදයක් වෙනුවෙන් රියැදුරන්ට වැටුප් වශයෙන් රු.1,344,644ක් ගෙවා තිබුණු අතර මීට අමතරව රියදුරන් සඳහා අතිකාල දීමනා හා සංයුක්ත දීමනා ආදියත් ලබා දී තිබුණි. | 2023 | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | 2021 දෙසැම්බර් සිට 2023 මැයි දක්වා කාලය තුළ සේවය කළ ආණ්ඩුකාරවරයාගේ පරිහරණය සඳහා පවතින වාහන සංඛ්‍යාව අනුව රියදුරන් පත් කර තිබුණි. රියදුරන් පත්කිරීමට අදාළ අයදුම්පත් ගරු ආණ්ඩුකාරතුමා විසින් පරීක්ෂා කරන ලද අතර ආණ්ඩුකාරවරයාගේ ආරක්ෂාව පිළිබඳව සලකා බලා, ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස්වලට අනුව, පත්වීම් ලබා දී ඇත. | එයට විසඳුමක් ලබා දී නොමැත. |
| (ය) | ආණ්ඩුකාරවරයා වෙනුවෙන් කොළඹ උපකාර්යාල ගොඩනැගිලි මාසික කුලිය ප්‍රධාන තක්සේරුකරු විසින් රු.100,000ක් බව | 2023 | -එම- | ප්‍රධාන තක්සේරුකරු විසින් රු. 100,000 ක් සඳහන් කර තිබුණද, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ඇතිව ගෙවීම සිදු කර ඇත. | එයට විසඳුමක් ලබා දී නොමැත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | සඳහන් කර තිබූ නමුත් මෙම තක්සේරුවට පටහැනිව මාසිකව වැඩිපුර රු.80,000ක් බැගින් ගෙවීම් කිරීම හේතුවෙන් පළාත් අරමුදලට රු.1,240,000ක මූල්‍ය පාඩුවක් සිදුවී තිබුණි. | | | | |
| (ර) | ජාත්‍යන්තර කම්කරු සම්මේලන වැඩසටහන යටතේ ජාතික වෘත්තීය සහතික ලබාදීමේ පුහුණු පාඨමාලාව සඳහා පළාත් භාණ්ඩාගාරයෙන් 2023 අප්‍රේල් 10 දින රු.3,299,000ක අක්මුදල් ලබාදී තිබුණි. එම අරමුදල්වලින් සියයට 59ක් හෙවත් රු.1,950,000ක් මාස 11ක් ඉකුත් වූ පසුත් උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | 2023 | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | පිළිතුරු සපයා නොමැත. | එය සම්පූර්ණයෙන් උපයෝජනය කර නොතිබුණි |